# චිත්තා මාණික්‍ය රත්නය

සුගතයන් වහන්සේලා සත්නම වන්දනා කිරීමේ

පූජා උත්සවයක්



පස්වැනි මහා දලයි ලාමා උත්තමයා වූ

න්ගවං ලොසං ග්‍යට්සෝ විසිනි

ඉංග්‍රීසි අනුවාදය ඃ

ජෝන් නිව්මන්

**සරණ සභාව සත්‍යයේ බලයෙන් එන බව සිතා ගන්න**

ත්‍රිවිධ රත්නයන්ගේ සත්‍යයෙන්, බුදුවරුන්ගේ හා බෝසත්වරුන්ගේ ආශිර්වාදයෙන්, දෙයාකාර සංචිතයන් පරිපූර්ණ කිරීමේ මහා බලයෙන් හා සම්පූර්ණයෙන් පවිත්‍ර වූ ද අචින්ත්‍ය වූ ද ද්‍රව්‍ය ලෝකයේ බලයෙන්, පවිත්‍ර කිරීමේ ශික්ෂා පද සමාදන් වීම සඳහා, ගුරුවරුන් වහන්සේලා හා ජිනවරයන්වහන්සේලා ද, දූ පුතුන් වූ බෝසතුන්වහන්සේලා ද, කැටුව අප කෙරේ කරුණාවෙන් වහා මෙහි වැඩම කරන සේක්වා! අත්‍යන්තයෙන් පිරිහුණු මෙම යුගයේ සසර සැරිසරන ජීවී සත්වයන් කෙරේ මහා කරුණාවෙන් යුතුව අතිශයින් විශාල වූ දේශනයන්ගේ අත්‍යවශ්‍ය අර්ථය ප්‍රදානය කරන්නා වූ සමස්ත ඉගැන්වීම පිළිබඳ ඍජු හා පරම්පරා ගුරුවරුන් ඇතුළු කීර්තිමත් ගුරුවරුන් වහන්සේලාට නමස්කාර වේ වා!

➢

මහා කරුණාවෙන් යුතු ආරක්ෂකයාණන් වූ ද, සර්වඥ වූ ද, සද්ගුණයන්ගේ හා කුශල ක්ෂේත්‍රයන්ගේ සාගරයක් වූ ද තථාගතයන් වහන්සේට නමස්කාර වේ වා!

➢

රාගයෙන් නිදහස් වීමට හේතුවන පවිත්‍රතාව වූ ද, පරමෝත්කෘෂ්ට සද්ගුණයන් හරහා පාපී දෛවයන්ගෙන් නිදහස ලබා දෙන්නාවූ ද, ශාන්තිය ලබා දෙන්නා වූ ද ධර්ම රත්නයට නමස්කාර වේවා!

➢

විමුක්තිය ලබා විමුක්තියට යන මාර්ගය අන්‍යයන්ට කියා දෙන්නා වූ ද, පුහුණු වීමට අත්‍යන්තයෙන් කැප වූ ද, සද්ගුණයන්ගෙන් යුතු අනුත්තර පූණ්‍ය ක්ෂේත්‍රය වූ ද මහා සංඝ රත්නයට ද නමස්කාර වේ වා!

➢

දස දිසාවන්හිම සසර සැරිසරන ජීවී සත්වයන් කෙරේ ඇති ප්‍රඥාවන්ත හා කාරුණික චේතනාව නිසාම දස දිසාවන්හි ම වෙසෙන සාංසාරික ජීවී සත්වයන් අරබයා ධර්ම චක්‍රය දස දිසාවන්හි ප්‍රවර්තනය කරමින් ඔවුන් සම්පූර්ණයෙන් ම ආරක්ෂා කරන්නා වූ දස දිසාවන්හිම වැඩ වෙසෙන බුදුන්වහන්සේලා ට නමස්කාර වේ වා!

➢

උන්වහන්සේලාගේ ප්‍රාර්ථනාමය ආයාචනයන් සම්පූර්ණයෙන්ම විස්මයාවහ වූ අතර, මෙම මහා භද්‍ර කල්පය තුළ තම කාර්යයන් සම්පූර්ණ කළ ඒ දහසක් සම්බුදුන් වහන්සේලා ට නමස්කාර වේවා!

➢

දුකට පත් සාංසාරික ජීවී සත්වයන්ගේ ආරක්ෂාව වෙනුවෙන් අසීමිත අතීත කල්ප ගණනක් තිස්සේ විශේෂ ප්‍රාර්ථනාමය ආයාචනයන් කළ ඒ සුගතයන් වහන්සේලා අට නම ට නමස්කාර වේ වා!

විපස්සී, සිඛී, වෙස්සභූ, කකුසඳ, කෝණාගම, කස්සප හා දේවාතිදේව වූ ගෞතම ශාක්‍යමුනි යන වීර සත් බුදුන්වහන්සේලාට නමස්කාර වේ වා!

නිකැලැල් සඳ මඩලක් වන් මුව කමලක් සහිත, ස්වර්ණමය ඡවි වර්ණයෙන් යුතු උත්තම නාමයක් දරන්නා වූ ඔබ වහන්සේ ට නමස්කාර වේවා! අද්විතීය ඥානයෙන් යුතු වූද, රාගයෙන් නිදහස් වූ ද ඔබ වැනි කෙනෙකු මෙම තුන් ලොවෙහිම නැත්තේ ය. ඔබ වහන්සේට නමස්කාර වේවා!

➢

භාග්‍යවතුන් වහන්ස! ඔබගේ කරුණාව සැම දෙනාටම සමාන වූවක් වන්නේ ය. ඔබවහන්සේගේ නම ඇස්වීමෙන් අපාය ලෝකවල දුක පවා සංසිඳී යන්නේ ය. රාග, ද්වේශ, මෝහ යන තුන් වසයන්ගේ රෝගය දූරීභූත කරන්නා වූ භෛෂජ්‍ය ගුරු වෛඩූර්යප්‍රභ තථාගතයන් වහන්සේට නමස්කාර වේවා!

සම්බුදුවරයන් උපත ලද්දා වූ ද, බුදු බව ලැබුවා වූ ද, ධර්ම චක්‍රය ප්‍රවර්තනය කළා වූ ද, අමා මහ නිවනට පත් වූ ද සියලු ස්ථානවලට නමස්කාර වේ වා!

➢

තථාගතයන් වහන්සේලා ඇවිද ගියා වූ ද, වැඩ සිටියා වූ ද, නැඟී සිටියා වූ ද, සිංහ සෙය්‍යාවෙන් සැතපුණා වූ ද ස්ථානවලට නමස්කාර වේ වා! ශුද්ධ වූ ධාතූන් වහන්සේලා සහිත ස්තූපයන් ට ද, පෘථිවියට ඉහලින් ද, පෘථිවියට යටින් ද, ඒ අතර ප්‍රදේශයේ ද, සතර දිසාවන්හි හා සතර අනු දිසාවන්හි ඇත්තා වූ ධාතූන් වහන්සේලා සහිත ස්තූපයන්ට ද නමස්කාර වේවා!

➢

අවාච්‍ය, අචින්ත්‍ය, අප්‍රකාශනීය වූ ප්‍රඥා පාරමිතාව වූ, අවකාශයේ නූපන්, නිරන්තර සාරය වූ, ස්වයං - ප්‍රත්‍යක්ෂ ඥානයේ ක්ෂේත්‍රය වූ තුන් කාලයේ ම ජිනවරයන්ගේ මාතාවන්ට නමස්කාර වේවා!

➢

සංසාරික ජීවී සත්වයන් සසර පැවැත්මෙන්, හා ආත්මාර්ථකාමී නිර්වාණයේ ශාන්තියෙන් නිදහස් කිරීම සඳහා මහා ක්‍රියාකාරිත්ව ධාරාවන් නිර්මාණය කරන මංජුඝෝෂ, රහස්‍යයන්ගේ ස්වාමි වූ වජ්‍රපානි, ඥාණමුක්ත, අවලෝකිතේශ්වර ආදී කොට ඇති මහායාන සංඝයාට නමස්කාර වේ වා!

➢

එම අමිල මනස නිපද වූ පූජනීයයන්ට ද, හානියක් වූ විට ද රඳා පවත්වා ගන්නා වූ සතුටේ මූලාශ්‍රයන්ට ද නමස්කාර වේවා!

➢

තම (කෙලෙස්) සතුරන් විනාශ කොට, පරම ඥානයට පත් වූ ද, පසිඳුරන් මුළුමනින්ම දමනය කළා වූ ද, ධර්මයේ පැවැත්ම සඳහා බොහෝ වෙහෙස දැරුවා වූද, ධර්මය නිසි ලෙස පවත්වා ගනිමින් වර්ධනය කොට ආරක්ෂා කළා වූ ද සොළොස් ජ්‍යෙෂ්ඨ අරහතුන්වහන්සේලාට ද නමස්කාර වේවා!

➢

මහා මුනි උතුමන්ගේ අණට ගැළපෙන පරිදි ධර්ම රත්නය නැමති භාණ්ඩාගාරය ආරක්ෂා කරන්නා වූ, අභිඥා බල ලාභී වජ්‍ර ධර්මාරක්ෂකයන්ට නමස්කාර වේවා!

පූර්වයෙහි පරාර්ථ පුණ්‍ය සාගරයන් එක්රැස් කිරීමේ පල ලෙස දීර්ඝායුෂ ද, ධන ධාන්‍ය ද ලබා, යෝගාවචරයන් මත වසන්ත ධන වර්ෂාවක් පිරිනමන්නා වූ ධන දේවතාවුන් වහන්සේලාට මාගේ නමස්කාරය වේවා!

අවකාශය සේ පැතිර සිටින්නා වූ, ප්‍රමාණයෙන් විශ්වයේ පරමාණු සංඛ්‍යාවට සමාන වූ, සියලුම ජීවී සත්වයෝද මම ද ජිනවරයන් වහන්සේලාට හා අවකාශය පුරා පැතිර සිටින්නා වූ බෝධිසත්ව පුත්‍රයන්ට ගෞරව පුරස්සරව නමස්කාර කර සිටිමු.

## සප්තාංග ආයාචනය

*(සජ්ඣායනය කරමින් දණ්ඩ නමස්කාරයන් ද කරන්න)*

යහපත් හැසිරීම නැමති මාගේ ප්‍රාර්ථනාවේ බලයෙන්, සියලු ජිනවරයන්වහන්සේලා මා සිත් තුළ පැහැදිලිව පෙනී යති. මාගේ කායයන් විශ්වයේ පරමාණු ප්‍රමාණය හා සමාන බව මනසට නගා ගනිමින්, මම සියලු ජිනවරයන්ට හිස නමා ආචාර කරමි.

යහපත් හැසිරීම නැමති මාගේ ප්‍රාර්ථනාවේ බලයෙන් සියලු ජිනවරයන්වහන්සේලා මා සිත් තුළ පැහැදිලිව පෙනී යති. විශ්වයේ පරමාණු ප්‍රමාණය හා සමාන වූ කායයන්ගෙන් යුතු සියලු ජිනවරයන්ට මම නමස්කාර කරමි.

➢

තථතාවේ සමස්ත අවකාශය ජිනවරයන්ගෙන්
පිරී පවතින අයුරු සිතට නගා ගනිමිඃ
විශ්වයේ එක් එක් පරමාණුව මත,
විශ්ව-පරමාණු සංඛ්‍යාව හා සමාන
බුදුන් වහන්සේලා වැඩ සිටිති.
ඒ එක් එක් බුදුන්වහන්සේ වැඩ සිටින්නේ
බුද්ධ පුත්‍රයන් සමූහයක් මධ්‍යයේ ය.

➢

මම එම සියලු ජිනවරයන්ගේ ගුණ ගයමින්
එම සුගතයින් වහන්සේලා වර්ණනා කරමි.
මා එසේ කරන්නේ උන්වහන්සේලාගේ ගුණ ගැයෙන
ගීත සාගරයක් හා ශබ්ද සාගරයක් යොදා ගනිමිනි.

➢

*(දූන් ආසනයේ වාඩි වී, සංගීත වාදනය සමග පහත දක්වෙන ගායනාවන් කරන්න)*

උසස් ම වර්ගයේ මල් ද, උසස් ම මාලා ද, උසස් ම සංගීත භාණ්ඩද, ආලේපනයන්ද, (උතුරු) සළු ද, පහන් ද, උසස් ම සුවඳ දුම් ද යොදා ගනිමින් එම ජිනවරයන් වහන්සේලාට වන්දනා මාන කරමි.

උසස්තම ඇඟලුම් ද, උසස්තම සුවඳ වර්ග ද, මහාමේරුව සේ දැවැන්ත වූ හා උසස් රටාවන් ගෙන් යුතු සුවඳ කුඩු ද යොදා ගනිමින් ඒ ජිනවරයන් වහන්සේලාට ගරු සම්මාන දක්වමි.

සියලු ජිනවරයන් වහන්සේලාට කෙරෙන අද්විතීය වන්දනයක් මම සිතින් මවා ගනිමි. මෙම යහපත් හැසිරීම පිළිබඳ විශ්වාසයේ බලය යොදා ගනිමින් මම සියලු ජිනවරයන් වහන්සේලාට නමස්කාර කරමින් ගරු සම්මාන දක්වමි.

*(සංගීතය නවත්වන්න)*

රාග, ද්වේශ, මෝහයන්ගේ බලයට යටත්ව මා විසින් කයෙන්, වචනයෙන් හා සිතින් කරන ලද සියලුම වැරදි වලට සමාව ගනිමි.

මම සියලු ජිනවරයන් වහන්සේලාගේ ද, බුද්ධපුත්‍රයන්ගේද, පසේබුදුවරයන්ගේද, පුහුණුව සම්පූර්ණ කළ හා නොකළ - සේඛ, අසේඛ සියලුදෙනාගේ ද, විශ්වය පුරා සිටින සියලු ජීවී සත්වයන්ගේ ද පින් මම අනුමෝදන් වන්නෙමි.

සියලු බන්ධනයන්ගෙන් නිදහස්ව පූර්ණ අවදි බවට - බුද්ධ බවට පත් ආරක්ෂකයන් වූ ඥාණ ප්‍රදීපයන් වහන්සේලාගෙන් මා ඉල්ලා සිටින්නේ අනුත්තර වූ ධර්ම චක්‍රය පවත්වන ලෙසට ය.

නිවනට පිවිසීමට අපේක්ෂා කරන සියලු බුදුවරයන් වහන්සේලාගෙන් මා දොහොත් මුදුන් දී ආයාචනා කර සිටින්නේ, මුළු ලෝකයාගේම සුවසෙත පිණිස, විශ්වයේ ඇති පරමාණු සංඛ්‍යාව තරම් වූ කල්ප ගණනක් සංසාරය තුළ රැඳී  සිටින ලෙස ය.

ගුණ වර්ණයෙන්ද, වන්දනාමානවලින්ද, පාපොච්චාරණයෙන්ද, අනුමෝදන් වීමෙන්ද, ආයචනයෙන්ද, අභියාචනයෙන්ද මා රැස් කරගත් කවර හෝ කුශලයක් ඇත්නම්, ඒ සියල්ලම මම බුද්ධ බෝධිය වෙනුවෙන් කැප කර සිටිමි.

## <u>ශික්ෂාපද අට සමාදන් වීම</u>

අතීත තථාගත අරහත් සම්‍යක් සම්බුද්ධයන් වහන්සේලා - බුද්ධිමත් අශ්වයා හා මහා හස්තියා මෙන් - තම කාර්යය අවසන් කොට, වැඩ නිමවා, බර බිම තබා තම ඉලක්ක සපුරා ගත්හ; සසර බැම් සම්පූර්ණයෙන්ම සිඳ බිඳ දැමූහ; පරිසමාප්ත කථාවෙන් යුතු වන්නාහ, සම්‍යක් විමුක්ත මනසින් යුතු වන්නාහ. උන්වහන්සේලා ජීවී සත්වයන්ගේ හිත සුව පිණිස, (ඔවුන්) විමුක්තියට පත් කිරීම පිණිස, (ඔවුන්) අසනීප වලින් නිදහස් කිරීම පිණිස, (ඔවුන්) අසනීප වලින් නිදහස් වන ලෙස, අනුත්තර සම්‍යක් සම්බෝධියට පත් වීම සඳහා සුවපත් කිරීමේ පවිත්‍ර කිරීමේ ශික්ෂාපද සමාදන් වූයේ යම් සේ ද,

ඒ ආකාරයෙන්ම (මෙතැනට නම යොදන්න).... වන මම ද මෙතැන් පටන් හෙට ඉර උදාවන තුරු, නිශ්චිත ලෙස හා නිවැරදි ලෙස සුවපත් වීමේ හා පවිත්‍ර වීමේ ශික්ෂාපද සමාදන් වන්නෙමි. (3 වරක් කියන්න)

## <u>ශික්ෂාපද රැකීම සඳහා කැපවීමේ ආයාචනය</u>

මේ මොහොතේ පටන් මම සත්ව ඝාතනය නොකරමි. වෙනත් අයකුගේ ධනය නොගනිමි, නුදුන් දේ නොගනිමි. (අදත්තාදානය නොකරමි, සොරකම් නොකරමි.)

ලිංගික ක්‍රියාවේ නොයෙදෙමි.

මුසා බස් නොකියමි.

මද්‍ය පානයෙන් සම්පූර්ණයෙන් වළකිමි;

ඒ බොහෝ වැරදිවලට එයම මුලක් වන බැවිනි.

මම උස් අසුන් මහ අසුන් භාවිත නොකරමි.

එසේම මම අවේලාවේ ආහාර නොගනිමි.

මම මාලා, ගන්ධ, විලේපන, අලංකරණ අත්හරිමි.

නච්ච,ගීත, වාදිතයන් හි නොයෙදෙමි.

අරහතුන්වහන්සේලා සත්ව ඝාතන යනාදියෙන් වැළකුණු සේ

මම ද සත්ව ඝාතන යනාදියෙන් වළකිමි.

අනුත්තර සම්බෝධිය ලැබී දුක්බරින් පීඩිත ලෞකික ජීවී සත්වයන්

සසර සයුරින් මුදවා ගැනීමට මට ද හැකි වේවා!

➢

**ඕං අමෝඝ ශීල/සම්භාර සම්භාර/භාර භාර/මහා ශුද්ධසත්ව/පද්ම**

**විභූෂිත භුජ ධර ධර සමන්ත අවලෝකිතේ හුං ඵට් ස්වාහා/** (7 හෝ 21 වරක්)

ශික්ෂාපදවල නිවැරැදි ආචාරශීලී බවද, නිවැරදි, පවිත්‍ර සදාචාරය ද රැක ගැනීමට හැකිවේවා!

ආචාර ධර්ම පවිත්‍ර ලෙස හා නිකැලැල් ලෙස අනුගමනය කිරීමෙන්,

ශීල පාරමිතාව සම්පූර්ණ කිරීමට මට හැකි වේ වා!

➢

### (සරණ යාම)

මම,

විශ්ව ව්‍යාප්ත වූ අතීත, වර්තමාන, අනාගත තථාගතයන්වහන්සේලාගේ කයේ, වචනයේ හා මනසේ යහපත් ගුණාංගවල හා ක්‍රියාකාරිත්වයන්හි සාරය වූ, කාරුණික මූල පරම්පරාගත, කීර්තිධර හා පරිශුද්ධ ගුරුවරුන් වහන්සේලා සරණ යමි;

අසූහාර දහසක් ධර්මස්කන්ධයේ මූලාශ්‍රය සරණ යමි;

සමස්ත ආර්ය සංඝ ආචාර්යයන්-

වහන්සේලා සරණ යමි,

මම බුදුන් සරණ යමි.

මම දහම් සරණ යමි.

මම සඟුන් සරණ යමි.

මම, සහෝදර සුගතයන් වහන්සේලා අට නම පිරිවර කොට ඇති දේවතාමණ්ඩලය සමග භෛෂජ්‍ය ගුරු බුදුන්වහන්සේ සරණ යමි (3 වරක් කියවන්න)

## බෝධිචිත්ත ජනනය

සියලු ජීවී සත්වයන් වෙනුවෙන්, මම අනුත්තර සම්‍යක් සම්බෝධිය සාක්‍ෂාත් කළ යුත්තෙමි. එය මුදුන්පත් කර ගැනීම සඳහා, භාග්‍යවත් සහෝදර සුගතයන් වහන්සේලා අටනම සහ පිරිවරට නමස්කාර කිරීම, වන්දනා කිරීම හා උන්වහන්සේලාගේ ප්‍රතිඥාවන් ඉටු කරන ලෙස ඉල්ලා සිටීම ද ඇතුළත්, මාර්ගාංගයන් අනුගමනය කිරීමේ යෙදෙන්නෙමි.

## සතර අපරිමාණ ධර්ම ආකල්පයන් වැඩීම

මා මෙන්ම, පෙනී යන සියල්ල මද තථතා භූමියේ ස්වරූපය ගනී. මෙය ප්‍රත්‍යක්‍ෂ නොකරන සියලුම ජීවී සත්වයෝ සතුට හා සතුටේ හේතු ලැබිය යුත්තෝය. ඔවුහු, දුකෙන් හා දුකට හේතුන්ගෙන් නිදහස් විය යුත්තා හ. ඔවුන් දුකෙන් තොර සැපය නොමැතිව නොසිටිය යුතුය. ඔවුන් සැපයේ හා දුකේ හේතුව වූ රාගයෙන් හා ද්වේශයෙන් නිදහස්ව උපේක්‍ෂාවෙන් හැසිරිය යුතු ය. එමෙන්ම, කෙනෙකු තමාට සමීප හෝ දුරස්ථ යයි වෙනස්කම් දැකීමෙන් ද නිදහස් විය යුතුය.

## ස්ථානයට ආශිර්වාද කිරීම

ත්‍රිවිධ රත්නයේ සත්‍යයෙන්ද, බුදුන්වහන්සේලාගේ හා බෝසත්වරුන්ගේ ආශිර්වාදයෙන්ද දෙයාකාර සංචිතයන් සම්පූර්ණ කිරීමේ මහා බලයෙන්ද, සත් බුදුන් වහන්සේලාගේ විශේෂ පූර්ව ආයාචනයන් සහිත විශේෂිත සූත්‍රයෙහි දක්වා ඇති පරිදි මෙම ස්ථානය උත්තම බවට උත්කෘෂ්ට බවට පත් වේ වා! දස දිසාවන්හි වෙසෙන සියලුම තථාගතයන් වහන්සේලා හා උන්වහන්සේලාගේ ආධ්‍යාත්මික දාරකයන් වූ බෝසතුන්වහන්සේලා ද, ආර්ය ධර්මාරක්‍ෂකයෝ ද, මෙම පූජා භාණ්ඩ සංචිතයද උත්කෘෂ්ට බවට පත් වෙත්වා! මේ දේවල්, පූර්ව බුදුවරුන්ගේ හා බෝසත්වරුන්ගේ විශේෂ ප්‍රාර්ථනයෙන් නිමැවුණු බුද්ධ ක්‍ෂේත්‍රයන් මෙන් පවිත්‍ර වේවා! ඒවා අමිතාභ බුදුන්වහන්සේගේ බුද්ධක්‍ෂේත්‍රයන් හා සමාන ගුණාංගයන් ගෙන් යුතු වේවා!

එහි භූමිය සාදා ඇත්තේ නා නා අගනා ද්‍රව්‍යයන්ගෙනි. එය අල්ල මෙන් සමතල වූයේ ය, නිකැලැල් හා උද්දීප්ත වූයේ ය; එහි තැනිතලා ප්‍රදේශ සඳුන් සුවඳ හමන වෛර්ණ දිව්‍ය පුෂ්ප රාශියකින් ගැවසී  ගත්තේ ය. එහි බාහිර සීමාව සකස් කොට ඇත්තේ මැණික්වලිනි. රන්, මිණි, මුතු සුණු සහිත එය රතු, නිල් හා සුදු නෙළුමින් ආවරණය වී ඇත්තේ ය. අට ආකාර ගුණයන් සහිත ජලයෙන් යුතු එහි වැව්, පොකුණු හා දිය කඩිති නිසා භූමිය අලංකාර වන අතර එය වඩාත් උත්කර්ෂවත් වූයේ මිහිරි ගී ගයමින් හැසිරෙන ජලජ පක්‍ෂීන් නිසා ය. එහි වූ කල්ප වෘක්‍ෂයන් හි අතු දිව්‍යමය ආභරණ, මුතු මාලා, අගනා පීත්ත පටි, මල් පොකුරු, පළතුරු ආදියෙන් බර වී ඇති අතර, එහි එල්බෙමින් ඇති ස්වර්ණමය සීනු වලින් නැගුණේ ශුද්ධ වූ ධර්මයේ හඬ ය.

## මන්දිරයට ආශිර්වාද කිරීම

එම ස්ථානය මැද සප්ත රත්නයන්ගෙන් නිමවුණු උද්දීප්ත මන්දිරයක් ඇත්තේ ය. එයින් නිකුත් වන රශ්මි ධාරාවන්ගෙන් අසීමිත ලෝක ධාතු පද්ධති සංඛ්‍යාවක් පිරී යන්නේ ය. අසීමිත කාමර සංඛ්‍යාවක් මනාව අනවශ්‍ය ලෙස මිනිසුන් නොගැවසෙන සේ සකස් කොට ඇත්තේ ය. ත්‍රිවිධ ලෝක ධාතුන්ගෙන් ඔබ්බේ ඇති එය පැන නගින්නේ සැබවින්ම ලොවින් එතර ගිය උත්තමයන්ගේ කුශල මූලයන්ගෙන් වන අතර, එහි ඇත්තේ සම්පූර්ණයෙන්ම පාලනය වූ විඥාන ස්වභාවයකි.

එම තථාගත ආවාසයෙහි බෝධිසත්ව සමූහයක් වෙසෙන්නා හු ය. අසීමිත, දේව, නාග, යක්ෂ, ගන්ධර්ව, අසුර, ගරුඬ, කින්නර, නාගරාජ, මිනිස් හා නොමිනිස් ජීවී සත්වයන් සංඛ්‍යාවක් ද එය තුළ සැරිසරති. ධර්ම රසයේ මහා සුබයෙන් හා ආනන්දයෙන් ස්ථාපනය වී එය පවතින්නේ ජීවී සත්වයන්ගේ සියලු අරමුණු ඉටු කර ගැනීම සඳහා ය. එය කෙලෙස් බර හැඟීම් නැමති කලුෂයන්ගෙන් නිදහස්ව පවතින අතර, මාරයන්ගෙන් ද සම්පූර්ණයෙන්ම තොර වූවකි. මෙම තථාගත ආවාසය අනෙක් සියල්ලන්ටම වඩා උත්කෘෂ්ට වූවකි. එය පැන නගින්නේ මහා අනුස්සතිය, බුද්ධිය හා ප්‍රත්‍යක්ෂය වෙතිනි. එය රඳා පවත්නේ ශමථය හා විපස්සනාව මත ය. එයට ඇතුළු විය යුත්තේ ශූන්‍යතාව, අලක්ෂණ භාවය හා නිරපේක්ෂත්වය යන ද්වාර හරහා ය.

අගනා රාජකීය පද්ම රාශියක් මත ගොඩ නැගුණු මෙම දෑවැන්ත මන්දිරය අසීමිත සද්ගුණයන්ගෙන් අලංකාරව පැන නගීවා!

## ආසනවලට හා සිංහාසනවලට ආශිර්වාද කිරීම

එම මන්දිරයේ භද්‍ර මහා සිංහාසන තුළ පනවා ඇති පද්මාසන මත, සුපරිකීර්තිත නාම ශ්‍රී රාජ තථාගතයන් වහන්සේද, සුවර්ණ භද්‍ර විමල රත්න ප්‍රභාස ව්‍රත තථාගතයන්වහන්සේ ද, අශෝකෝත්තම තථාගතයන් වහන්සේද, ධර්ම කීර්ති සාගර ඝෝෂ තථාගතයන් වහන්සේ ද, ධර්ම සාගර වරමති වික්‍රීඩිතාභිඥ රාජ තථාගතයන් වහන්සේ ද, භෛෂජගුරු වෛඩූර්ය ප්‍රභරාජ තථාගතයන් වහන්සේද, ශාක්‍යමුනි භාග්‍යවතුන් වහන්සේද, දස දිසාවන්හි වැඩ වෙසෙන සියලුම තථාගතයන් වහන්සේලා ද, බෝසත්වරුද, ශුද්ධ වූ ධර්මය ආරක්ෂා කරන ධර්මාරක්ෂකයෝ ද අසුන් ගෙන සිටින්නාහ. ඒ සියලු දෙනාම තම තමන්ගේ විශේෂිත අපේක්ෂාවන්ට හා රාජකීය බලයන්ට අනුකූලව පෙළ ගැසුණු වේදිකාවන් මත පහළ වෙත්වා!

## දාන වස්තූන්ට ආශිර්වාද කිරීම

දෙවි මිනිසුන්ට ප්‍රයෝජනවත් වන අන්දමේ බාහිර - අභ්‍යන්තර දේවල් වූ උසස්තම වර්ගයේ කෑම, බීම, අබරණ, සංගීතය යනා දී දේවල් පහළ වේවා! <u>ත්‍රිවිධ සංචිතයන් හා යහපත් හැසිරීම පිළිබඳ සූත්‍රයේ</u> සඳහන් ආකාරයට, ඒවා සැරසිලි සහිතව දාන වලාහක සාගරයන් සේ පෙනී සිටීවා! සියලු ආර්යයන් වහන්සේලා, එම සිංහාසනයන් මතට පැන නැගී, මෙම දාන වස්තූන්ට ආශිර්වාද කොට, ඒවා පිළිගෙන වළඳත්වා! (3 වරක්)

(දානයේ කුසලය මහත් සේ වර්ධනය වීමට උපකාරී වන බව කියා ඇති පහත සඳහන් සමන්තභද්‍ර ධාරණිය සත්වරක් සජ්ඣායනය කරන්නඃ)

**ඕං නමෝ භගවතේ වජ්‍රසාර ප්‍රමර්දනේ**
**තථාගතාය අර්හතේ සම්‍යක් සම්බුද්ධාය /තද්යථා**
**ඕං වජ්‍රේ වජ්‍රේ/මහා වජ්රේ/මහා තේජ වජ්රේ/**
**මහා විද්‍යා වජ්රේ/මහා බෝධිචිත්ත වජ්රේ**
**මහා බෝධි මණ්ඩෝප සංක්‍රමණ වජ්රේ/සර්ව**
**කර්ම ආවරණ විශෝධන වජ්රේ ස්වා හා** (7 වරක්)

➢

ත්‍රිවිධ රත්නයේ සත්‍යයෙන්ද, බුදුන්වහන්සේලාගේ හා බෝසතුන් වහන්සේලාගේ ආශිර්වාද බලයෙන්ද, දෙයාකාර සංචිතයන්ගේ මහා බලයෙන් ද, පූර්ණ පවිත්‍ර යථාර්ථ භූමියේ ප්‍රවේගයෙන්ද එය එසේම වේවා! (<u>තුන් වරක් කියන්න</u>)

➢

සිංහාසන මත වැඩ පද්මාසනයන් හි වැඩ වෙසෙන්නා වූ සූරිකීර්තිත-නාම ශ්‍රී-රාජ; රත්න-චන්ද්‍ර-පද්ම-ප්‍රතිමණ්ඩිත-පණ්ඩිත-තේජඃ-ස්වර ඝෝෂ; සුවර්ණ-භද්‍ර-විමල-රත්න ප්‍රභාස-ව්‍රත; අශෝකෝත්තම; ධර්මකීර්ති-සාගර-ඝෝෂ, ධර්මසාගර-වරමති-වික්‍රීඩිතාභිඥ-රාජ; භෛෂජ්‍ය-ගුරු-වෛඩූර්ය-ප්‍රභ-රාජ; භාග්‍යවත් ශාක්‍යමුනි යන තථාගතයන් වහන්සේලාද, සියලු බෝධිසත්වයන් පිරිවර කොටගත්, තුන් කල්හි හා දස දිසාවන්හි සියලු තථාගත අරහත් සම්‍යක් සම්බුදුන් වහන්සේලා ද මාගේ මේ ආයාචනය අසා වදාරන සේක් වා!

➢

මහා කාරුණික භාග්‍යවතුන් වහන්සේලාණෙනි, ධර්මය පිරිහී යන, සියලු ජීවී සත්වයන් නොයෙකුත් කර්ම බන්ධනයන් ගෙන් බැඳී, නොයෙක් දුක් වේදනාවන්ගෙන් පරිපීඩිතව අසරණව සිටින මෙම අවසාන අවුරුදු පන්සියයේදී සියලු ජීවී සත්වයන් රැකබලා ගන්නා සේක්වා! දෙව් මිනිසුන් වෙනුවෙන්, ඔවුන්ගේ හිත සුව පිණිස, තථාගතයන් වහන්සේලාගේ උපාය කෞශල්‍යයන් මත රඳා පවතිමින්, පෙර කරන ලද විශේෂ ප්‍රාර්ථනාවන්ගේ යහපත් බවින් හා ආශිර්වාදයෙන්, අසීමිත බලයේ හා ශක්තීන්ගේ ආශිර්වාදයෙන්, අපගේ ආරක්ෂකයන් ලෙස ඔබවහන්සේලාගෙන් ඉල්ලා සිටින්නේ, මෙම පූජා කර්මයට සම්බන්ධ ප්‍රධාන අනුග්‍රාහකයාද, අප ද සසර සැරි සරන අනෙකුත් බොහෝ ජීවී සත්වයන්ද ආරක්ෂා කර දෙන ලෙස ය. ඒ අනුව, අප කෙරේ කරුණාවෙන් පූජා, මාලාවන්ද සහිත මෙම මාළිගා මණ්ඩලයට පැමිණ ඔබ වහන්සේලාට නියමිත අසුන් වල වැඩ හිඳීමින් මෙම ස්ථානයට ආශිර්වාද කරන සේක්වා!

ධම්මානුධම්ම ප්‍රතිපත්ති පිරීම සඳහා ජීවී සත්වයන්ට ඇති වාසනා ගුණය හෙවත් පින් පිරිහී යාම නිසා, අපගේ ශාක්‍යමුනී භාග්‍යවතුන්වහන්සේ මෙම ජම්බුද්වීපයේ දී නිර්වාණයට පත් වූ ආකාරයක් පෙන්වා සිටියද, උන්වහන්සේ, නොයෙක් තථාගත කාර්යයන් හරහා ජීවී සත්වයන්ගේ අරමුණු මුදුන්පත් කරමින් වෙනත් ලෝකධාතූන් තුළ රැඳී සිටින්නාහ. මහා කරුණාවෙන් හා පෙර කරන ලද විශේෂ ප්‍රාර්ථනාවන්ගෙන් යුතු ආරක්ෂකයන් වූ ඔබ වහන්සේලාගෙන් ඉල්ලා සිටින්නේ, අප ඔබගේ පාලනය යටතට ගෙන අප කෙරේ කාරුණික වෙමින් අප හා අනෙකුත් බොහෝ ජීවී සත්වයන් ආරක්ෂා කරන ලෙස ය. අප කෙරේ කරුණාව උපදවා, සකස් කර ඇති පූජා මාලාවන් සහිත මෙම මාළිගා මණ්ඩලයට පැමිණ සකස් කොට ඇති ආසනවල අසුන් ගනිමින් මෙම ස්ථානයට ආශිර්වාද කරන සේක්වා!

ත්‍රාණමුක්ත හා වජ්‍රපානි වැනි ජිනවරයන් වහන්සේලාගේ පුත්‍රයා වූ උතුම් මංජු ශ්‍රී බෝධිසත්ව මහා සත්වයන් ඇතුළු අනෙකුත් මහා බෝසත්වරුනි! <u>සත් බුදුන්වහන්සේලාගේ පූර්ව විශේෂ ප්‍රාර්ථනාවන් ඇතුළත් විස්තාරිත සූත්‍රය</u> උගන්වන අවස්ථාවේ දී ඔබවහන්සේලා දම්සභාව තුළ රැස්ව සිටියහ. සූත්‍රයේ අරමුණුවලට ආශිර්වාද කරමින් ඔබවහන්සේලා තථාගතයන් වහන්සේලාගේ උපදෙස් මුදුන්පත් කිරීමට අදිටන් කළාහු ය. අප හා වෙනත් බොහෝ ජීවී සත්වයන් ආරක්ෂා කිරීම සඳහා ආරක්ෂකයන් ලෙස ඔබවහන්සේලාට ඇරයුම් කරන ලද බැවින් අප කෙරේ කරුණාවෙන් නොපමාව මෙම මාළිගා මණ්ඩලයට පැමිණ පූජාමාලාවක් සහිත මෙම ආසන සරසා ලමින් මෙම ස්ථානයට ආශිර්වාද කරනු මැනවි!

මහා යක්ෂ සෙන්පති කිම්භීරයෙනි, මහා යක් සෙන්පති වජ්‍රයෙනි, මහා යක් සෙන්පති මේඛිලයෙනි, මහා යක් සෙන්පති අන්තිලයෙනි, මහා යක් සෙන්පති අනිලයෙනි, මහා යක් සෙන්පති සන්තිලයෙනි, මහා යක් සෙන්පති ඉන්දයෙනි, මහා යක් සෙන්පති පායිලයෙනි, මහා යක් සෙන්පති මහාලයෙනි, මහා යක් සෙන්පති චිදාලයෙනි, මහා යක් සෙන්පති චෞන්ධුලයෙනි, මහා යක් සෙන්පති විකලයෙනි! පෙර තථාගත මහා සභාවේදී, සත් බුදුන් වහන්සේලාගේ පූර්ව විශේෂ ප්‍රාර්ථනාවන් ඇතුළත් විස්තාරිත සූත්‍රය ආරක්ෂා කළ ජීවී සත්වයන් ද ශුද්ධ වූ ධර්මය ද, සතර පේරුවේ ධර්ම අනුගාමිකයන් ද ආරක්ෂා කරන බවට ඔබ එක් එක් කෙනා ප්‍රතිඥා දුන්නාහු ය. ඔබ සියලු දෙනාම පෙර වූ පොරොන්දු මතක් කර ගනු මැනවි. අප හා වෙනත් ජීවී සත්වයන් ආරක්ෂා කරන ආරක්ෂකයන් හා රැකවලුන් ලෙස ඔබ හැමට ඇරයුම් කොට ඇති බැවින්, පූජා මාලාවක් ද සහිත මෙම මාළිගා මණ්ඩලයට පැමිණ ඔබට නියමිත අසුන්වල වාඩිගෙන මෙම ස්ථානයට ආශිර්වාද කරනු මැනවි!

➢

අභිමත පරිදි පවතින්නා වූ,
යාමෙන්, ඒමෙන්, උපතින් හා දිරායාමෙන්
නිදහස් වූ ශුද්ධ වූ කායයෙනි,
මොරන සඳ මඩල සේ,
අප කෙරේ කරුණාවෙන් ලොව රැක ගැනීම පිණිස
පැමිණෙනු මැනවි!

➢

භාග්‍යවතුන් වහන්ස ! , ඔබ පරම සුඛය වෙත ගියාහු ය.
අප වෙත කුශල වාසනාව ඇත්තේ ය.
මා  පුද කළ මේ පූජාවන් භාර ගෙන
මා සමග සතුටු සිත් ඇති වන සේක්වා !

➢

ඔබ වහන්සේගේ ස්වභාවය අතිශයින් පවිත්‍ර බැවින්,
ඔබ වෙත රාග බන්ධනාදිය නොමැත්තේ ය.
එහෙත් අපගේම අඳුරු තැන් පිරිසිදු කර ගැනීම සඳහා,
ඔබගේ සිරුර පැදි දියෙන් සෝදන ලෙස ඉල්ලා සිටිමු.

➢

තථාගතයන්ගේ හා බුද්ධ පුත්‍රයන්ගේ සිරුරු
සුවඳ කැවූ ජලයෙන් පිරුණු
අගනා මනහර බඳුන්වලින්
සෝදා පිරිසිදු කරන ලෙස අපි ඉල්ලා සිටිමු.

➢

ගීතයට හා සංගීතයට අනුගතව
අප උන්වහන්සේලාගේ සිරුරු තෙතමාත්තු කරන්නේ
සියුම් සුවඳින් සුවඳ කවනු ලැබූ
අද්විතීය පිරිසිදු තුවාවලිනි.

ඒ ළඟට අප උන්වහන්සේලාට පුද කරන්නේ

ඉම්හිරි සුවඳ කවන ලද උසස්තම වෛවර්ණ ඇඳුම් ය.

නොසිඳෙන බැතියෙන් යුතුව මා පුද කරන්නේ

සියුම්, මෘදු හා විස්තාරිත දිවසළු ය.

බිඳිය නොහැකි වජ්‍රකායට සතුට දීම සඳහා,

මා හට ද වජ්‍රකායක් ලැබේ වා!

➢

ව්‍යාකුල හැඟීම් නැමති පිපාසයෙන් පෙළෙන ජීවී සත්වයන්

ධර්මය නැමති ජලයෙන් තෘප්තිමත් කිරීම සඳහා

අඩුපාඩු වලින් තොර බුදු බව ලබාගැනීමම සිත දරාගෙන

මම මෙම බඳුන්වලින් ජලය ඔබවහන්සේලාට පුද කරමි.

ධර්මය ඉගැන්වීම සඳහා මෙම පවිත්‍ර මණ්ඩලය තුළ

උත්කෘෂ්ට පවිත්‍ර මහා ආසන සකස් කොට ඇත්තේය;

අචංචල භාවනාමය ඒකාග්‍රතාව තුළ ගිලෙමින්

අප කෙරේ කරුණාවෙන් සතුටින් අසුන් ගනු මැනවි!

අන්ධකාරයෙන් හා රැස්කැමෙන් නිදහස් වූ තථාගතයන් වහන්සේලා,

අප කෙරේ කරුණාවෙන් මෙම මහා සිහසුන් මත

අසුන් පිළිවෙලින් සතුටින් වැඩ සිටිත්වා!

උන්වහන්සේලා තම තම බුද්ධ ක්ෂේත්‍ර වලින් ඍද්ධිමය ලෙස අවකාශයෙන් වැඩම කරන්නාහ. මන්දිරය මධ්‍යයේ ඇති මහා සිංහාසන අට මත තථාගතයන් වහන්සේලා අට නම වැඩ හිඳින්නාහ. ධර්ම ග්‍රන්ථ සංචිතයන් ද අසුන් ගන්නේ ය. මැද පෙළේ ආසන සකස් කොට ඇත්තේ සූත්‍රයේ හැඳින්වීමක සඳහන් වූ බෝධි සත්වයන් හෝ අසීමිත බෝසත් සංචිතය සඳහා ය. ඒ අයගේ ඉදිරියෙන් සූදානම් කොට ඇත්තේ, මංජු ශ්‍රී, ත්‍රාණමුක්ත හා වජ්‍රපානි යන බෝසත්වරයන්ගේ අසුන් ය. ඒ අයද එහි වාඩි වී සිටින්නේ, පූර්ව ප්‍රතිඥාවන්ට අනුව, තම ශුද්ධ වූ කාර්යයන් සිද්ධ කරමින් බව සිතන්න. තථාගතයන් වහස්සේලාගෙන් වම් පස පේළියේ සූදානම් කොට ඇත්තේ, යක් සෙන්පතිවරුන්ගේ ආසනයන් ය. බ්‍රහ්ම හා ඉන්ද්‍ර යන දෙදෙනාගේ ආසන සූදානම් කොට ඇත්තේ එහි දකුණු පසිනි. ද්වාර සතරට අරක්ගෙන සිටින්නේ සතරවරම් මහරජ දරුවන් ය. ඒ අයද හිඳගෙන සිටින්නේ තම තම ප්‍රතිඥාවලට අනුව බව සිතන්න.

## <u>පරම්පරාව සඳහා නමස්කාරය</u>

ශුද්ධෝදන රජුගේ පුත්‍රයා වූ ද, දෙව් මිනිසුන්ගේ ශාස්තෘ වූ ද ශාක්‍යමුනී බුදුන් වහන්සේ, ජිනවරයන්ගේ පරම පුත්‍රයා වූ ආරක්ෂක මංජු ශ්‍රී උතුමාණන්, බුදුදහමේ මිත්‍රයා වූ ශාන්ත රක්ෂිත සංඝපීතෘන් වහන්සේ, ත්‍රිසොං දෙත්සං අධිරාජයන් යන සිවුදෙනාට නමස්කාර වේවා!

දිව්‍යමය පුත්‍රයා වූ සයිනලෙග් ජිං යොන්, පරිවර්තන ප්‍රමිතිය ස්ථාපනය කළ අදිරද රල්පචෙන්, උමතු ලංදර්මා ඝාතනය කළ හලුං පල්ගි දොර්ජේ හා ඕ සුං අගරජ යන සිව් දෙනාට නමස්කාර වේ වා!

ත්‍රිවිධ රත්නයන් ගුරු කොට තබාගත් පල්බොර්තන්, ධර්මයට ගරු කළ ක්යිදේ න්යිමා ගොන්, ධර්ම රාජන් වූ නරපති තාෂි දේ සහ ල්හයි ලාමා යෙෂේ ඕ යන සිවුදෙනාට නමස්කාර වේවා!

පෘථිවිය ආරක්ෂා කරන නරපති ල්හායි දේ,
ඉක්ෂ්වාකු පරපුරේ ගෞරවණීය ඕ දේ,
හිම දේශයේ මිත්‍ර ල්හාචිග් ට්සේ දේ,
හා,න්ගාරි ඩ්‍රග්චොම්පා ජංචුබ් ට්සුල් ත්‍රිම්
යන සිවු දෙනාට නමස්කාර වේවා!

ගුණවත් මිත්‍ර චූලං පා ෂෙරබ් ඩ්‍රග්,
රස චුලංපා ධර්ම ගසල්ට්සන් ස්වාමියාට,
නර්තං හි දොමෝ චේ ආචාර්ය සූර්යයා
සහ සංග්යේ ගොම්පා යන සිවුදෙනාට
නමස්කාර වේවා!

➢

න්‍යග් පරපුරේ උපන් නිංපෝ ග්යල්ට්සන් උත්තමයා,
අසමසම ඩ්රුලුං කුංගා මොන්ලම් හිමිපාණන්,
පංඛං ලාමා ඩ්‍රග්පා පල් සංපෝ,
සහ සංතොන් සොනම් ඩ්‍රග්පා යන
සිව් දෙනාට නමස්කාර වේවා!

➢

චොලුං හි මහා සංඝපිතෘ වූ ඩ්‍රග්පා ගසල්ට්සන්තුමා,
සැබෑ මංජු ශ්‍රී කෙනෙකු වූ පූජ්‍ය රින්චෙන් ග්‍යාල්ට්සන්,
පරම විනයධර ග්‍යාල්වා චග්න දොර්ජේ තුමා, හා
කුංගා ලොද්රෝ යන සිව්දෙනාට නමස්කාර වේවා!

➢

මහ තවුස් ට්සුල්ත්‍රිම් පල්ජොර්,
සියලු වැරදි වනසා දමා සමන්ත භද්‍රයන්ගේ
සවිය ලබා ගත් පල්බාර්තුමා,
නිසැකවම ප්‍රබුද්ධ තත්ත්වයට පත් බ්යෙන්ට් සේ   වංචුග් හිමි,
හා චංචුක් රබ්ටන් යන සිව් දෙනාට නමස්කාර වේවා!

➢

අධිනායක, ආරක්ෂක තේජවන්ත සොනම් චොග් දුන්
චලු හි මහා සංඝපීතෘ, මුල ගුරුරින්චෙන් සොනම් චොග්ද්රුබ්,
සහ නසාර් හි ධර්ම ස්වාමිවරයාගේ හෘදය පුත්‍ර
රබ්ජම් චොජේ රින්චෙන් ග්‍යාට්සෝ යන තිදෙනාට
නමස්කාර වේවා!

න්ගවං ලොසල් දේ හා කල්සං ග්‍යාට්සෝ යන
දෙදෙනාට නමස්කාර වේවා!
මෙම ධර්මයේ කරුණාව මා ලබා ගත්තේ සූත්‍ර
දසලක්ෂ ගණනක් වූ,
පරම වජ්‍ර බුද්ධිය දරන්නා වූ මෙම භාණ්ඩාගාර දෙකෙනි.

අද්විතීය උපදේශ සම්ප්‍රේෂකයන් වූ,
සංග්‍යා ගොම්පා විසින් රැකබලා ගත් චිම් නම්බා ද්රග්,
මහා සද්ගුණවත් මිත්‍ර සොනම් යෙෂේ හිම්, සහ,
සර්වදර්ශී චංටොන් සොනම් ද්රග් යන තිදෙනාට
නමස්කාර වේවා!

සූත්‍ර ධර්මයේ ඥාතියා වූ ශාන්තරක්ෂිත බෝසත් තුමා,
එතුමාගේ පරපුරේ බෑණා වූ තරුණ බෝසත්වරයා,
සහෝර් ගෙවා පල් හි ධර්ම රාජ හා
දීපංකර ජොවෝ චෙන්පෝ අතීශ යන
සිව්දෙනාට නමස්කාර වේවා!

ධර්ම ඉගැන්වීමේ කොඳු නාරටිය වූ සංඝරාජ ජංචුබ් ඕ
පෘථග්ජනයා ධර්මය කරා මෙහෙයවන ට්සි චෙන්පෝ,
මහා බෝධිසත්ව වූ ස්වාමි දවා ග්යල්ට්සන්,
සහ කොංපෝ ලොත්සවා යන සිව්දෙනාට නමස්කාර වේ වා!

ව්‍යාකුල හැඟීම් නැමති සතුරු සමූහය විනාශ කරන
ද්රචොම් පා ග්‍යාල්ට්සන් ජේ,
ග්‍යාබා වංපෝර් ඩ්සෙපායි ඩ්‍රග්න්යෙන් බාර්,
ග්‍යාබා පල්සදොම්ස්තොන් තුල්වුග්චන් හා
යොන්තෙන් වන් චුග් යන සිව්දෙනාට නමස්කාර වේවා!

අෂ්ට තථාගතයන් සඳහා වූ සූත්‍ර පූජා කර්මයේ, පරම්පරා ගුරුවරුන් වූ
මහා විද්වත් භික්ෂුවක වූ ෂං හි විනයාචාර්යයන්වහන්සේ,

මහා සංඝනායකයකු වූ ෂංතොං සොනම් ඩ්‍රග්පා බෝසතාණන් වහන්සේ යනාදී
අයට නමස්කාර වේවා!

හිම භූමියේ යහපත හා සෞභාග්‍යය පිළිබඳ මූලාශ්‍රයවූද,
සියලුම මට්ටම්වල ජනයාට පුහුණු කිරීමට සුදුසු වූද මෙම මාර්ගය,
ධර්මරාජයන්ගේ පෞද්ගලික පුහුණුව වූ මෙම සූත්‍ර පූජා කර්මය,
භාරගෙන, ආරක්‍ෂා කොට, ප්‍රසිද්ධියට පත් කළා වූ
සියලු දෙනාට නමස්කාර වේවා!

දස දිසාවන්හිම සහ තුන් කල්හිම වෙසෙන
බෝසත් දූ පුතුන් සහිත සියලු සුගතයන්
වහන්සේලාට මම නමස්කාර කරමි, නමස්කාර කොට
ඒ සියලු දෙනාගේ සරණ යමි.

බෝසත්වරුන් අසීමිත ත්‍රිසාහස්‍ර සංඛ්‍යාත ප්‍රමාණයක්
පිරිවරා ගත් සුපරිකීර්තිත නාම ශ්‍රී රාජ
තථාගත අරහත් සම්‍යක් සම්බුද්ධයන් වහන්සේට
නමස්කාර කරමි; ඒ සියලු දෙනාගේ සරණ යමි.

බෝධිසත්වයන් බොහෝ ගණනක් පිරිවරාගත්,
රත්න-චන්ද්‍ර-පද්ම-ප්‍රතිමණ්ඩිත-පණ්ඩිත තේජඃ
ස්වරඝෝෂ-රාජ තථාගත අරහත් සම්‍යක්
සම්බුද්ධයන් වහන්සේට නමස්කාර කරමි;
ඒ සියලු දෙනා වහන්සේම සරණ යමි.

බෝධිසත්වයන් අසංඛ්‍ය සංඛ්‍යාවක්
පිරිවරා ගත් සුවර්ණ-භද්‍ර-විමල-රත්න-
ප්‍රභාස-ව්‍රත තථාගත අරහත් සම්‍යක්
සම්බුදුන්වහන්සේට මම නමස්කාර කරමි;
ඒ සියලුදෙනා වහන්සේලාගේම සරණ යමි.

➢

බෝධිසත්වයන් විශාල සංඛ්‍යාවක් පිරිවරා ගත්
අශෝකෝත්තම තථාගත අරහත් සම්‍යක්
සම්බුදුන්වහන්සේට නමස්කාර කරමි, ඒ
සියලු දෙනා වහන්සේලාගේ ම සරණ යමි.

➢

බෝධිසත්වයන් විශාල සංඛ්‍යාවක් පිරිවරා ගත්
ධර්ම කීර්ති-සාගර ඝෝෂ තථාගත අරහත්
සම්‍යක් සම්බුදුන්වහන්සේට නමස්කාර කරමි;
ඒ සියලු දෙනා වහන්සේලාම සරණ යමි.

➢

බෝසත්වරුන් අසංඛ්‍ය සංඛ්‍යාවක් පිරිවරා ගත්
ධර්මසාගර-වරමති-වික්‍රීඩිතාභිඥ-රාජ
තථාගත අරහත් සම්‍යක් සම්බුද්ධයන් වහන්සේට
මම නමස්කාර කරමි; ඒ සියලුදෙනාම සරණ යමි.

➢

සූර්ය ප්‍රභ, චන්ද්‍රභ ඇතුළු බෝසත්වරුන් අසංඛ්‍ය සංඛ්‍යාවක් පිරිවරා ගත්,
භෛෂජ්‍යගුරු-වෛඩූර්ය-ප්‍රභ-රාජ තථාගත අරහත් සම්‍යක් සම්බුද්ධයන් වහන්සේට
මම නමස්කාර කරමි; ඒ සියලුදෙනා වහන්සේලාම සරණ යමි.

➢

භෛෂජ්‍ය ගුරු-වෛඩූර්ය-ප්‍රභ-රාජ තථාගතයන් වහන්සේගේ ශුද්ධ වූ කයට මම නමස්කාර කරමි;
උන්වහන්සේගේ ශරීරය වෛඩූර්ය මාණික්‍යයක වැනි නිල් පැහැයෙන් යුතුය.

උන්වහන්සේගේ මහා පුරුෂ ලක්ෂණ හා ව්‍යංජන හෙවත් මගුල් ලකුණු නැමති හිරුගෙන් විහිදී යන රශ්මි ධාරා විහිදීමෙන් ආලෝකමත් වන ආකාස ප්‍රදේශය
සියලු දෙනාටම ශාන්ත භාවයට හා සතුටට ඇති අවකාශය අනාවරණය කරන්නේ ය.

➢

භෛෂජ්‍යගුරු-වෛඩූර්යප්‍රභ-රාජ තථාගතයන් වහන්සේගේ ශුද්ධ වූ වචනයට මම නමස්කාර කරමිඃ
උන්වහන්සේගේ වචනය ගාන්ධර්ව වීණා දහසක හඬ හා සමාන වන්නේ ය.
සූත්‍ර සාගරයෙන් මතුවන ධනය, එහි මිහිරි හඬින් නානා ශ්‍රාවකයන්ගේ මනස්
මුළුමනින්ම සුවපත් කරවන්නේ ය.

➢

භෛෂජ්‍යගුරු - වෛඩූර්යප්‍රභ-රාජ තථාගතයන් වහන්සේගේ ශුද්ධ වූ මනසට මම නමස්කාර කරමිඃ එම ශුද්ධ වූ මනස ඥාන සාගරයකි; අවිශේෂී මහා කරුණා තරංග වලින් කැළඹී ඇති එම සාගරය, ස්වයං-සිද්ධ ලෙස ප්‍රණිධාන සාගරයක් මුදුන්පත් කරන්නකි.

➢

මම භෛෂජ්‍යගුරු-වෛඩූර්ය ප්‍රභ-රාජ තථාගතයන් වහන්සේගේ ශුද්ධ වූ කය, වචනය හා මනස සරණ යමි.

මම තථාගත අරහත් සම්‍යක් සම්බුද්ධ ශාක්‍යමුනි තථාගතයන් වහන්සේටද, තිස් හය දහසක් පිරිවර බෝසතුන් වහන්සේලාට ද නමස්කාර කරමි. ඒ සියලු දෙනා වහන්සේලා ගේ සරණ යමි.

මම, අවිදු අඳුර දුරලන පරම ප්‍රදීපය වූ ද, දුක්ඛ රෝගය සුව කරන මහගු ඔසුව වූ ද සමස්ත ආර්ය ධර්ම රත්නයට වන්දනා කරමි. දහම් සරණ යමි.

මම ආර්ය මංජු ශ්‍රී, ත්‍රාණමුක්ත, වජ්‍රපාණී යනාදී බෝධිසත්ව මහා සත්වයන්ට නමස්කාර කරමි; උනවහන්සේලා සරණ යමි.

මම බ්‍රහ්ම, ඉන්ද්‍ර, සතර වරම් රජදරුවන් යනාදීන් ඇතුළු ආර්ය ධර්මය ආරක්‍ෂා කරන්නන්ට නමස්කාර කරමි; ඒ අය සරණ යමි.

මම කුම්භීර හා අනෙක් මහා යක්‍ෂ සේනාධිපති වරයන් අට දෙනාට නමස්කාර කරමි. ඒ අය සරණ යමි.

එකී සියලුම ආර්යයන් වහන්සේලාට මම පානීය ජලය ද, ආලේපද, මල් ද, සුවඳ දුම් ද, පහන් ද, ආහාර ද, සංගීතය හා තාලවාද්‍යයන් (තාලම්පටවල්) ද, උඩුවියන් ද, කොඩි යනාදිය ද පුද කරමි. ඒ සියල්ලම සැබවින්ම පුද කරනු ලබන ද්‍රව්‍යයන් ය. දස දිසාවන්හිම අයිතිකරුවකු නොමැතිව පවතින, දෙවි මිනිසුන්ගේ යහපත් ධනයද, සතුට ලබා ගැනීම සඳහා අවශ්‍ය වන සෑම උත්කෘෂ්ට ද්‍රව්‍යයන්මද පුද කරමි. යන්ත්‍ර මන්ත්‍ර බලයෙන් හා භක්තියෙන් ජනනය කරන ලද්දා වූ, සමන්තභද්‍රයන්ගේ ශුභ ප්‍රාර්ථනා බලයෙන් මුළු අවකාශයම පිරී යන පරිද්දෙන් පූජා වලාවන් පුද කරමි.

අනාදිමත් කාලයක් තිස්සේ සසර සැරි සරද්දී, අප ඍණාත්මක අකුශල ක්‍රියා බොහෝ ගණනක් කරන්නට ඇත. කොටින් කිවහොත්, නොකළ යුතු දෑ අප කර ඇත; කළ යුතු දේ නොකර ඇත. ඒ වැරදි කවරක් වුවත්, ඒ සියල්ලම මම පාපොච්චාරණය කරමි.

තුන් කල්හිම, සියලු ආර්යයන් හා සමාන්‍ය මිනිසුන් විසින් කරන ලද පින් හා කුශල මූලයන් පිළිබඳව මම සතුටු වෙමි.

අද්විතීය වූ ධර්මචක්‍රය ප්‍රවර්තනය කරන ලෙස, මම සියලු ජිනවරයන් වහන්සේලා උනන්දු කරවමි.
නිවනට පිවිසීම නිරූපණය කිරීමට තීරණය කළ ලෝක ප්‍රදීප (උත්තම) යන්ගෙන් මා ඉල්ලා සිටින්නේ, ලෝකයාගේ හිත සුව පිණිස බොහෝ කාලයක් රැඳී සිටින ලෙසයි .

මා රැස් කළ යම් කුශලයක් වේ නම්, එය මා හට මෙන්ම අනෙක් අයටද අද්විතීය ධර්ම ප්‍රත්‍යක්‍ෂය ලබා ගැනීමට උපකාරයක් වේවා!
මෙම සභාවේ වැඩ සිටින සියලුම භාග්‍යවතුන් වහන්සේලා මා කෙරේ කරුණාවෙන් මා වෙත අවධානය යොමු කරන සේක් වා! මහා කාරුණික භාග්‍යවතුන් වහන්සේලාණෙනි, විශේෂයෙන් ධර්මය පිරිහී යන්නා වූද, ඒ වෙනුවට නොයෙකුත් ව්‍යාජ ධර්මයන් පැන නගින්නා වූද මෙම අවසන් වසර පන්සියය තුළ, කර්ම බාධකයන් තුළ සිර වී සිටින්නා වූද, නානා රෝගයන්ගෙන් පෙළෙන්නා වූ ද අවාසනාවන්ත ජීවී සත්වයන් රැකබලා ගනු මැනවි! දෙවි මිනිසුන්ගේ හිතසුව පිණිස, සත් බුදුන්වහන්සේලා විසින් පෙර යොදා ගන්නා ලද උපාය කෞශල්‍ය මාර්ගයන්ද, බල ගැන් වූ විශේෂිත ආයාචනයන් ද ඇත්තේ ය. ශාක්‍ය මුනි බුදුන්වහන්සේ

විසින් එය නිවැරැදිව උගන්වා බලගන්වා ඇත. ආර්ය මංජු ශ්‍රී, ත්‍රාණමුක්ත, වජ්‍රපාණි යනාදී බෝධිසත්ව මහාසත්වවරුන් විසින්, භාග්‍යවතුන් වහන්සේගේ උපදෙස් මුදුන්පත් කිරීම සඳහා ද තම පෞද්ගලික අපේක්ෂාවන් සාර්ථක කර ගැනීම සඳහා ද සූත්‍රයේ අරමුණ ඉටුවන ආකාරයේ දිව්‍යමය කාර්යයන් කරන ලද්දේ ය. ආර්යයන් වහන්සේලාගේ කියමන පරීක්ෂා කළ ඔවුහු එය භාරගෙන සුදුසු ලෙස බල ගැන්වූහ. බ්‍රහ්මයාද, දෙවියන්ගේ ප්‍රධානියා වූ ඉන්ද්‍රයාද, සතරවරම් රජ දරුවෝද, ද්වාදශ යක්ෂ සෙන්පතීහුද, සියලු ගිහි ධර්මාරක්ෂකයෝ ද, මෙම සූත්‍රය ආරක්ෂා කිරීමටත්, සූත්‍රය ආරක්ෂා කරන පුද්ගලයන් ආරක්ෂා කිරීමටත් සභාව ඉදිරියේ නියම ලෙස පොරොන්දු දුන්හ.

ආර්යයන් වහන්සේලා විසින් බලගැන් වුණු හා උගන්වන ලද එම සූත්‍රයෙහි ඇති ආකාරයට, එම ආර්යයන් වහන්සේලාට හා ආර්ය පුත්‍රයන්ට රැස්වීම සඳහා මාළිගා මණ්ඩලයක් සූදානම් කෙළෙමු. අපගේ උපරිම හැකියාව අනුව පූජා භාණ්ඩ එක්රැස් කර ගැනීමෙන් පසුව, ඒ අයගේ නම් ප්‍රකාශ කොට දාන වස්තූන් ප්‍රදානය කෙළෙමු. අපට ඔබ වහන්සේලාගේ ආශිර්වාදය ලැබේ නම්, සූත්‍රයේ උගන්වා ඇති ආකාරයට පූජා කර්මය කර අවසන් වූ විට, අපට ද, ඊට අනුග්‍රහය දක් වූ සියලු දෙනාටද යෝජනා කරන ලද ප්‍රතිලාභ ලැබේවා!

භාග්‍යවතුන් වහන්සේලා සහිත මුළු සභාවෙන්ම මා කරුණාවෙන් ඉල්ලා සිටින්නේ මා වෙත අවධානය යොමු කරන ලෙස ය. ඔබ වහන්සේලාට සර්වදර්ශී ප්‍රඥාව, මහා කරුණාව හා කෘත්‍යානුෂ්ඨාන ඥානය ඇති බැවින් ද, ඔබ වහන්සේලාට අප ආරක්ෂා කළ හැකි අද්විතීය බලයක් ඇති බැවින්ද, අප ඉල්ලා සිටින්නේ පහත සඳහන් දේ ඉටු කර දෙන ලෙස යඃ සතුටේ හා යහපත් බවේ මූලාශ්‍රය වූ බුද්ධ ධර්මය බැබලේවා! එය ආරක්ෂා කරන ආර්ය පුද්ගලයන්ට නිරෝගී බව හා දීර්ඝායුෂ ලැබේ වා! ආර්යයන් වහන්සේලාගේ සද්ගුණවත් ක්‍රියාකාරිත්වයන් දස දිසාවන්හි ම පැතිර යාවා! සමස්ත සංඝයාගේ ධර්ම ප්‍රාගුණ්‍ය දසය පරිපූර්ණ වූ විට එහි බලයෙන්ම ඒවා පැතිර, යාවා! සියලුම ජීවී සත්වයන්ට සතුට හා සුවසෙත සැලසේ වා! විශේෂයෙන් අනුග්‍රාහකයන් ප්‍රධාන සියලු ජීවී සත්වයන්ට, දෙයාකාර බාධකයන් ඉවත් කොට දෙයාකාර සංචිතයන් සම්පූර් කොට ඉක්මනින්ම බුද්ධ බෝධිය සාක්ෂාත් කිරීමට හැකි වේ වා!

## <u>බුද්ධ වන්දනා හා ආයාචනා</u>

# සුපරිකීර්තික-නාම-ශ්‍රී-රාජ භාග්‍යවතුන් වහන්සේ

අපි සුපරිකීර්තිත නාම ශ්‍රී රාජ භාග්‍යවතුන් වහන්සේට නමස්කාර කරමු. අපි ඔබ වහන්සේ සරණ යමු! (7වරක්)

එකී සියලුම ආර්යයන්වහන්සේලාට මම, පානීය ජලය, ආලේප, මල්, සුවඳදුම්, පහන්, ආහාර, තාල වාද්‍යයන්, උඩු වියන් යනාදිය ද පුද කරමි. ඒ සියල්ලම සැබවින්ම පුද කෙරෙන ද්‍රව්‍යයන් ය. දස දිසාවන්හිම අයිතිකරුවකු නොමැතිව පවතින, දෙව් මිනිසුන්ගේ යහපත් ධනයද, සතුට ලබා ගැනීම සඳහා අවශ්‍ය වන සෑම උත්කෘෂ්ට ද්‍රව්‍යද භක්තියෙන් ජනනය කරන ලද්දා වූ සමන්තභද්‍රයන්ගේ ශුභ ප්‍රාර්ථනා බලයෙන්, මුළු අවකාශයම පිරී යන පරිදි පූජා වලාවන් පුද කරමි.

අනාදිමත් කාලයක් තිස්සේ සසර සැරි සරද්දී අප විසින් ඍණාත්මක අකුශල ක්‍රියා බොහෝ ගණනක් කරන්නට ඇත. කොටින් කිවහොත්, අප කර ඇත්තේ නොකළ යුතු දෑය. කළයුතු දේ නොකර ඇත. ඒ වැරදි කවරක් වුවත් ඒ සියල්ලම මම පාපොච්චාරණය කරමි.

තුන් කල්හිම, සියලු ආර්යයන් හා සාමාන්‍ය මිනිසුන් විසින් කරන ලද පින් හා කුශල මූලයන් පිළිබඳව මම සතුටු වෙමි.

අද්විතීය වූ ධර්ම චක්‍රය ප්‍රවර්තනය කරන ලෙස මම සියලු ජිනවරයන් වහන්සේලා උනන්දු කරවමි.

නිවනට පිවිසීමට තීරණය කළ ලෝක ප්‍රදීප (උත්තම) යන්ගෙන් මා ඉල්ලා සිටින්නේ, ලෝකයාගේ හිත සුව පිණිස බෝහෝ කලක් රැඳී සිටින ලෙස යි.

මා කළ යම් වූ හෝ කුසලයක් වේ නම්, එය මා හට මෙන්ම අනෙක් අයටද අද්විතීය ධර්ම ප්‍රත්‍යක්‍ෂය ලබා ගැනීමට උපකාරී වේවා!
අද දින, ජිනවරයන් හා ජින පුත්‍රයන් සමූහය ඉදිරියේ සුපරිකීර්තිත නාම ශ්‍රී රාජ තථාගතයන්ගේ නාමය සත් වරක් කියා උන්වහන්සේට වන්දනාමාන ආදිය කෙළෙමු.

එම ආයාචනයන්ගේ බලයෙන්, සුපරිකීර්තිත නාම ශ්‍රී රාජ තථාගතයන්ගේ පූර්ව ප්‍රාර්ථනාවන් අනුව, අපගේ හා සියලු ජීවී සත්වයන්ගේ ශරීර අසනීපවලින් පෙළේ නම්, ඔවුන් බෝවෙන රෝගවලින් පෙළේ නම්, මිනීමරුවන්ගෙන්, සතුරන්ගෙන්, සාපයන්ගෙන්, යක්‍ෂාවේශයන්ගෙන් පෙළේ නම්, ඒ සියලු කරදර වහා සමනය වේවා! අප බුද්ධත්වයට පත් වන තුරුම අපට බෝ වන රෝග නො වැළඳේවා! ඒවා සම්පූර්ණයෙන්ම සංසිඳී යාවා! අප බුද්ධ බෝධියට පත්වන තුරුම, අපගෙන් අඳ, ගොළු, බිහිරි, බිවින් හෝ ලාදුරු ආදියෙන් පෙළෙන අය ඇත්නම් අපගේ ඉන්ද්‍රියයන් සම්පූර්ණ බවට පත් වේවා, අපගේ දුක් හා අසනීප සමනය වේ වා!

මට හා අනෙකුත් ජීවී සත්වයන් අතුරින් යමෙකුට රාග, ද්වේශ, මෝහයන්ගෙන් පෙළෙන්නනට සිදු වී ඇත්නම්, අප අතරින් යමකු පංචානන්තර්ය කර්මයන් කර ඇත්නම්, නොකළ යුතු දේ කර ඇත්නම්, ආර්ය ධර්මය අතහැර ඇත්නම්, නොයක් පාපී අකුශල කර්ම කර ඇත්නම්, ත්‍රිවිධ දුක්ඛිත භූමීන්ට යාමට නියම වී ඇත්නම්, අපා දුක් විඳීන්නට සිදු වී ඇත්නම්, සියලු පංච පාපකර්මයන්ට වහ වහා විපාක ලැබී අවසන් වේවා! අනුත්තර සම්බෝධි තත්ත්වයට අවදි වන තුරුම අපායයයන්ට හා වෙනත් අභව්‍ය ස්ථානවල උපදින්නට අපට සිදු නොවේ වා! දෙව් මිනිස් ලොව සතුට පමණක් අත් දකින්නට ලැබේ වා!

දුගී බවට පත්ව කෑම, බීම, ඇඳුම්, ධනය, ධාන්‍ය, ඉඳුම් හිටුම්, සුවඳ, මාලා හා ජීවිතයට අවශ්‍ය වෙනත් දේ නොමැති අපට හා අනෙකුත් සියලුම ජීවී සත්වයන්ට, ප්‍රබුද්ධ තත්ත්වයට පත් වන තුරුම ධනයද, ධාන්‍යද, ඇඳුම් පැළඳුම් ද, ඉඳුම් හිටුම් ද, සුවඳ මාලා හා ජීවිතයට අවශ්‍ය වෙනත් දෑ ද අඩුවක් නැතිව ලැබේවා!

බන්ධනයට අසුව සිරපත්ව පහර කෑම් ලබන, නොයෙක් ආයුධවලින් පහර ලැබ ශරීර විකෘත වී ඇති අපට හා අනෙකුත් සියලු ජීවී සත්වයන්ට, ප්‍රබුද්ධ භාවය ලබන තුරුම එම සියලු බන්ධනවල් හා ප්‍රහාරවලින් සම්පූර්ණ නිදහස ලැබේවා! ශාරීරික වධහිංසා නවතීවා!

ආරක්ෂකයන් නොමැති, ගින්නෙන් ශරීර දැවෙන අලි, කොටි, වලස්, හයිනා හා සර්ප ආදීන්ට අසු වී ජීවිතයට පවා අවදානමක් ඇති වූ අවස්ථාවල දී, අප ප්‍රබුද්ධභාවයට පත් වන තුරුම, ඒ සියලු දුක් කම්කටොලු පහ වී යේ වා! අලි, කොටි, වලස්, හයිනා හා සර්පයෝ පවා කරදර නොකර ශුභවාදීව හැසිරෙත්වා! බියෙන් තොර ශාන්ත පරිසරයක වසන්නට ලැබේවා!

බිය නිසා එකිනෙකා අතර දබර ඇති කර ගන්නා අපගේ හා අනෙකුත් සියලු ජීවී සත්වයන්ගේ සටන් හා ගහ බැණ ගැනීම්, අප ප්‍රබුද්ධ තත්ත්වයට පත් වන තුරුම නතර වී යාවා! එකිනෙකා කෙරේ ආදරයෙන් ජීවත් වන්නට අපට හැකි වේ වා!

ඔරුවලින් ජලය මත ගමන් ගන්නා විට දූපත් නොමැති ස්ථානවලට පැමිණි විට ජීවිතාශාව අතහැර හඬ ගාන්නට සිදුවන තත්ත්වයක් අප හා අනෙක් ජීවී සත්වයන් නිවන් දක්නා ජාති දක්වාම උදා නොවේවා! අපට නිර්භයව ජලය තරණය කරන්නට හැකි වේවා!

අප මියගොස් මේ ජීවිතයෙන් වෙනස් වූ විට, සුපරි කීර්තිත-නාම-ශ්‍රී-රාජ තථාගතයන් වහන්සේගේ බුද්ධක්ෂේත්‍රයේ නෙළුමක් තුළ ඇති සිංහාසනයක් මත අප ඕපපාතිකව පහළ වේවා! එහි පහළ වූ වහාම, නිවැරදි මතකය හා භාවනාමය ඒකාග්‍රතාව වැනි සද්ගුණයන් පහළ වී සුපරිකීර්තිත-නාම-ශ්‍රී-රාජ භාග්‍යවතුන් වහන්සේගෙන් හා දසදිසාවන්හිම වෙසෙන අනෙකුත් බුදුවරුන්ගෙන් උපදෙස් ලැබීමට හැකි වේවා! ක්ෂණිකව බාධා විරහිතව සියලු බුද්ධක්ෂේත්‍රයන්ට ඇතුල් වීමට ද හැකි වේ වා!

අතීතයේ දී භාග්‍යවත් සුපරිකීර්තිත-නාම-ශ්‍රී-රාජ තථාගතයන් වහන්සේ ප්‍රණිධාන ප්‍රාර්ථනාවන් අටක් කළහ.
උන්වහන්සේගේ අසීමිත ඥානයෙන්, ආදරයෙන් හා බලයෙන් බල ගැන්වුණු ආශිර්වාදයෙන් මට ද අනෙක් සියලු ජීවී සත්වයන්ටද එහි ඵල අද මෙහි දී වින්දනය කරන්නට ලැබේවා!
මුනි උතුමාණන්ගේ ධර්මය පැතිරී යාවා!
ජීවී සත්වයෝ සතුටු වෙත්වා, සුවපත් වෙත්වා!
විශේෂයෙන්ම, අනුග්‍රාහකයන් ද සහිතව සසර සැරිසරන ජීවී සත්වයෝ, දෙයාකාර කිලිටිවීම් වලින් මිදී පිරිසිදු වෙත්වා, දෙයාකාර, සංචිතයන් පරිපූර්ණත්වයට පත් කරත්වා!
මහා අවදි බව ඉක්මනින් ලබා ගැනීම සඳහා අපට ආශිර්වාද කරනු මැනවි!

# රත්න-චන්ද්‍ර-පද්ම-ප්‍රතිමණ්ඩිත-පණ්ඩිත-තේජඃ -ස්වර-ඝෝෂ-රාජ තථාගතයන් වහන්සේ

අපි, රත්න-චන්ද්‍ර-පද්ම-ප්‍රතිමණ්ඩිත-පණ්ඩිත-තේජඃ -ස්වර-ඝෝෂ-රාජ තථාගතයන් වහන්සේට නමස්කාර කරමු; අපි ඔබ වහන්සේගේ සරණ යමු. (7 වරක් කියන්න)

එකී සියලුම ආර්යයන්වහන්සේලාට මම, පානීය ජලය, ආලේප, මල්, සවඳ දුම්, පහන්, ආහාර, තාලවාද්‍යයන්, උඩුවියන් යනාදිය ද පුද කරමි. ඒ සියල්ලම සැබවින් පුද කෙරෙන ද්‍රව්‍යයන් ය. දස දිසාවන්හිම, අයිතිකරුවකු නොමැතිව පවතින, දෙව් මිනිසුන්ගේ යහපත් ධනයද, සතුට ලබා ගැනීම සඳහා අවශ්‍ය වන සෑම උත්කෘෂ්ට ද්‍රව්‍යයන් ම ද, පුද කරමි. යන්ත්‍ර මන්ත්‍ර බලයෙන් හා ශක්තියෙන් ජනනය කරන ලද්දා වූ සමන්ත්‍රභද්‍රයන්ගේ ශුභ ප්‍රාර්ථනා බලයෙන්, මුළු ආකාශයම පිරී යන පරිදි පූජා වලාවන් පුද කරමි.

අනාදිමත් කාලයක් තිස්සේ සසර සැරි සරද්දී අප විසින් ඍණාත්මක අකුශල ක්‍රියා බොහෝ ගණනක් කරනු ලැබ ඇත. කොටින් කිවහොත්, අප කර ඇත්තේ නොකළ යුතු දෑ ය. කළ යුතු දේ නොකර ඇත. ඒ වැරදි කවරක් වුවත් ඒ සියල්ලම මම පාපොච්චාරණය කරමි.
තුන් කල්හිම, සියලු ආර්යයන් හා සාමාන්‍ය මිනිසුන් විසින් කරන ලද පින් හා කුශල මූලයන් පිළිබඳව මම සතුටු වෙමි.

අද්විතීය වූ ධර්ම චක්‍රය ප්‍රවර්තනය කරන ලෙස මම සියලු ජිනවරයන් වහන්සේලා උනන්දු කරවමි.

නිවනට පිවිසීමට තීරණය කළ ලෝක ප්‍රදීප (උත්තම) යන් වහන්සේලාගෙන් මා ඉල්ලා සිටින්නේ ලෝකයාගේ හිතසුව පිණිස බොහෝ කාලයක් රැඳී සිටින ලෙස ය.
මා කළ යම් වූ හෝ කුසලයක් වේ නම්, එය මා හට මෙන්ම අනෙක් අයට ද අද්විතීය ධර්ම ප්‍රත්‍යක්‍ෂය ලබා ගැනීමට හේතුවක් වේවා!

අද දින ජිනවරයන් හා ජින පුත්‍රයන් ඉදිරියේ රත්න-චන්ද්‍ර-ප්‍රතිමණ්ඩිත-පණ්ඩිත-තේජඃ-ස්වර-ඝෝෂ-රාජ භාග්‍යවතුන් වහන්සේගේ පූර්ව විශේෂ ආයාචනයන්ට අනුකූලව, ගොවිබිම් කුලියට දීමෙන් හා ව්‍යාපාර වලින් සතුටු වන අපට හා අනෙකුත් සියලු ජීවී සත්වයන්ට සද්ගුණවත් කාර්යයන්හි යෙදීම, පරම සම්බෝධිය හා බෝධි චිත්තය පිළිබඳ අවධානය අහිමි වී ගොස් ඇති නිසා සසර සැරි සරමින් නොයෙක් සංසාර දුක්ඛයන් අත් විඳීමට සිදු වී ඇත. නොයෙක් ආකාරයෙන් වයසට යාම, අසනීප, මරණය, දුක, වේදනාව, විෂාදය ආදිය විඳින්නට සිදුව ඇත. අප අද්විතීය අවදිබව පවතින බුද්ධ බෝධියට පත්වන තුරුම අපට කෑම, බීම, ධන ධාන්‍ය, වස්තුව, නිදන් රත්රන් ආදිය සහිත පූර්ණ සෞභාග්‍යයක් අත් දකින්නට ලැබේවා! ගුණවත් හැසිරීම හරහා අප සුපුෂ්පිත වේවා! බෝධි චිත්තය පිළිබඳ අවධානය අහිමි නොවේවා! දුක්බර අභව්‍ය උත්පත්තීන්ගෙන් අපා දුක්වලින් සම්පූර්ණයෙන් නිදහස් වීමට අපට හැකි වේවා!

කුසගින්නෙන්, පිපාසයෙන්, උෂ්ණයෙන් හා සීතලෙන් මිරිකුණා වූ ද, දුබ සංවේදනයන්ගෙන් මුසපත් වූ ද අපගේ හා අනෙකුත් සියලු ජීවී සත්වයන් ගේ සිරුරු පූර්ව කර්ම බාධකයන්ගෙන් සම්පූර්ණයෙන්ම ඉවත් ව පිරිසිදු වේවා! අප අනුත්තර සම්බෝධියට අවදි වන තුරුම අප උත්පත්තියේ දුකෙන් නිදහස් වේවා! අපට දෙවි මිනිසුන්ගේ සතුට අත්දකින්නට ලැබේවා!

නා නා අසනීපයන්ගෙන් පෙළෙන ස්ත්‍රීහු සිය ගර්භාශයන්ට නිග්‍රහ කරත්වා! උත්පත්තියේ වේදනාවෙන් පෙළෙන සියලු ජීවී සත්වයන්ගේ දුක් පහ වී යාවා! එය ඔවුන්ගේ අවසාන උත්පත්තිය වේවා! ප්‍රබුද්ධ භාවයට පත් වන තුරුම ඔවුන්ට පිරිමින් ලෙස සිටින්නට ලැබේවා!

මරණයේ, සතුරන්ගේ හා තනිකමේ උවදුරු වලින් දුකට පත් වූ ද, දෙමාපියන්, සොයුරියන්, මිතුරන් හා නෑදෑයන් නිසා දුකට පත් වූ ද, ඉවසිය නොහැකි වේදනාවෙන් පෙළෙන සිරුරු ඇත්තා වූ ද අපගේ හා අනෙකුත් සියලුම ජීවී සත්වයන්ගේ ද, මරණ බිය, සතුරු බිය හා තනිවීමේ බිය සම්පූර්ණයෙන්ම දුරු වී යේවා! අප ප්‍රබුද්ධ බවට පත් වන තුරුම එම දුක් වේදනාවන් දුරු වී යා වා!

රාත්‍රී අඳුරේ එහා මෙහා යමින් නොයෙක් කාර්යයන්හි යෙදෙන අපට හා අනෙකුත් ජීවී සත්වයන්ට නොයෙක් යක්‍ෂ භූතයන් නිසා කරදර වන්නට සිදු ව ඇති බැවින්, අප බුද්ධ බෝධියට පත් වන තුරාම එම ගනඳුර අහෝසි වී යාවා! සියලුම යක්‍ෂ උපද්‍රවවලින් අපට නිදහස ලැබේවා! දන්දීමට හා අනෙකුත් වන්දනාමාන ක්‍රියා කිරීමට උනන්දුවක් අප තුළ ඇති වේවා!

පහත් දේ අගය කරන අපට හා සියලු ජීවී සත්වයන්ට ඇත්තේ දුර්වල බුද්ධියක් හා මතකයකි. සද්ගුණවත් හැසිරීම් රටාවෙන්ද, බලය ලබා ගැනීමේ ක්‍රම, දහමට අවදිවීම සම්බන්ධ කරුණු, භාවනාමය ඒකාග්‍රතාව, නිවැරදි මතකය, බුද්ධ, ධම්ම, සංඝ යන කරුණුවලින් අප සම්පූර්ණයෙන්ම ඉවත්ව ගොස් ඇත. අප ධර්ම ප්‍රත්‍යක්‍ෂය ලබන තුරුම, අපට භාවනාමය ඒකාග්‍රතාව, බලයන්, පරිපූර්ණ මතකය හා බෝධිපාක්ෂික ධර්ම යන සියල්ලම සමග සම්බන්ධ වීමට අපට හැකි වේවා! මහා ප්‍රඥාව වෙතට ගමන් ගන්නට අපට ලැබේවා!

පහත් දේ අගය කරමින්, ශ්‍රාවක යානය හා පච්චේක-බුද්ධ යානය වෙත නැඹුරු වෙමින්, අද්විතීය වූ ද, සත්‍ය වූ ද පරිපූර්ණ අවදි බවට පසු පස හරවන අපට හා සියලු ජීවී සත්වයන්ට, අද්විතීය, සත්‍ය පරිපූර්ණ අවදි බවෙන් ඉවත්ව සිටීමට සිදු නොවේ වා! ශ්‍රාවක, පසේ බුදු මට්ටම්වලින් ඔබ්බට යාමට අපට හැකිවේ වා!

අපගේ අවධානය බෝධි චිත්තය වෙතම රැඳේවා!
මෙම මහා කල්පය අවසානයේ දී මෙම ජම්බුද්වීපය බියකරු ලෙස පිළිස්සෙන, දැවෙන විට, අපට හා අනෙක් සියලු ජීවී සත්වයන්ට, පෙර කළ කර්ම නිසා අසරණව හඬන්නට, දුක්වන්නට සිදු නොවේ වා! අප සියලුදෙනාට සිසිල් සෙවනක් ලැබේවා! මිය ගිය පසුව, අප රත්න-චන්ද්‍ර-පද්ම-ප්‍රතිමණ්ඩිත-පණ්ඩිත-තේජඃ-ස්වර-ඝෝෂ-රාජ භාග්‍යවතුන් වහන්සේගේ පවිත්‍ර බුද්ධ ක්ෂේත්‍රයේ සිංහාසනයක් මත වූ නෙළුමක් තුළ ඕපපාතිකව උපදින්නට ලැබේවා! අප එහි උපන් වහාම, නිවැරදි මතකය හා භාවනාමය ඒකාග්‍රතාව වැනි සද්ගුණයන් පහළ වී, රත්න-චන්ද්‍ර-පද්ම-ප්‍රතිමණ්ඩිත-පණ්ඩිත-තේජඃ-ස්වර-ඝෝෂ-රාජ භාග්‍යවතුන්

වහන්සේගෙන් හා දස දිසාවන්හිම වෙසෙන අනෙකුත් භාග්‍යවතුන් වහන්සේලාගෙන් උපදෙස් ලැබීමට අපට හැකි වේවා! ක්ෂණිකව, බාධා විරහිතව සියලු බුද්ධ ක්ෂේත්‍රයන්ට ඇතුල් වීමට ද හැකි වේවා!

අතීතයේ දී භාග්‍යවත් රත්න-චන්ද්‍ර-පද්ම-ප්‍රතිමණ්ඩිත-පණ්ඩිත-තේජඃ-ස්වර-ඝෝෂ-රාජ බුදුරජාණන් වහන්සේ ප්‍රණිධාන ප්‍රාර්ථනාවන් අටක් සිදු කළාහු ය.
උන්වහන්සේගේ අසීමිත ඥානයෙන්, ආදරයෙන් හා බලයෙන් බලගැන්වුණු ආශිර්වාදයෙන්, මට ද අනෙක් සියලු ජීවී සත්වයන්ට ද එහි ඵල අද මෙහි දී විඳින්නට ලැබේ වා! මුනි උතුමාණන්ගේ ධර්මය පැතිරී යා වා! ජීවී සත්වයෝ සතුටු වෙත්වා, සුවපත් වෙත් වා!
විශේෂයෙන්ම, අනුග්‍රාහකයන්ද සහිතව සසර සැරිසරන ජීවී සත්වයෝ දෙයාකාර කිලුටුවීම්වලින් පිරිසිදු වෙත්වා!
දෙයාකාර සංචිතයන් පරිපූර්ණත්වයට පත් කරත්වා!
මහා අවදි බව ඉක්මනින්ම ලබා ගැනීම සඳහා අපට ආශිර්වාද කරන සේක් වා!

## සුවර්ණ - භද්‍ර - විමල - රත්න - ප්‍රභාස - ව්‍රත භාග්‍යවතුන් වහන්සේ

අපි, සුවර්ණ-භද්‍ර-විමල-රත්න-ප්‍රභාස-ව්‍රත භාග්‍යවතුන් වහන්සේට නමස්කාර කරමු. අපි ඔබ වහන්සේ සරණ යමු. (7 වරක් කියන්න)

එකී සියලුම ආර්යයන් වහන්සේලාට මම පානීය ජලය, ආලේප, මල්, සුවඳ දුම්, පහන්, ආහාර, තාලවාද්‍යයන්, උඩුවියන් යනාදියද පුද කරමි. ඒ සියල්ලම සැබවින්ම පුද කෙරෙන සැබෑ ද්‍රව්‍යයන් ය. අයිතිකරුවකු නොමැතිව, දස දිසාවන්හිම පවතින දෙව් මිනිසුන්ගේ යහපත් ධනය ද, සතුට ලබා ගැනීම සඳහා අවශ්‍ය වන සෑම උත්කෘෂ්ට ද්‍රව්‍යයක්ම ද පුද කරමි. යන්ත්‍ර මන්ත්‍ර බලයෙන් හා භක්තියෙන් ජනනය කරන ලද්දා වූ සමන්තභද්‍රයන්ගේ ශුභ ප්‍රාර්ථනා බලයෙන්, මුළු අවකාශයම පිරී යන පරිදි පූජා වලාවන් පුද කරමි.

අනාදිමත් කාලයක් තිස්සේ සසර සැරිසරද්දී අප විසින් ඍණාත්මක අකුශල ක්‍රියා බොහෝ ගණනක් කරන්නට ඇත. කොටින් කිවහොත්, අප කර ඇත්තේ නොකළ යුතු දෑ ය. කළ යුතු දේ නොකර ඇත. ඒ වැරදි කවරක් වුවත්, ඒ සියල්ලම මම පාපොච්චාරණය කරමි.

තුන් කල්හිම, සියලු ආර්යයන් වහන්සේලා හා සාමාන්‍ය මිනිසුන් විසින් කරන ලද පින් හා කුශල මූලයන් පිළිබඳව මම සතුටු වෙමි.

අද්විතීය වූ ධර්ම චක්‍රය ප්‍රවර්තනය කරන ලෙස මම සියලු ජිනවරයන් වහන්සේ ලා උනන්දු කරවමි.
නිවනට පිවිසීමට තීරණය කළ ලෝක ප්‍රදීප (උත්තම) යන් වහන්සේලාගෙන් මා ඉල්ලා සිටින්නේ, ලෝකයාගේ හිත සුව පිණිස බොහෝ කලක් රැඳී සිටින ලෙස ය.

මා කළ යම් වූ කුශලයක් වේ නම්, එය මා හට මෙන්ම අනෙක් අයටද අද්විතීය ධර්ම ප්‍රත්‍යක්‍ෂය ලබා ගැනීමට උපකාරී වේවා!

අද දින ජිනවරයන් හා ජින පුත්‍රයන් සමූහය ඉදිරියේ සුවර්ණ-භද්‍ර-විමල-රත්න-ප්‍රභාස-ව්‍රත තථාගතයන්ගේ නාමය සත් වරක් කියා උන්වහන්සේට වන්දනාමාන ආදිය කළෙමු.
එම ආයවනයන්ගේ බලයෙන්, ස්වර්ණ-භද්‍ර-විමල-රත්න-ප්‍රභාස-ව්‍රත තථාගතයන් වහන්සේගේ පූර්ව විශේෂ ප්‍රාර්ථනාවන්ට අනුව, ප්‍රාණඝාතය හා වෙනත් නොයෙකුත් පාප කිරීම නිසා ආයුෂ කෙටි වූ හා අසනීපවලින් පෙළෙන්නා වූ ද, ඒ නිසාම දියේ ගිලීම, වස විස කැවීම, ආයුධ, ගින්න හා අසනීප නිසා මිය යන්නට සිදු වන්නා වූ ද, අපගේ හා අනෙකුත් ජීවී සත්වයන්ගේත් කර්ම බාධකයන් සම්පූර්ණයෙන් ඉවත් වී පවිත්‍ර වේවා! අප සියලු දෙනාටම දීර්ඝායුෂ ලැබේවා! අප අසනීපවලින් නිදහස් වේවා! අකලට මිය යාමට අපට ඉඩ නොසැලසේවා!

නොයෙකුත් පාපී අකුශල කර්ම කළා වූ ද, අනුන්ගේ ධනය සොරකම් කිරීම නිසා දුගී බවට පත් වූ ද, ඇඳුම් හිඟකම නිසාත්, කුසගින්න හා පිපාසය නිසාත් දුකට පත් වූ ද අප හා අනෙකුත් ජීවී සත්වයන් ඒ සියලු අකටයුතුකම්වලින් නිදහස් වේවා! නිවන් දක්නා තුරාම අපට පූර්ණ ලෙස බලය හා ධනය ලැබේවා!

........

එකිනෙකා කෙරේ ඊර්ෂ්‍යාව නිසා ගහ මරා ගන්නා අපට හා අනෙකුත් ජීවී සත්වයන්ට, නිවන් දක්නා තුරුම පියවරුන් හා මව්වරුන් සේ එකිනෙකා කෙරේ සෙනේබර ආකල්පයක් ඇතිව ජීවත්වන්නට හැකි වේ වා!

රාග, ද්වේශ, මෝහයන් නිසා විනය ගරුකව හැසිරීමෙන් ඉවත්ව, ශ්‍රද්ධාවන්තයන්ගේ දාන වස්තූන් කොල්ල කෑම නිසා, ත්‍රිවිධ දුක්ඛිත ආත්මභාවයන්ට හා අපායන්ට වැටී දුක් විඳින්නට සිදු වී ඇති අපගේ හා අනෙකුත් ජීවී සත්වයන්ගේ කර්ම ආවරණ සියල්ල ඉවත්ව සේවා! සියලුම ද්විතීයික ව්‍යාකුල හැඟීම්වලින් ද අප නිදහස් වේවා! ධර්ම ප්‍රත්‍යක්‍ෂය ලැබෙන තුරාම අපට සදාචාරසම්පන්න හැසිරීමෙන් යුතුව සිත, කය, වචනය හික්මවාගෙන සිටීමට හැකි වේවා! බෝධිචිත්තය කෙරේම සිත යොමු කරගෙන සිටින්නට හැකි වේවා!

තද්‍යථා/සිද්ධි සිද්ධි සුසිද්ධි මෝචනි/මෝක්ෂ නිමුක්තේ විමුක්තේ/අමලේ විමලේ මංගල්‍යේ/හිරණ්‍ය ගර්භේ/රත්න ගර්භේ/සර්ව අර්ථ සාධනි/පරමාර්ථ සාධනි/මානසේ/මහාමානසේ/අද්භූතේ/ අත්‍යද්භූතේ/ හීතභයේ/සුපර්ණේ/බ්‍රහ්මඝෝෂේ/බ්‍රහ්මධ්‍යුෂිතේ/සර්වඅර්ථේෂු අපරාජිතේ/චතුඃ ෂෂ්ටි බුද්ධකෝටි භාෂිතේ/නමඃ සර්වතථාගතානාං ස් වා හා/

සුවර්ණ-භද්‍ර-විමල-රත්න-ප්‍රභාස-ව්‍රත තථාගතයන් වහන්සේ බෝධි වෘක්‍ෂය යට වැඩ සිටිද්දී, ජීවී සත්වයන් රාග, ද්වේශ, මෝහයන්ගෙන් අන්ධ වීම නිසා, නොයෙකුත් අසනීපවලින් පෙළෙන ආකාරයද, මරණය, සතුරන් හා තනිවීම නිසා හානියට පත්වන ආකාරයද, ඔවුන්ට අපායන්ට වැටී කල්පගණන් දුක් විඳින්නට සිදු වී ඇති ආකාරයද දුටුවාහුය. ඔවුන් එම කර්ම ආවරණයන්ගෙන් ඉවත් කොට බුද්ධ බෝධිය වෙත නගා තැබීම සඳහා උන්වහන්සේ ඉහත දක්වුණු මන්ත්‍රය දේශනා කළහ. එම මන්ත්‍රය සජ්ඣායනා කිරීමේ බලයෙන්, අපගේ හා

අනෙකුත් ජීවී සත්වයන්ගේ අකටයුතු කර්ම-පංච ආනන්තර්ය කර්මයන් පවා ඉවත්ව යා වා! අපගේ සියලු ප්‍රාර්ථනා ඉෂ්ට වේවා!

එසේම අප මිය යන විට, සුවර්ණ-භද්‍ර-විමල-රත්න-ප්‍රභාස-ව්‍රත භාග්‍යවතුන් වහන්සේ තමන්වහන්සේගේ කරුණා ඇස අප කෙරේ යොමු කරත්වා! මිය ගිය පසු අප සුවර්ණ-භද්‍ර-විමල-රත්න-ප්‍රභාස-ව්‍රත බුදුන් වහන්සේගේ පවිත්‍ර බුද්ධක්ෂේත්‍රයේ සිංහාසනයක් මත නෙළුමක් තුළ ඕපපාතිකව පහළ වේවා! අප එහි උපන් වහාම, අප තුළ නිවැරදි මතකය, භාවනාමය ඒකාග්‍රතාව ආදී සියලු සද්ගුණයන් සාක්ෂාත් වේවා! සුවර්ණ-භද්‍ර-විමල-රත්න-ප්‍රභාස-ව්‍රත භාග්‍යවතුන් වහන්සේගේ හා දස දිසාවන්හි වැඩ වෙසෙන අනෙකුත් සියලුම භාග්‍යවතුන් වහන්සේලාගෙන් උපදෙස් ලබා ගැනීමට ද අපට හැකි වේවා! උන්වහන්සේලා සතුටට පත් කරමින්, අපට ක්ෂණිකව, කිසිදු බාධාවකින් තොරව බුද්ධ ක්ෂේත්‍රයන්ට ඇතුල් වීමට ද හැකි වේවා!

අතීතයේ දී සුවර්ණ-භද්‍ර-විමල-රත්න-ප්‍රභාස-ව්‍රත භාග්‍යවතුන් වහන්සේ ප්‍රණිධාන ප්‍රාර්ථනාවන් සතරක් සිදු කළාහු ය.
උන්වහන්සේගේ අසීමිත ඥානයෙන්, මෛත්‍රියෙන් හා බලයෙන් බලගැන්වුණු ආශිර්වාදයෙන් මට හා අනෙකුත් ජීවී සත්වයන්ට ඒවායේ ප්‍රතිඵල අදම, මෙම ස්ථානයේදීම අත්දකින්නට ලැබේවා!
මුනීන්ද්‍රයන්ගේ ඉගැන්වීම මල්පල දරාවා!
සියලු සත්වයෝ සතුටින් සුවයෙන් යුතු වෙත්වා!
විශේෂයෙන්ම, තමන්ට පෙරටුව සිටින අනුග්‍රාහකයන් ද සහිතව සසර සැරි සරන ජීවී සත්වයන්ට, දෙයාකාර කර්ම ආවරණයන් ගෙන් නිදහස් ව දෙයාකාර සංචිතයන් සම්පූර්ණ කිරීමට හැකි වේ වා!
ඉක්මනින් බුද්ධ බෝධිය සාක්ෂාත් කිරීමට හැකිවන පරිදි අපට ආශිර්වාද කරන සේක් වා!

## අශෝකෝත්තම භාග්‍යවතුන් වහන්සේ

අපි අශෝකෝත්තම භාග්‍යවතුන් වහන්සේට නමස්කාර කරමු; උන්වහන්සේ සරණ යමු. (7 වරයි)

එකී සියලුම ආර්යයන් වහන්සේලාට, මම පානීය ජලය, ආලේප, මල්, සුවඳ දුම්, පහන්, ආහාර, තාලවාද්‍යයන්, උඩුවියන් යනාදිය ද පුද කරමි. ඒ සියල්ලම සැබවින්ම පුද කෙරෙන සැබෑ ද්‍රව්‍යයන් ය. දස දිසාවන්හිම, අයිතිකරුවකු නොමැතිව පවතින, දෙව් මිනිසුන්ගේ යහපත් ධනයද, සතුට ලබා ගැනීම සඳහා අවශ්‍ය වන සෑම උත්කෘෂ්ට ද්‍රව්‍යයක්ම ද, පුද කරමි. යන්ත්‍ර මන්ත්‍ර බලයෙන් හා භක්තියෙන් ජනනය කරන ලද්දා වූ සමන්තභද්‍රයන්ගේ ශුභ ප්‍රාර්ථනා බලයෙන්, මුළු ආකාසයම පිරී යන පරිදි පූජා වලාවන්ගෙන් පුරවමි.

අනාදිමත් කාලයක් තිස්සේ සසර සැරි සරද්දී, අප විසින් සෘණාත්මක අකුශල ක්‍රියා බොහෝ ගණනක් කරනු ලැබ ඇත්තේ ය. කොටින් කිවහොත්, අප කර ඇත්තේ නොකළ යුතු දෑ කරමින් කළ යුතු දෑ නොකර හැරීම ය. ඒ වැරදි කවරක් වුවත්, ඒ සියල්ලම මම පාපොච්චාරණය කරමි.

තුන් කල්හිම සියලු ආර්යයන්වහන්සේලා හා සාමාන්‍ය මිනිසුන් විසින් කරන ලද පින් හා කුශල මූලයන් පිළිබඳව මම සතුටු වෙමි.

අද්විතීය වූ ධර්මචක්‍රය ප්‍රවර්තනය කරන ලෙසට මම සියලු ජිනවරයන්වහන්සේලා උනන්දු කරවමි.
නිවනට පිවිසීමට තීරණය කළ ලෝක ප්‍රදීප (උත්තම) යන් වහන්සේලාගෙන් මා ඉල්ලා සිටින්නේ, ලෝකයාගේ හිත සුව පිණිස බොහෝ කාලයක් රැඳී සිටින ලෙස ය.

මා කළ යම් වූ හෝ කුශලයක් වේ නම්, එය මා හට මෙන්ම, අනෙක් අයටද අද්විතීය ධර්ම ප්‍රත්‍යක්ෂය ලබා ගැනීමට හේතුවක් වේවා!

අද දින ජිනවරයන් හා ජින පුත්‍රයන් ඉදිරියේ අශෝකෝත්තම භාග්‍යවතුන් වහන්සේ ගේ නාමය සත් වරක් කියා උන්වහන්සේට වන්දනාමාන ආදිය කළෙමු.

එහි බලයෙන්, අශෝකෝත්තම භාග්‍යවතුන් වහන්සේගේ විශේෂ පූර්ව ආයාචනයන්ට අනුකූලව, අසරණව දුකින් පෙළෙන්නා වූ ද, අසතුටින් හා කරදර වලින් යුතු වූ ද, නොයෙක් ආකාරයේ දුක් අනුභව කරන්නා වූ ද, අපගේ හා අන් සියලු ජීවී සත්වයන්ගේ අසතුට හා කරදර සම්පූර්ණයෙන්ම සංසිඳී යා වා!
තම ප්‍රියයන්ගෙන් වෙන්වීමේ දුක අත් දැකීමට නොලැබේවා! බොහෝ කලක් ජීවත් වෙත්වා!

පාප ක්‍රියාවන් කිරීම නිසා, අන්ධකාර අපායේ ඉපදීමට නියමිතව සිටින හෝ දැනටම ඉපදී සිටින අපට හා අනෙකුත් සියලුම ජීවී සත්වයන්ට අශෝකෝත්තම භාග්‍යවතුන් වහන්සේගේ ශ්‍රී ශරීරයෙන් විහිදෙන ආලෝක කිරණවල ස්පර්ශය ලැබේ වා! එම කිරණ ස්පර්ශ වූ වහාම අපගේ සියලු පාපයන් පවිත්‍ර වී, එකී අපායෙන් සම්පූර්ණ නිදහස ලැබේ වා! අපගේ දුක් ගිනි අත්දැකීම් සම්පූර්ණයෙන්ම නතර වේ වා! නිවන් දක්නා තුරුම අපට දෙව් මිනිසුන්ගේ සතුට ලැබේ වා!

අකුශල කර්ම කරමින් අන් අයගේ වස්තුව සොරා ගැනීම නිසා ඇඳුම්, කෑම, බීම, ඉඳුම් හිටුම් ආදිය හිඟ කුසගින්නේ හා පිපාසයෙන් පෙළෙන දුගී පවුල්වල ඉපදී සිටින අපට හා අන් සියලුම ජීවී සත්වයන්ට, නිවන් දක්නා තුරුම කෑම බීම, ඇඳුම් පැළඳුම්, ඉඳුම් හිටුම් වලින් අඩුවක් නොවේ වා! අපගේ ශරීර දිව්‍ය ශරීර බඳු වේවා!

යක්ෂ, භූත, ප්‍රේතයන්ගේ බලපෑම් නිසා ජීව ගුණය හීන වී ගොස් නොයෙකුත් ආබාධ වැළඳීමෙන් දුකට පත්ව සිටින අපගේ හා අනෙක් සියලුම ජීවී සත්වයන්ගේ එම භූත දෝෂ සියල්ල හා ජීවයෙන් තොර ස්වභාවය, ධර්ම ප්‍රත්‍යක්ෂය ලබන තුරුම අවසන් වී යා වා. අපට සුසංගතව ජීවත් වීමට ලැබේවා! නා නා අසනීපවලින් අප සම්පූර්ණයෙන්ම නිදහස් වේවා! අප මිය ගිය විට අශෝකෝත්තම භාග්‍යවතුන් වහන්සේගේ බුද්ධ ක්ෂේත්‍රයෙහි සිහසුනක් මත නෙළුමක් තුළ ඕපපාතිකව පහළ වීමට අපට ලැබේවා! එහි පහළ වූ වහාම, නිවැරදි මතකය හා භාවනාමය ඒකාග්‍රතාව වැනි සද්ගුණයන් පහළ වී අශෝකෝත්තම භාග්‍යවතුන් වහන්සේගෙන් හා දස දිසාවන්හිම වෙසෙන අනෙකුත් බුදුවරුන්ගෙන් උපදෙස් ලැබීමට හැකි වේවා! ක්ෂණිකව බාධා විරහිතව සියලු බුද්ධක්ෂේත්‍රයන්ට ඇතුළු වීමට හැකි වේවා!

අතීතයේ දී භාග්‍යවත් අශෝකෝත්තම බුදුරජාණන් වහන්සේ ප්‍රණිධාන ප්‍රාර්ථනා සතරක් සිදු කළහ.

උන්වහන්සේගේ අසීමිත ඥානයෙන්, බලයෙන් හා ආදරයෙන් බලගැන්වුණු ආශිර්වාදයෙන්, මට ද අනෙක් සියලු ජීවී සත්වයන්ටද, එහි ඵල අද මෙහි දී වින්දනය කරන්නට ලැබේවා!
මුනීද්‍රයන්ගේ ධර්මය පැතිරී යා වා!
ජීවී සත්වයෝ සතුටු වෙත්වා, සුවපත් වෙත් වා!
විශේෂයෙන්ම, අනුග්‍රාහකයන්ද සහිතව සසර සැරි සරන ජීවී සත්වයෝ, දෙයාකාර කිලිටිවීම්වලින් පිරිසිදු වෙත්වා! දෙයාකාර සංචිතයන් පරිපූර්ණ කරත්වා!
මහා අවදි බව ඉක්මනින්ම ලබා ගැනීම සඳහා අපට ආශිර්වාද කරනු මැනවි!

## ධර්මකීර්ති - සාගර - ඝෝෂ භාග්‍යවතුන් වහන්සේ

අපි, ධර්ම කීර්ති-සාගර-ඝෝෂ තථාගතයන් වහන්සේ ට නමස්කාර කරමු. අපි ඔබ වහන්සේගේ සරණ යමු.
(7 වරක් කියන්න)

එකී සියලුම ආර්යයන් වහන්සේලාට මම, පානීය ජලය, ආලේප, මල්, සුවඳ දුම්, පහන්, ආහාර, තාලවාද්‍යයන්, උඩුවියන් යනාදිය ද පුද කරමි. ඒ සියල්ලම සැබවින්ම පුද කෙරෙන සැබෑ ද්‍රව්‍යයන් ය. දස දිසාවන්හිම, අයිතිකරුවකු නැතිව පවතින, දෙව් මිනිසුන්ගේ යහපත් ධනයද, සතුට ලබා ගැනීම සඳහා අවශ්‍ය වන සෑම උත්කෘෂ්ට ද්‍රව්‍යයක්මද, පුද කරමි. යන්ත්‍ර මන්ත්‍ර බලයෙන් හා භක්තියෙන් ජනනය කරන ලද්දා වූ, සමන්තභද්‍රයන්ගේ ශුභ ප්‍රාර්ථනා බලයෙන්, මුළු ආකාසයම පිරී යන පරිදි පූජා වලාවන් පුද කරමි.

අනාදිමත් කාලයක් තිස්සේ සසර සැරිසරද්දී, අප විසින් ඝෘණාත්මක අකුශල ක්‍රියා බොහෝ ගණනක් කරනු ලැබ ඇත. කොටින් කිවහොත් අප කර ඇත්තේ නොකළ යුතු දෑ කරමින්, කළ යුතු දෑ නොකර සිටීම ය. ඒ වැරදි කවරක් වුවත්, ඒ සියල්ලම මම පාපොච්චාරණය කරමි.

තුන් කල්හිම සියලු ආර්යයන්වහන්සේ ලා හා සාමාන්‍ය මිනිසුන් විසින් කරන ලද පින් හා කුශල මූලයන් පිළිබඳව මම සතුටු වෙමි.
අද්විතීය වූ ධර්ම චක්‍රය ප්‍රවර්තනය කරන ලෙස මම සියලු ජිනවරයන් වහන්සේලා උනන්දු කරවමි. නිවනට පිවිසීමට තීරණය කළ ලෝක ප්‍රදීප (උත්තම)යන් වහන්සේලාගෙන් මා ඉල්ලා සිටින්නේ, ලෝකයාගේ හිත සුව පිණිස බොහෝ කාලයක් රැඳී සිටින ලෙස ය.

මා කළ යම් වූ හෝ කුශලයක් වේ නම්, එය මා හට මෙන්ම අනෙක් අයටද අද්විතීය ධර්ම-ප්‍රත්‍යක්ෂය ලබා ගැනීමට හේතුවක් වේ වා!
අද දින ජිනවරයන් වහන්සේලා හා ජින පුත්‍රයන් ඉදිරියේ ධර්මකීර්ති - සාගර-ඝෝෂ භාග්‍යවතුන් වහන්සේගේ නාමය සත්වරක් කියා උන්වහන්සේට වන්දනාමාන ආදිය කෙළෙමු.

එහි බලයෙන්, ධර්මකීර්ති-සාගර-ඝෝෂ භාග්‍යවතුන් වහන්සේගේ විශේෂ පූර්ව ආයාචනයන්ට අනුකූලව, වැරදි දෘෂ්ටීන් ඇති පවුලක ඉපදීම නිසා බුදුන්, දහම්, සඟුන් කෙරේ ශ්‍රද්ධාවක් නැතිව බෝධි චිත්තය මත අප හා අනෙකුත් ජීවී සත්වයන් මනස රඳවා ගැනීම නොකරන බැවින්, ඒ දෝෂ සියල්ල දුරු වී, නිවන් දක්නා තුරුම අප තුළ නිවැරදි දෘෂ්ටිය ඇති වේවා! අප තුළ බුද්ධ, ධම්ම, සංඝ යන රත්නත්‍රය කෙරේ අචල ශ්‍රද්ධාවක් ඇති වේවා! බෝධි චිත්තය වෙත ඇති අවධානය අපගෙන් ඉවත් නොවේවා!

බුද්ධ, ධම්ම, සංඝ යන ශබ්දය පවා ඇසෙන්නට නැති ප්‍රත්‍යන්ත ප්‍රදේශයක ඉපදීම නිසා, පාප මිත්‍රයන් අනුව ගොස් පාප කර්ම කරමින්, මිය යාමෙන් පසු ත්‍රිවිධ අපාය භූමිවල උපත ලබා දුක් විඳින්නට සිදු වූ අපට හා අනෙකුත් සියලු ජීවී සත්වයන්ට ධර්ම කීර්ති-සාගර-ඝෝෂ නම් තථාගතයන් වහන්සේගේ නාමය අසන්නට ලැබේවා! ධර්මයේ වලා හා සාගර ශබ්දය පැන නගීවා! එම ධර්ම ශබ්දය ඇසීමෙන් පසුව, අපගේ පුරාණ කර්ම අහෝසි වේවා! අප ධර්ම ප්‍රත්‍යක්ෂය ලබන තුරුම බෝධිචිත්තය වෙත අවධානය යොමු කිරීමට අපට හැකි වේවා!
ඇඳුම්, අබරණ, සුවඳ දුම්, මාලා, ආලේපන, ඉඳුම් හිටුම් හා ඖෂධ නැතිවීම නිසා පාපකර්ම සිදු කොට දුක් විඳින්නට සිදු වී ඇති අපට හා අනෙකුත් සියලු ජීවී සත්වයන්ට, ඒවා ගැන සිතනු හා සමගම ඇඳුම්, අබරණ ආදී ඒ සියල්ලම ලැබේවා! නිවන් දක්නා තුරුම අපට කිසිදු අඩුවක් ඇති නොවේවා!

පෙර කළ කර්ම පරිණත වීම නිසා තර්ක කරන්නට, එකිනෙකා හා සටන් කරන්නට ගොස් ගහ මරා ගැනීම නිසා දුක් විඳින්නට සිදු වී ඇති අප හා අන් සියලු ජීවී සත්වයන් දුනු හී, කඩු, පොලු ආදියෙන් ඈත් වේවා! ඒවා අත්හැර දමන්නට අපට හැකිවේවා! සියලු සතුරෝ එක්සත්ව සමගිව සුසංගතව වෙසෙත්වා! ඒ කිසිවෙකුට තම ජීවිත අහිමි නොවේවා! අපට ධර්ම ප්‍රත්‍යක්ෂය ලැබෙන තුරුම, අපට අපගේ වස්තුවෙන්, ධනයෙන්, බලයෙන් තෘප්තිමත් වියහැකි වේවා! අප මිය ගිය විට, අපට, ධර්ම කීර්ති - සාගර - ඝෝෂ භාග්‍යවතුන් වහන්සේගේ බුද්ධ ක්ෂෙත්‍රයෙහි, සිංහාසනයක් මත නෙළුමක් තුළ ඕපපාතිකව පහළ වන්නට ලැබේවා! අප එහි උපත ලැබූ වහාම අපට නිවැරදි මතකය, භාවනාමය ඒකාග්‍රතාව ආදී යහපත් ගුණාංග සාක්ෂාත් වී, ධර්මකීර්ති - සාගර-ඝෝෂ භාග්‍යවතුන් වහන්සේගෙන් හා දස දිසාවන්හි වැඩ වෙසෙන අනෙකුත් භාග්‍යවතුන් වහන්සේලාගෙන් ධර්මෝපදේශ ලබන්නට හැකි වේවා! උන්වහන්සේලා සතුටු කරමින්, ක්ෂණිකව හා බාධා විරහිතව සියලු බුද්ධ ක්ෂේත්‍රයන්ට ඇතුළු වීමට අපට හැකි වේවා!

අතීතයේදී, ධර්මකීර්ති-සාගර-ඝෝෂ භාග්‍යවතුන්වහන්සේ ප්‍රණිධාන ප්‍රාර්ථනාවන් සතරක් කළා හු ය. උන්වහන්සේගේ අසීමිත ඥානයෙන්, බලයෙන් හා ආදරයෙන් බල ගැනුවුණු ආශිර්වාදයෙන්, මට ද, අනෙක් සියලු ජීවී සත්වයන්ටද, එහි ඵල අද මෙහිදී වින්දනය කරන්නට ලැබේවා!

මුනීන්ද්‍රයාණන්ගේ ධර්මය මල් පල ගැන්වේවා!
ජීවී සත්වයෝ සතුටු වෙත්වා, සුවපත් වෙත්වා!
විශේෂයෙන්, අනුග්‍රාහකයන්ද සහිතව සසර සැරි සරන ජීවී සත්වයෝ
දෙයාකර කිලිටිවීම් වලින් මිදී පිරිසිදු වෙත්වා!
දෙයාකාර සංචිතයන් පරිපූර්ණත්වයට පත් කරත්වා!
මහා අවදි බව ඉක්මනින් ලබා ගැනීම සඳහා අපට ආශිර්වාද කරන සේක්වා!

# ධර්මසාගර - වරමති - වික්‍රීඩිතාභිඥ - රාජ

# භාග්‍යවතුන් වහන්සේ

අපි, ධර්මසාගර-වරමති-වික්‍රීඩිතාභිඥ-රාජ භාග්‍යවතුන් වහන්සේට, නමස්කාර කරමු. අපි ඔබවහන්සේ සරණ යමු. (7 වරක් කියන්න)

එකී සියලුම ආර්යයන් වහන්සේලාට මම, පානීය ජලය, ආලේප, මල්, සුවඳ දුම්, පහන්, ආහාර, තාලවාද්‍යයන්, උඩුවියන් යනාදිය පුද කරමි. ඒ සියල්ලම සැබවින්ම පුද කෙරෙන සැබෑ ද්‍රව්‍යයන්ය. අයිතිකරුවකු නොමැතිව දස දිසාවන්හිම  පවතින දෙව් මිනිසුන්ගේ යහපත් ධනයද, සතුට ලබා ගැනීම සඳහා අවශ්‍ය වන සෑම උත්‍යකෘෂ්ට ද්‍රව්‍යයක් ම ද පුද කරමි. යන්ත්‍ර මන්ත්‍ර බලයෙන් හා භක්තියෙන් ජනනය කරන ලද සමන්තභද්‍රයන්ගේ ශුභ ප්‍රාර්ථනා බලයෙන් මුළු ආකාසයම පිරී යන ලෙස පූජා වලාවන් පුද කරමි.

අනාදිමත් කාලයක් තිස්සේ සසර සැරිසරද්දී අප විසින් සෘණාත්මක අකුශල ක්‍රියා බොහෝ ගණනක් කරන ලද්දේ ය. කොටින් කිවහොත්, අප කර ඇත්තේ නොකළ යුතු දෑ ය, කළයුතු දේ නොවේ. ඒ වැරදි කවරක් වුවද, ඒ සියල්ලම මම පාපොච්චාරණය කරමි. තුන් කල්හිම සියලු ආර්යයන් වහන්සේලා හා සාමාන්‍ය මිනිසුන් විසින් කරන ලද පින් හා කුශල මූලයන් පිළිබඳව මම සතුටු වෙමි.

අද්විතීය වූ ධර්ම චක්‍රය ප්‍රවර්තනය කරන ලෙස, මම සියලු ජිනවරයන්වහන්සේලා උනන්දු කරවමි.
නිවනට පිවිසීමට තීරණය කළ ලෝක ප්‍රදීප උත්තමයන් වහන්සේලාගෙන් මා ඉල්ලා සිටින්නේ, ලෝකයාගේ හිතසුව පිණිස බොහෝ කාලයක් (සංසාර ය තුළ) රැඳී සිටින ලෙස ය.

මා කළ යම් වූ හෝ කුශලයක් වේ නම්, එය මා හට මෙන් අනෙක් අයටද අද්විතීය ධර්ම ප්‍රත්‍යක්ෂය ලබාගැනීමට හේතුවක් වේවා!

අද දින ජිනවරයන් වහන්සේලා හා ජින පුත්‍රයන් ඉදිරියේ ධර්ම-සාගර-වරමති-වික්‍රීඩිතාභිඥ-රාජ භාග්‍යවතුන් වහන්සේගේ නාමය සත් වරක් කියා උන්වහන්සේට වන්දනාමාන ආදිය කෙළෙමු.

මෙම ආයාචනයන්ගේ බලයෙන්, ධර්ම-සාගර-වරමති-වික්‍රීඩිතාභිඥ-රාජ භාගයවතුන් වහන්සේගේ පූර්ව විශේෂ ආයාචනයන්ට අනුකූලව, ගොවිතැන් වැඩවලදී ද, පැල සිටුවීමේදී ද, වෙළඳාම් කටයුතුවල දී ද සටන් කිරීමේදී ද, වාදභේද වීමේදී හා ඊට සමාන වෙනත් ක්‍රියාවලදී ද, අපට හා අනෙක් සියලු ජීවී සත්වයන්ට, අපට අවශ්‍ය සියලුම දේ ඒ මොහොතේම සපයනු ලැබේවා! අප ඊර්ෂ්‍යාවෙන් තොර වේවා! අප අතින් හැම විටම කුශල කර්මයන්ම සිදුවේවා!

දස අකුශල කර්ම පථයන්හි වුවමනාවෙන්ම සැරි සැරීම නිසා අපායට යන්නට නියම වී ඇති අප හා අනෙකුත් සියලු ජීවී සත්වයන්ට දස කුශල කර්මපථයන්ට ඇතුළුවීමට හැකිවේවා!
කිසිම ජීවී සත්වයකු අපායට නොවැටේවා!

අනෙක් අයගේ පාලනයට යටත්ව, බන්ධනයෙන්, පහර කෑමෙන්, දඟගෙයි වැටීමෙන් හා මරණයෙන් දඬුවම් ලබන අප, නිවන් දක්නා තුරුම එම බන්ධන, පහරදීම් යනාදියෙන් නිදහස් වේවා! අපට උත්කෘෂ්ට, අද්විතීය නිදහසක් ලැබේවා!

ජීවිතය කෙටි කරන නොයෙක් පව් කම් කිරීම නිසා ජීවිත කාලය කෙටි වී, මිය යන්නට ආසන්නව සිටින අපගේ හා අනෙකුත් සියලු ජීවී සත්වයන්ගේ සියලු පාපයන් අහෝසි වී ගොස් අපට දීර්ඝායුෂ ලැබේවා! අකල් මරණවලට ගොදුරු වීමට නියමිත අය කිසි විටෙකත් අකාලයේ මිය නොයත්වා! මරණ මොහොතේ දී ධර්ම-සාගර-වරමති-වික්‍රීඩිතාභිඥ-රාජ භාග්‍යවතුන් වහන්සේගේ නාමය සජ්ඣායනා කිරීමෙන් හා මතක තබා ගැනීමෙන් අපට පාරාදීසයක් වැනි ලොවක සුන්දර ජීවිතයක් ගත කරන්නට ලැබේවා! අප මිය ගිය විට, ධර්මසාගර-වරමති-වික්‍රීඩිතාභිඥ- රාජ භාග්‍යවතුන් වහන්සේගේ බුද්ධ ක්ෂේත්‍රයෙහි නෙළුමක් තුළ ඇති සිහසුනක් මත උපදින්නට ලැබේවා! එහි උපන් විගස, නිවැරදි මතකය, භාවනාමය ඒකාග්‍රතාව වැනි සියලු සද්ගුණයන් අප තුළ පහළ වී, ධර්ම සාගර-වරමති-වික්‍රීඩිතාභිඥ-රාජ භාග්‍යවතුන් වහන්සේගෙන් හා දස දිසාවන්හිම වැඩ වෙසෙන අනෙකුත් භාග්‍යවතුන් වහන්සේලාගෙන් උපදෙස් ලබා ගැනීමට අපට හැකිවේවා! උන්වහන්සේලා සතුටට පත් කරමින්, ක්ෂණිකව, බාධාවකින් තොරව අපට ඒ සියලු බුද්ධක්ෂේත්‍රයන්ට ඇතුල් වීමට හැකිවේවා!

අතීතයේ දී, ධර්ම සාගර-වරමති-වික්‍රීඩිතාභිඥ-රාජ භාග්‍යවතුන් වහන්සේ ප්‍රණිධාන ප්‍රාර්ථනාවන් අටක් කළාහුය. උන්වහන්සේගේ අසීමිත ඥානයෙන්, ආදරයෙන් හා බලයෙන් බලගැන්වුණු ආශිර්වාදයෙන් මටද, අනෙක් සියලු ජීවී සත්වයන්ටද, එහි ඵල අද මෙහි දී විඳින්නට ලැබේවා!
මුනීන්ද්‍රයන්ගේ ධර්මය පැතිරී යා වා!
ජීවී සත්වයෝ සතුටු වෙත්වා, සුවපත් වෙත්වා!
විශේෂයෙන්ම අනුග්‍රාහකයන්ද සහිතව සසර සැරිසරන ජීවී සත්වයෝ දෙයාකාර කිලිටිවීම් වලින් මිදී පිරිසිදු වෙත්වා !
දෙයාකාර සංචිතයන් පරිපූර්ණත්වයට පත් කරත්වා !
මහා අවදි බව ලබා ගැනීම සඳහා අපට ආශිර්වාද කරන සේක්වා !

➢

# <u>භෛෂජ්‍යගුරු - වෛඩූර්ය - ප්‍රභ - රාජ භාග්‍යවතුන් වහන්සේ</u>

අපි, භෛෂජ්‍යගුරු-වෛඩූර්ය-ප්‍රභ-රාජ තථාගතයන් වහන්සේට නමස්කාර කරමු; අපි ඔබවහන්සේ සරණ යමු. (7 වරක් කියන්න)

➢

එකී සියලුම ආර්යයන් වහන්සේලාට මම, පානීය ජලය, ආලේප, මල්, සුවඳ දුම්, පහන්, ආහාර, තාලවාද්‍යයන්, උඩුවියන් යනාදියද පුද කරමි. ඒ සියල්ලම සැබවින්ම පුද කෙරෙන සැබෑ ද්‍රව්‍යයන් ය. දස දිසාවන්හිම, අයිතිකරුවකු නොමැතිව පවතින, දෙව් මිනිසුන්ගේ යහපත් ධනයද, සතුට ලබා ගැනීම සඳහා අවශ්‍ය වන

සෑම උත්කෘෂ්ට ද්‍රව්‍යයන් ම ද පුද කරමි. යන්ත්‍ර මන්ත්‍ර බලයෙන් හා භක්තියෙන් ජනනය කරන ලද්දා වූ සමන්තභද්‍රයන්ගේ ශුභ ප්‍රාර්ථනා බලයෙන්, මුළු අවකාශයම පිරී යන පරිදි පූජා වලාවන් පුද කරමි.

අනාදිමත් කාලයක් තිස්සේ, සසර සැරිසරද්දී අප විසින් සෘණාත්මක අකුශල ක්‍රියා බොහෝ ගණනක් කරන්නට ඇත. කොටින් කිවහොත්, අප කර ඇත්තේ නොකළ යුතු දේ කිරීම හා කළයුතු දේ නොකිරීම ය. ඒ වැරදි කවරක් වුවත් ඒ සියල්ලම මම පාපොච්චාරණය කරමි.

තුන් කල්හිම, සියලු ආර්යයන් වහන්සේලා හා සාමාන්‍ය මිනිසුන් විසින් කරන ලද පින් හා කුශල මූලයන් පිළිබඳව මම සතුටු වෙමි.

අද්විතීය වූ ධර්ම චක්‍රය ප්‍රවර්තනය කරන ලෙස මම සියලු ජිනවරයන් වහන්සේලා උනන්දු කරවමි.
නිවනට පිවිසීමට තීරණය කළ ලෝක ප්‍රදීප (උත්තම) යන්ගෙන් මා ඉල්ලා සිටින්නේ, ලෝකයාගේ හිත සුව පිණිස බොහෝ කලක් මෙලොව රැඳී සිටින ලෙසයි.

මා කළ යම් වූ හෝ කුශලයක් වේ නම්, එය මා හට මෙන්ම අනෙක් අයටද අද්විතීය ධර්ම ප්‍රත්‍යක්‍ෂය ලබා ගැනීමට උපකාරී වේවා !

අද දින ජිනවරයන් හා ජින පුත්‍රයන් සමූහය ඉදිරියේ භෛෂජ්‍යගුරු වෛඩූර්ය ප්‍රභ-රාජ තථාගතයන් වහන්සේගේ නාමය සත්වරක් කියා උන්වහන්සේට වන්දනාමාන ආදිය කෙළෙමු. එම ආයාචනයන්ගේ බලයෙන් එම තථාගතයන්ගේ විශේෂිත පූර්ව ප්‍රාර්ථනාවන්ට අනුව, අප ද අනෙකුත් සියලු ජීවී සත්වයන්ද, දෙතිස් මහා පුරුෂ ලක්‍ෂණයන්ගෙන් හා අසූ අනු ව්‍යංජනවලින් සැරසේවා ! අනෙකුත් සියලු ජීවී සත්වයන්ට මෙන්ම අපට ද එසේම සිදුවේවා ! අපගේ ශරීරයන්ගේ ආලෝකයෙන්, අසංඛ්‍ය වූ ද, අමිත වූ ද ලෝක පද්ධතීන් ආලෝකමත් වේවා, ප්‍රභාස්වර වේවා, දිදුලා වා !

අපගේ ශරීර අමිල වෛඩූර්ය මාණික්‍යයන් සේ ඇතුළත හා පිටත පරම පවිත්‍ර වේවා ! නිකැලැල්ව උද්දීප්ත වේවා ! සම්පූර්ණ ලෙසද විශාල ලෙසද වර්ධනය වී හිරු සඳු රැස් ඉක්මවා යන තරම් වූ ප්‍රභාස්වර ආලෝකයකින් දිදු ලා වා ! භෛෂජ්‍යගුරු වෛඩූර්යප්‍රභ රාජ තථාගතයන් ලෙසම, එම ආලෝක කිරණවලින් වෙනත් ලෝක ධාතූන් හි මෙන්ම මෙම මිනිස් ලොවද අඳුරේ නොයෙක් දිශාවලට යොමු වී සිටින ජීවී සත්වයන්ට, ඔවුන් යන මාර්ගය පැහැදිලි වී ඔවුන්ගේ අභිමතාර්ථයන් ඉෂ්ට කර ගන්නට ලැබේවා !

භෛෂජ්‍යගුරු වෛඩූර්ය ප්‍රභ-රාජ තථාගතයන්ගේ ප්‍රඥාව හා උපාය මාර්ගයන් අසීමිත බැවින්, අපට මෙන්ම අනෙකුත් ලෝක පද්ධතීන් හි වෙසෙන සියලු දෙනාටම වින්දන අරමුණු හිඟ නොවේ වා ! කිසිදු අයෙකුට කිසිදු අඩුවක් සිදු නොවේ වා !

පහල මට්ටමේ මාර්ගයන්ට ඇතුළු වී සිටින අපට හා අන් සියලු ජීවී සත්වයන්ට ද, ශ්‍රාවක හා පසේ බුදු මාර්ගයන්ට ඇතුළු වී සිටින්නන්ට ද, අද්විතීය මහායාන මාර්ගයට ඇතුළු වීමට හැකි වේවා !

අවසාන ධර්ම ප්‍රත්‍යක්ෂය ලැබීම දක්වාම අපට හා සියලු ජීවී සත්වයන්ට ත්‍රිවිධ ප්‍රතිඥා වර්ගයන්ගෙන් හික්මෙන්නට ලැබේවා ! සදාචාරයෙන් පිරිහී ගිය කිසිම අයෙකු අපාය උත්පත්තියකට නොවැටේ වා !

ආබාධිත ඉන්ද්‍රියයන් ඇත්තා වූ ද, අවලස්සන වූ ද, මෝඩ වූ ද, කොර, කුදු, ලාදුරු සැදුණු, සිරුරින් යුතු වූද, අඳ, ගොළු, බිහිරි වූ ද, උමතු වූ ද, රෝගී වූ ද අපගේ හා සියලු ජීවී සත්වයන්ගේ සියලු කර්ම බාධක ඉවත්ව ගොස් අංග සම්පූර්ණ අඟ පසඟ හා ඉන්ද්‍රියයන් ඇති වේවා !

නොයෙක් අසනීපයන්ගෙන් පෙළෙන්නා වූ ද, අසරණ වූ ද ආරක්ෂිත බවින් තොර වූ ද, ආදායම් මාර්ග හා ඖෂධ ලබා ගැනීමේ ක්‍රම නොමැති වූ ද, උදව්වට කෙනෙකු නැති වූ ද, දුප්පත් වූ ද, දුක් වේදනාවන්ගෙන් පෙළෙන්නා වු ද අප හා සියලු ජීවී සත්වයන් අසනීපවලින් අත්මිදේවා ! අවසාන ධර්ම ප්‍රත්‍යක්ෂය ලබන තුරුම, අපට අසනීප හෝ හානි ඇති නොවේ වා, අවශ්‍ය සියලු දේ උපරිම මට්ටමින් ලැබේ වා !

ස්ත්‍රීන්ට ආවේණික වු රෝගවලින් පෙළෙන්නා වූ ද ස්ත්‍රීත්වයට අකමැති වූ ද, ස්ත්‍රියක වී ඉපදීමෙන් නිදහස් වීමට කැමැත්තා වූ ද, සියලුම ස්ත්‍රී හු එම ස්ත්‍රී තත්ත්වයෙන් අත් මිදෙත්වා ! ධර්ම ප්‍රත්‍යක්ෂය ලබන තුරුම ඔවුහු පුරුෂ ලිංගේන්ද්‍රියය ඇතිව උපදිත්වා ! අප ද, අන් සියලු ජීවී සත්වයෝද මාර පාශයන්ගෙන් නිදහස් වෙත්වා ! ප්‍රතිවිරුද්ධ දෘෂ්ටීන් නිසා ද්‍රෝහී නොවී අප සියලුදෙනා සම්‍යග් දෘෂ්ටියෙන් යුතු වෙම් වා ! අප සියලුදෙනාටම සත්‍යයට අවදි වීමේ මාර්ගය අනුගමනය කරන්නට ලැබේවා !

පාලකයකුගේ තර්ජනයන්ට බිය වූ ද, බඳිනු ලැබුවා වූද, පහර දෙනු ලැබුවා වූ ද, හිරගෙවල් තුළ සිර කරනු ලැබුවා වූ ද, මරණයට නියම වූ ද, නොයෙක් හේතු නිසා මරණයට නියම වූ ද, පහත් ලෙස සලකනු ලැබුවා වූ ද, කායික, වාචික හා මානසික දුකින් දුකට පත් වූ ද අප හා අනෙක් සියලුම ජීවී සත්වයෝ මාගේ පුණ්‍ය ශක්තියේ බලයෙන් සියලු හානි වලින් නිදහස ලබත්වා !

කුසගින්නෙන් හා පිපාසයෙන් පෙළෙමින්, කෑම බීම සොයා ගැනීම සඳහා නොයෙක් පාප කර්ම කරන්නට සිදු වී ඇති මා හට අනෙක් සියලු ජීවී සත්වයන්ට ප්‍රියජනක, රසවත් හා සුවඳවත් කෑම බීම ලැබේ වා ! පසුව ඒ සියලු දෙනාම ධර්ම රසයෙන් සතුටු කරන්නට, මට හැකිවේවා !

නිරුවත්ව, දුගී බවින් පෙළෙමින්, දිවා රෑ සීතලෙන්, උෂ්ණයෙන්, මැසි මදුරුවන්ගෙන් කරදර විඳින්නට සිදු වී ඇති මට හා අනෙක් ජීවී සත්වයන්ට සුදුසු ඇඳුම් ද, සුවඳ වර්ග ද, මාලාද, ආලේපන ද, සංගීතය ද, සංගීත භාණ්ඩ ද ලැබී මගේ හා අනෙකුත් ජීවී සත්වයන්ගේ අපේක්ෂාවන් ඉටු වේවා ! ඒ සියලු දෙනාම විමුක්තියේ සතුට විඳීත්වා !

අප මිය ගිය පසු, භෛෂජ්‍යගුරු වෛඩූර්ය-ප්‍රභ-රාජ භාග්‍යවතුන් වහන්සේගේ බුද්ධක්ෂේත්‍රයේ නෙළුමක් තුළ වූ සිහසුනක් මත ඕපපාතිකව පහළ වේවා ! එහි පහළ වූ වහාම, නිවැරදි මතකය හා භාවනාමය ඒකාග්‍රතාව වැනි සද්ගුණයන් පහළ වී, භෛෂජ්‍ය ගුරු වෛඩූර්ය ප්‍රභ-රාජ භාග්‍යවතුන් වහන්සේ ගෙන් හා දස දිසාවන්හිම වෙසෙන අනෙකුත් භාග්‍යවතුන් වහන්සේලාගෙන් උපදෙස් ලැබීමට හැකි වේවා ! ක්ෂණිකව හා බාධා විරහිතව, සියලු බුද්ධක්ෂේත්‍රයන්ට ඇතුල්වීමට ද හැකිවේ වා !

අතීතයේ දී භාග්‍යවත් භෛෂජ්‍යගුරු-වෛඩූර්ය-ප්‍රභ තථාගතයන් වහනසේ ප්‍රණිධාන ප්‍රාර්ථනා දොළහක් කළහ. උන්වහන්සේගේ අසීමිත, ඥානයෙන්, ආදරයෙන් හා බලයෙන් බලගැන්වුණු ආශිර්වාදයෙන්, මට ද අනෙක් සියලු ජීවී සත්වයන්ටද එහි ඵල අද මෙහිදී වින්දනය කරන්නට ලැබේවා !
මුනීන්ද්‍රයන්ගේ ධර්මය පැතිරී යාවා !
ජීවී සත්වයෝ සතුටු වෙත්වා, සුවපත් වෙත්වා !
විශේෂයෙන්ම, අනුග්‍රාහකයන්ද සහිතව සසර සැරිසරන ජීවී සත්වයෝ, දෙයාකාර කිලිටිවීම් වලින් මිදී පිරිසිදු වෙත්වා !
දෙයාකාර සංචිතයන් පරිපූර්ණත්වයට පත් කරත්වා !
මහා අවදි බව ඉක්මනින් ලබා ගැනීම සඳහා අපට ආශිර්වාද කරන සේක් වා !

## <u>සුගත ශාක්‍යමුනීද්‍රයන් වහන්සේ</u>

## (හෙවත් ශාක්‍යරාජයන් වහන්සේ)

අපි, භාග්‍යවත් තථාගත අරහත් සම්‍යක්සම්බුද්ධ ශාක්‍යමුණීන්ද්‍රයන් වහන්සේට නමස්කාර කරමු; අපි ඔබ වහන්සේ සරණ යමු.

එකී සියලුම ආර්යයන් වහන්සේලාට මම, පානීය ජලය, ආලේප, මල්, සුවඳ දුම්, පහන්, ආහාර, තාලවාද්‍යයන්, උඩුවියන් යනාදිය ද පුද කරමි. ඒ සියල්ලම සැබවින්ම පුද කෙරෙන සැබෑ ද්‍රව්‍යයන් ය. දස දිසාවන්හිම අයිතිකරුවකු නොමැතිව පවතින, දෙව් මිනිසුන්ගේ යහපත් ධනයද, සතුට ලබා ගැනීම සඳහා අවශ්‍ය වන සෑම උත්කෘෂ්ට ද්‍රව්‍යයන්ම ද පුද කරමි. යන්ත්‍ර මන්ත්‍ර බලයෙන් හා භක්තියෙන් ජනනය කරන ලද්දා වූ සමන්තභද්‍රයන්ගේ ශුභ ප්‍රාර්ථනා බලයෙන් මුළු ආකාසයම පිරී යන පරිදි පූජා වලාවන් පුද කරමි.

අනාදිමත් කාලයක් තිස්සේ සසර සැරි සරද්දී, අප විසින් ඍණාත්මක අකුශල ක්‍රියා බොහෝ ගණනක් කරන්නට ඇත. කොටින් කියතොත්, අප කර ඇත්තේ නොකළ යුතු දෑ ය, නොකර ඇත්තේ කළ යුත්ත දෑ ය. ඒ වැරදි කවරක් වුවත් ඒ සියල්ලම මම පාපොච්චාරණය කරමි.

තුන් කල්හිම සියලු ආර්යයන් වහන්සේලා හා සාමාන්‍ය මිනිසුන් විසින් කරන ලද පින් හා කුශල මූලයන් පිළිබඳව මම සතුටු වෙමි.

අද්විතීය වූ ධර්ම චක්‍රය ප්‍රවර්තනය කරන ලෙස මම සියලු ජිනවරයන් වහන්සේලා උනන්දු කරවමි.
නිවනට පිවිසීමට තීරණය කළ ලෝක ප්‍රදීප (උත්තම) යන් වහන්සේලාගෙන් මා ඉල්ලා සිටින්නේ, ලෝකයාගේ හිතසුව පිණිස බොහෝ කලක් රැඳී සිටින ලෙසයි.
මා කළ යම් වූ හෝ කුසලයක් වේ නම්, එය මා හට මෙන්ම අනෙක් අයටද අද්විතීය ධර්ම ප්‍රත්‍යක්ෂය ලබා ගැනීමට උපකාරී වේවා!

අද දින ජිනවරයන් හා ජින පුත්‍රයන් සමූහය ඉදිරියේ ශාක්‍යමුනි තථාගතයන් වහන්සේගේ නාමය සත් වරක් කියා උන්වහන්සේට වන්දනාමාන ආදිය කෙළෙමු. එම ආයාචනයන් ගේ බලයෙන්, ශාක්‍යමුනි භාග්‍යවතුන් වහන්සේ කර්ම බාධකයන්ගෙන් බාධා වී සිටින්නා වූ ද, නොයෙක් රෝගවලින් පෙළෙන්නා වූ ද, නොයෙක් දුක් කම්කටොලු වලින් පෙළෙමින්ද අසරණ වූ අප හා අනෙක් සියලු ජීවී සත්වයන් රැකබලා ගන්නා සේක්වා! දෙව් මිනිසුන්ගේ යහපත වෙනුවෙන් ද, ආයාචනයන් හා සතුට වෙනුවෙන් ද, සත් බුදුන් වහන්සේලාගේ උපාය කෞශල්‍යයන්ගේද, පූර්ව විස්තෘත විශේෂිත ආයාචනයන් ගේ ද ආශිර්වාදය අපට ලැබේවා!

සම්මා සම්බුදුන් වහන්සේ මෙසේ පැවසූහ:

> ''මංජු ශ්‍රීයෙනි, එය එසේ වන බැවින්, සියලු යහපත් ගුණාංගයන් සඳහා වීර්ය කරන අය, මානසික ආපදාවන් සමග මිශ්‍ර කර නොගෙන, සත් බුදුන්වහන්සේලාගේ නාමයත් ආරක්ෂා කළ යුතුය. ඔවුහු දහවල් කල තෙවරක්ද, රාත්‍රී කාලයේ තෙවරක් ද බැගින් උන්වහන්සේලා වෙත මනස ඒකාග්‍ර කොට ගෙන සිටිය යුත්තාහ, ගරු බුහුමන් කළ යුත්තාහ, මල් පහන්, සුවඳ දුම්, ආලේපන, ආහාර, වාද්‍ය සංගීතය යනාදියෙන් පූජාවන් පැවැත්විය යුත්තාහ; අෂ්ටාංග ශීලයෙහි පිහිටිය යුත්තාහ; පිරිසිදු ආකාරයෙන් දින සතක් පිරිසිදු තැනක හිඳිමින්, උන්වහන්සේගේ බුද්ධ ක්ෂේත්‍රයෙහි ඉපදීමට ප්‍රාර්ථනා කළ යුත්තාහ. ඔවුහු ජීවී සත්වයන් කෙරේ මෛත්‍රියෙන් හා කරුණාවෙන් සිත පුරවා ගත යුත්තාහ.''

තවදුරටත්, වෛඩූර්ය-ප්‍රභ ධාරණිය මෙසේ වේ:

> **තද්යථා සුමේ සුමේ/ඉමි නිමි හි මති මති මති සප්ත තථාගත සමාධ්‍යධිෂ්ඨිතේ/අතේ මතේ/පලේ පාපංශෝධනි/සර්ව පාපං නාශය මම බුද්ධ බුද්ධෝත්තමේ/උමේ කුමේ/බුද්ධ ක්ෂේත්‍ර පරිශෝධනි/ධම නිධමේ මේරු මේරු මේරු ශිඛරේ/සර්ව අකාල මෘත්‍යුං නිවාරණි/බුද්ධේ සුබුද්ධේ බුද්ධ අධිෂ්ඨාන/රක්‍ෂන්තු මේ/සර්ව දේවාඃ සමේ අසමේ සමන්ත හරන්තු මේ/සර්ව බුද්ධ බෝධිසත්ව/ශමෝ ශමේ/ප්‍රශමන්තු මේ/සර්ව ඉත්යූපද්‍රව ව්‍යාධයඃ පූරණේ පූරණි පූරය මේ/සර්ව ආශය/වෛඩූර්ය ප්‍රතිභාසේ සර්ව පාපං ක්‍ෂයංකරී ස්වා හා/**

මෙම මන්ත්‍රය එක්දහස් අට (1008) වරක් කියවන, ඊට වන්දනා කරන හෝ එය සජ්ඣායනා කරන කුලපුත්‍රයා හෝ කුල දුහිතෘව ගැන සියලුම තථාගතයන් වහන්සේලා සිතා බලන්නා හු ය. සියලු බෝධිසත්වයන්ද ඔවුන් ගැන සිතනු ඇත. සියලු වජ්‍රධරයන්ද ඔවුන් ආරක්ෂා කරනු ඇත. ඉන්ද්‍ර, බ්‍රහ්ම, සතරවරම් දෙවිවරුන් ඇතුළු සියලු දෙවිවරුන් ඔවුන් දැඩිව ආරක්ෂා කරනු ඇත. පංචානන්තර්ය කර්ම යනාදී සියලු කර්ම බාධාවන් ඉවත් කොට පවිත්‍ර කරනු ඇත. ඔවුන්ට කිසිදු අසනීපයක් නොසැදෙනු ඇත, බොහෝ කලක් ඔවුන් ජීවත් වනු ඇත. අකල් මරණ ඇති වීමේ බියෙන් ඔවුන් සම්පූර්ණයෙන්ම නිදහස් ය. මරණයෙන්, සතුරන්ගෙන්, තනි වීමෙන්, සටන් කිරීමෙන්, තර්ක කිරීමෙන්, අරගල කිරීමෙන් ඇතිවන හානි සම්පූර්ණයෙන්ම සංසිඳී යන්නේ ය. ඔවුහු කිසිසේත් සතුරකුගේ යටතට නොපැමිණෙන්නාහ. ඔවුන්ගේ අපේක්ෂා සියල්ල ඉෂ්ට සිද්ධ වන්නේ ය.

ඔබවහන්සේ ඉගැන් වූ ආකාරයට, අප හා අනෙකුත් අය වෙනුවෙන්, සූත්‍රයේ දී ඇති ආකාරයට පූජාව සම්බන්ධ සියලු දේ ඉටු කෙළෙමු. සත් බුදුන්වහන්සේලා ද, ශාස්තෘන්වහන්සේ ද ඉදිරියේ අපි වන්දනා කිරීමද, ආයාචනයද, ධාරණී සජ්ඣායනය ද කෙළෙමු. එබැවින්, නියම ආකාරයෙන් අපට ආශිර්වාද කොට, සියලු ප්‍රතිලාභයන් වහා ලබා ගැනීමේ හැකියාව අපට හා අනෙකුත් සියලු ජීවී සත්වයන්ටද ලබාදෙන සේක්වා!

අසමසම ශාක්‍යමුනි භාග්‍යවතුන් වහන්සේ, වෛදූර්ය ධාරණියේ ප්‍රතිලාභ ගැන දේශනා කළ සේක.
එහි ප්‍රතිඵලයක් වශයෙන්,
උන්වහන්සේගේ අසීමිත ඥානයේද, මෛත්‍රියේද, බලයේ ද බලගැන්වීමෙන්,
ඒවායේ ඵල අපට හා අනෙකුත් සාංසාරික ජීවී සත්වයන්ට අදම විඳින්නට ලැබේවා!
මුනීන්ද්‍රයන්වහන්සේගේ ඉගැන්වීම මල්පල දරා වා!
සියලුම ජීවී සත්වයෝ සුවපත් වෙත්වා,
සතුටු වෙත්වා!
අනුග්‍රාහකත්වයන් ප්‍රධාන කොට ගෙන සිටින සියලුම ජීවී සත්වයෝ දෙයාකාර බාධකයන් ඉවත් කොට පිරිසිදු වී, දෙයාකාර සංචිතයන් (එනම්, කුශලය හා ප්‍රඥාව) සම්පූර්ණ කරත්වා!

## ධර්ම රත්නය

මෝහ අඳුර දුරලන උත්තම ප්‍රදීපය වූ ද
දුක්ඛ අසනීපය සුව කරන උසස්තම ඔසුව වූ ද
සමස්ත ශ්‍රී සද්ධර්ම රත්නයට ම
අපි වන්දනා කරමු, පූජා පවත්වමු, එහි සරණ යමු.
(7 වරක් කියන්න)

එකී සියලුම ආර්යයන් වහන්සේලාට මම පානීය ජලය ද, ආලේප ද, මල් ද, සුවඳ දුම් ද, පහන් ද, ආහාර ද, සංගීතය හා තාලවාද්‍යයන් ද, උඩුවියන් ද, කොඩි යනාදිය ද පුද කරමි. ඒ සියල්ලම සැබවින්ම පුද කරනු ලබන සැබෑ ද්‍රව්‍යයන් ය. දස දිසාවන්හිම, අයිතිකරුවකු නොමැතිව පවතින, දෙව් මිනිසුන්ගේ යහපත් ධනයද, සතුට ලබා ගැනීම සඳහා අවශ්‍ය වන සෑම උත්කෘෂ්ට ද්‍රව්‍යයන්ම ද පුද කරමි. යන්ත්‍ර මන්ත්‍ර බලයෙන් හා භක්තියෙන් ජනනය කරන ලද්දා වූ සමන්තභද්‍රයන්ගේ ශුභ ප්‍රාර්ථනා බලයෙන්, මුළු අවකාශයම පිරී යන පරිද්දෙන් පූජා වලාවන් පුද කරමි.

අනාදිමත් කාලයක් තිස්සේ සසර සැරිසරද්දී, අප විසින් සෘණාත්මක අකුශල ක්‍රියා බොහෝ ගණනක් කරන්නට ඇත. කොටින් කිවහොත්, අප නොකළ යුතු දෑ කර ඇත, කළයුතු දෑ නොකර ඇත. ඒ වැරදි කවරක් වුවත්, ඒ සියල්ලම මම පාපොච්චාරණය කරමි.

තුන් කල්හිම, සියලු ආර්යයන් වහන්සේලා හා සාමාන්‍ය මිනිසුන් විසින් කරන ලද පින් හා කුශල මූලයන් පිළිබඳ මම සතුටු වෙමි.

අද්විතීය වූ ධර්ම චක්‍රය ප්‍රවර්තනය කරන ලෙස, මම සියලු ජිනවරයන් වහන්සේලා උනන්දු කරවමි. නිවනට පිවිසීම නිරූපණය කිරීමට තීරණය කළ, ලෝක ප්‍රදීප (උත්තම) යන්ගෙන් මා ඉල්ලා සිටින්නේ, ලෝකයාගේ හිත සුව පිණිස බොහෝ කාලයක් රැඳී සිටින ලෙසයි.

මා රැස් කළ යම් කුශලයක් වේ නම්, එය මා හට මෙන්ම අනෙක් අයටද අද්විතීය ධර්ම ප්‍රත්‍යක්ෂය ලබා ගැනීමට උපකාරයක් වේවා!

තථාගත වචනය සත්‍යය, විශ්වසනීය ය, වෙනස් නොවන සුලු ය. එබැවින්, අපට සත්‍යය ඍජුව උගන්වනු මැනවි.

''වැරදිවල නාමයන් ඇසූ පමණින්ම, එම වැරදි ඉවත් වී යහපත් ගුණාංග වර්ධනය වේ.''
තථාගතයන්ගේ වෙනස් නොවන වචනයේ ප්‍රතිඵලවලින් කිහිපයක් එසේ ය. උන්වහන්සේගේ අසීමිත ඥානයේ, මෛත්‍රියේ බලයෙන් බල ගැන්වුණු ආශිර්වාදයෙන්, මා මෙන්ම අනෙකුත් සියලුම ජීවී සත්වයෝද එහි ඵල දැන් මේ මොහොතේ ලබත්වා!

මුනීන්ද්‍රයන්ගේ ඉගැන්වීම මල්පල දරා වා!
ජීවී සත්වයෝ සතුටු වෙත්වා, සුවපත් වෙත් වා!
විශේෂයෙන්ම, ජීවී සත්වයෝ, තම ප්‍රධානියාගේ අනුග්‍රහය ඇතිව,
දෙයාකාර බාධාවන් ඉවත්කොට පවිත්‍ර වෙත්වා,
දෙයාකාර සංචිතයන් රැස් කරත්වා!
මහා අවදි බව ඉක්මනින් ලබාගැනීම සඳහා අපට ආශිර්වාද කරත්වා!

## <u>සංඝ රත්නය</u>

### <u>මංජු ශ්‍රී</u>

ආර්ය මංජු ශ්‍රී කුමාරභූත බෝධිසත්ව මහාසත්වයන්ට නමස්කාර වේවා! ඔබතුමන්ගේ මනස සියලු කැලැල්වලින් හා වැරදිවලින් විනිර්මුක්ත වූයේ ය. නිකැලැල් සද්ගුණ සමූහයේ සුදු පැහැති කිරණ රාශියෙන් ඔබගේ සිරුර අලංකාර වූයේ ය. ඔබගේ පද්ම-පාද පීඨිකාව දෙවියන්ගේ, මිනිසුන්ගේ, අසුරයන්ගේ, නාගයන්ගේ හා විද්‍යාධරයන්ගේ හිස් මුදුන් හි කිරුළු ස්පර්ශ කොට ඇත්තේ ය. ඔබ බොහෝ පාපී දෛවයන් විනාශ කොට දමන්නාහු ය. අපි ඔබට වන්දනාමාන කරමින් ඔබගේ සරණ යන්නෙමු. (7 වරක් කියන්න)

එකී සියලුම ආර්යයන්ට මම පානීය ජලයද, ආලේපන ද, මල් ද, සුවඳ දුම් ද, පහන් ද, ආහාර ද, සංගීතය හා තාල වාද්‍යයන් ද, උඩුවියන් ද, කොඩි යනාදිය ද පුද කරමි. ඒ සියල්ලම සැබවින්ම පුද කරනු ලබන සැබෑ ද්‍රව්‍යයන් ය. දස දිසාවන්හිම, අයිතිකරුවකු නොමැතිව පවතින, දෙව් මිනිසුන්ගේ යහපත් ධනයද, සතුට ලබා ගැනීම සඳහා අවශ්‍ය වන සෑම උත්කෘෂ්ට ද්‍රව්‍යයක් ම ද පුද කරමි. යන්ත්‍ර මන්ත්‍ර බලයෙන් හා භක්තියෙන් ජනනය කරන ලද්දා වූ සමන්තභද්‍රයන්ගේ ශුභ ප්‍රාර්ථනා බලයෙන්, මුළු අවකාශයම පිරී යන පරිද්දෙන්, පූජා වලාවන් පුද කරමි.

අනාදිමත් කාලයක් තිස්සේ සසර සැරිසරද්දී, අප විසින් සෘණාත්මක අකුසල ක්‍රියා බොහෝ ගණනක් කරන්නට ඇත. කොටින් කියතොත්, අප කළයුතු දෑ නොකර ඇති අතර, නොකළ යුතු දෑ කර ඇත. ඒ වැරදි කවරක් වුවත් ඒ සියල්ලම මම පාපොච්චාරණය කරමි.
තුන් කල්හිම සියලු ආර්යයන් වහන්සේලා හා සාමාන්‍ය මිනිසුන් විසින් කරන ලද පින් හා කුශල මූලයන් පිළිබඳව මම සතුටු වෙමි.

අද්විතීය වූ ධර්මචක්‍රය ප්‍රවර්තනය කරන ලෙස මම සියලු ජිනවරයන් වහන්සේලා උනන්දු කරවමි.
නිවනට පිවිසීමට තීරණය කළ ලෝක ප්‍රදීප (උත්තම)යන්ගෙන් මා ඉල්ලා සිටින්නේ, ලෝකයාගේ හිතසුව පිණිස බොහෝ කලක් රැඳී සිටින ලෙසයි.

මා කළ යම් වූ හෝ කුසලයක් වේ නම්, එය මා හට මෙන්ම අනෙක් අයටද අද්විතීය ධර්ම ප්‍රත්‍යක්‍ෂය ලබා ගැනීමට උපකාරී වේවා!
ආර්ය මංජු ශ්‍රී උත්තමයාණෙනි! කර්ම බාධකයන් තුළ සිර වී සිටින්නා වූ ද, නා නා රෝගයන්ගෙන් පෙළෙන්නා වූ ද, නොයෙක් දුක් දොම්නස්වලින් පීඩා විඳින්නා වූ ද, නොයෙක් නපුරු දෘෂ්ටීන් ගෙන් වැසී යාම නිසා පහලින් පහල තත්ත්වයට වැටෙන්නා වූ ද මෙම නපුරු කාලයේ වෙසෙන ජීවී සත්වයන්ට කරුණාව දක්වනු මැනවි!

සත් බුදුන්වහන්සේලාගේ නම් ඇසීම ම කෙනෙකු අනුත්තර අවදි බවෙන් ආපසු නොහැරීමට ද, කෙනෙකුගේ සියලු සෘණාත්මක භාවයන් හා කර්ම අන්ධකාරයන් ඉවත් වී පවිත්‍ර වීමට ද, පාපී යක්‍ෂයන්ගෙන් දුරුව විසීමට ද සියලු හානිකර හා අමනෝඥත්වයන් සමනය වීමට ද නිශ්චය වශයෙන්ම හේතු භූත වන්නේ ය. තමන් කැමති පරිදි තම අභිප්‍රායයන් ඉටු කර ගැනීමට ඉන් හැකිවනු ඇත්තේ ය.

''පූර්ව විශේෂිත ආයාචනා පිළිබඳ සවිස්තර සූත්‍රයෙහි''
ශාක්‍යමුනි බුදුන්වහන්සේ විසින් විශේෂයෙන් මෙම කරුණ උගන්වා ඇත.

> ''භාග්‍යවතුන් වහන්ස, අනාගතයේ දී මෙම සූත්‍රය ආරක්‍ෂා කරන්නා වූ ද, එය නිවැරැදිව අන් අයට උගන්වන්නා වූ ද, පිටපත් කොට අනෙක් අය ලවා ද පිටපත් කිරීමට සලස්වන්නා වූද, පිටපත් කරගත් ග්‍රන්ථයට තෙල්, මල්, පහන්, කුඩ, කොඩි, සේසත් පුදා ගරු කරන්නා වූ ද කුල පුත්‍රයන්ට හා කුල දූවරුන්ට මම නොයෙක් ආකාරයෙන් භෛෂජ්‍යගුරු-වෛඩූර්යප්‍රභ-රාජ තථාගතයන් වහන්සේගේ නාමය ඇසෙන්නට සලස්වන්නෙමි. කෙනෙකු එම සූත්‍රය පංච වර්ණ වස්ත්‍රයකින් ඔතා පිරිසිදු තැනක තබනේ නම් , පිරිවර සහිත සතරවරම් රජ දරුවෝ ද, ප්‍රකෝටි අටක් පමණ වූ අනෙකුත් දෙවි වරුද එතැනට සැපත් වන්නාහ. මෙම සූත්‍රය ආරක්‍ෂා කරන අයට අකල් මරණ සිදුවන්නේ නැත. ඔවුන්ගේ ජීවය සොරා ගනු ලැබූවද ඔවුන්ට එය නැවත ලැබෙනු ඇත.''

ආර්යයන්ගේ කතාව සත්‍ය හා විශ්වසනීය වන බැවින්, පොරොන්දු වූ ලෙසටම ඔබ, සමාජ වන්දනය සඳහා සකස් කරන ලද මණ්ඩල මාළිගය තුළට පැමිණ, පූජාව භාර ගෙන රැස් වූ තථාගතයන් වහන්සේලාගේ ප්‍රතිඥාවන් ප්‍රකාශයට පත් කරමින් සූත්‍රයේ පූජාකර්මය සම්පූර්ණ කිරීම පිණිස අවශ්‍ය සියලු ක්‍රියාකාරිත්වයන්

නිරූපණය කළාහු ය. ඒ ආකාරයෙන්, මෙම සූත්‍රයේ සඳහන් ප්‍රතිලාභ වහාම ලැබෙන ආකාරයට අප හා අනෙකුත් ජීවී සත්වයන් කෙරේ කාරුණික වී, අපහට ආශිර්වාද කරනු මැනවි.

මංජු ශ්‍රී බෝධිසත්ව මහාසත්වයෝ මෙම ගම්භීර හා දුවැන්ත සූත්‍රයෙන් මෙසේ ඉල්ලා සිටියහ: උන්වහන්සේගේ අසීමිත ඥානයේ, මෛත්‍රියේ හා බලයේ ආශිර්වාදයෙන්, මට ද අනෙකුත් ජීවී සත්වයන්ට ද එහි ප්‍රතිලාභ අද අදම ලැබේවා!
මුනීන්ද්‍රයන්ගේ ඉගැන්වීම මල්පල දරා වා!
ජීවී සත්වයෝ සතුටු වෙත්වා, සුවපත් වෙත්වා!
විශේෂයෙන්ම, අනුග්‍රාහකයන් පෙරටු කොට ඇති සාංසාරික ජීවීන්ගේ දෙයාකාර බාධක අන්ධකාරයන් පවිත්‍ර වී, ඔවුන්ගේ දෙයාකාර සංචිතයන් සම්පූර්ණ වේවා!
මහා අවදි බව ඉක්මනින්ම අපට ලැබෙන ලෙසට අප හට ආශිර්වාද කරනු මැනවි!

## ත්‍රාණමුක්ත

අපි ආර්ය ත්‍රාණමුක්ත බෝධිසත්ව මහා සත්වයන්ට වන්දනා කරමු. අපි ඔබවහන්සේට නමස්කාර කොට ඔබගේ සරණ යමු. (7 වරක් කියන්න)

එකී සියලු ආර්යයන් වහන්සේලාට පානීය ජලය, ආලේප, මල්, සුවඳ දුම්, පහන්, ආහාර, තාලවාද්‍යයන්, උඩුවියන් යනාදියද පුද කරමි. ඒ සියල්ලම සැබවින්ම පුද කෙරෙන සැබෑ ද්‍රව්‍යයන් ය. දස දිසාවන්හිම, අයිතිකරුවකු නොමැතිව පවතින දෙව් මිනිසුන්ගේ යහපත් ධනයද, සතුට ලබා ගැනීම සඳහා අවශ්‍ය වන සෑම උත්කෘෂ්ට ද්‍රව්‍යයක්ම ද පුද කරමි. යන්ත්‍ර මන්ත්‍ර බලයෙන් හා භක්තියෙන් ජනනය කරන ලද්දා වූ සමන්තභද්‍රයන්ගේ ශුභ ප්‍රාර්ථනා බලයෙන් මුළු අවකාශයම පිරී යන පරිදි පූජා වලාවන් පුද කරමි.

අනාදිමත් කාලයක් තිස්සේ සසර සැරි සරද්දී අප විසින් ඍණාත්මක අකුශල ක්‍රියා බොහෝ ගණනක් කරන්නට ඇත. කොටින් කිවහොත්, අප කර ඇත්තේ නොකළයුතු දෑය, නොකර ඇත්තේ කළ යුතු දෑය. ඒ වැරදි කවරක් වුවත් ඒ සියල්ලම මම පාපොච්චාරණය කරමි.

තුන් කල්හිම සියලු ආර්යයන් වහන්සේලා හා සාමාන්‍ය මිනිසුන් විසින් කරන ලද පින් හා කුශල මූලයන් පිළිබඳව මම සතුටු වෙමි.
අද්විතීය වූ ධර්මචක්‍රය ප්‍රවර්තනය කරන ලෙස, මම සියලු ජිනවරයන් වහන්සේලා උනන්දු කරවමි.
නිවනට පිවිසීමට තීරණය කළ ලෝක ප්‍රදීප (උත්තම) යන්ගෙන් මා ඉල්ලා සිටින්නේ, ලෝකයාගේ හිත සුව පිණිස බොහෝ කලක් රැඳී සිටින ලෙසයි.
මා කළ යම් වූ කුශලයක් වේ නම්, එය මා හට මෙන්ම අනෙක් අයට ද අද්විතීය ධර්ම ප්‍රත්‍යක්ෂය ලබා ගැනීමට උපකාරී වේවා!
ආර්ය ත්‍රාණමුක්ත උත්තමයාණෙනි!
මෙම නපුරු කාලයේ දුකට පත්ව සිටින, අසරණ ජීවී සත්වයන් කෙරේ කරුණාව උපදවනු මැනවි. ඔබවහන්සේ පෙර ශාක්‍ය මුනී බුදුන්වහන්සේට දම්සභා මණ්ඩපයක දී මෙසේ කී බව භෛෂජ්‍යගුරු සූත්‍රයේ සඳහන් වේ:

''භාග්‍යවතුන් වහන්ස! නොයෙක් අසනීපවලින් ගැටසී ගත් ශරීර ඇත්තා වූ ද, සා පිපාසාවෙන් වියලී ගිය තොල් හා උගුරු ඇත්තාවූ ද, නෑදෑ හිත මිත්‍රාදීන් හා අන්ධකාරය වට කරගෙන යම රජු වෙත ගෙන යනු ලබන්නා වූ ද, ජීවී සත්වයෝ අනාගතයේ දී බොහෝ වන්නාහ. ඔහුගේ සිරුර ඇඳක් මත දපා තිබිය දී ඔහුගේ විඤ්ඤාණය ම ධර්මරාජයන් විසින් රැගෙන යනු ලැබේ. ඉන්පසුව ඔහුගේ ජීවිතයට සම්බන්ධ ඉෂ්ට දේවතාවා ඔහුගේ පුණ්‍ය හා පාප ක්‍රියා පිළිබඳව යම රජුට වාර්තා කරන්නේ ය. යම රජ ඔහු කළ පින් පව් සසඳා බලා සුදුසු ලෙස දඬුවම් නියම කරන්නේ ය. අසනීප වූ අයකු වෙනුවෙන්, ඒ පුද්ගලයාගේ ඥාති මිත්‍රාදී හු භෛෂජ්‍යගුරු-වෛඩූර්යප්‍රභ-රාජ භාග්‍යවතුන් සරණ ගොස් උන්වහන්සේට නියමිත ආකාරයෙන් පූජාවන් ද පැවැත්විය යුත්තා හු ය. එසේ කළ හොත්, සිහිනයක දී මෙන් ඒ පුද්ගලයාගේ විඥානය ආපසු ආ හැක්කේ ය. ඒ ආකාරයෙන්, දින 7කින්, 21 කින්, දින 35කින් හෝ දින 49කින් ඒ පුද්ගලයාගේ විඥානය ආපසු අවුත් සිහිය එනු ඇත. එවිට ඒ පුද්ගලයාට කුශල හා අකුශල කර්මවල ප්‍රතිඵල පිළිබඳ ඍජු සංජානනයක් ඇති වේ; ඉන්පසුව ඒ පුද්ගලයා තම ජීවිතය ගිය ද පාපකර්ම නොකරනු ඇත්තේ ය.''

පූජා ක්‍රියාවලිය සම්බන්ධයෙන් කියතොත් ආනන්දයෙනි, අසනීපය සුව වේවා යයි පතන අනෙක් අය, දිවා රාත්‍රී සතක්ම අටසිල් (පෙහෙවස්) සමාදන් වී සිටිය යුතු අතර, සංඝයාවහන්සේට දාන මාන ආදිය ද කළ යුතුය. ඔවුහු දහවල් කාලයේ තෙවරක් ද, රාත්‍රී කාලයේ තෙවරක් ද භෛෂජ්‍යගුරු - වෛඩූර්යප්‍රභ-රාජ භාග්‍යවතුන් වහන්සේ වෙත සිත ඒකාග්‍ර කරගෙන මෙනෙහි කරමින් සිටිය යුත්තාහ. මෙම සූත්‍රය ද 49 වතාවක් සජ්ඣායනය කළ යුතුය. පිළිම සතක් නිර්මාණය කොට ඒ පිළිම ඉදිරියේ කරත්ත රෝදයක් ප්‍රමාණ පහන් සතක් දල්වා තැබිය යුතුය. ඒ පහන් 49 දවසක් යන තුරු නොනිමී තිබිය යුතුය. පංච වර්ණ කොඩි ද 49 කට වඩා සෑදිය යුතුය.

''ආනන්දයෙනි, අසනීප, කැරලි ගැසීම්, ආක්‍රමණ, චන්ද්‍ර සූර්ය ග්‍රහණ, උල්කාපාත ඇතිවීම, සැඩසුළං, තද වැසි හෝ ඉඩෝරය නිසා හානියක්, වසංගතයක් හෝ අසනීප ඇති වී නම්, ක්ෂත්‍රිය රජු කළ යුත්තේ පරහිතකාමී බව වර්ධනය කරමින්, සිරගත කර සිටින්නන් නිදහස් කිරීම ය. ඉන්පසුව ඒ රජු භෛෂජ්‍යගුරු වෛඩූර්ය ප්‍රභ-රාජ භාග්‍යවතුන් වහන්සේට නියම ආකාරයෙන් පූජා පැවැත්වුව හොත්, රජුගේ කුශල මූලයන් නිසා හා භෛෂජ්‍යගුරු වෛඩූර්ය ප්‍රභ රාජයන්ගේ පූර්ව විශේෂ ප්‍රාර්ථනාවන්ට අනුකූලව, එම රටේ වැසියෝ සතුටට පත් වෙති; ධාන්‍යවලින් හොඳ අස්වැන්නක් ලැබෙනු ඇත; දේශගුණය ද අනුකූල වනු ඇත. එම රටේ සියලු ජීවී සත්වයන්ට සුවය, සතුට හා ප්‍රීතිය ලැබේ. එම රට තුළ නපුරු යක්ෂ භූතාදීන් ගේ උපද්‍රව ඇති නොවනු ඇත; අශුභ ලකුණු ද පහළ නොවනු ඇත. ඒ රටේ රජුගේ ජීවිත කාලය දීර්ඝ වී, ඒ පුද්ගලයා පැහැපත් සිරුරින් යුතු, නිරෝගී හා බලවත් අයෙකු බවට පත් වනු ඇත.''

සූත්‍රයෙන් දක්වා තිබුණේ එසේ ය.

ආර්යයන් වහන්සේලාගේ කථාව සත්‍ය හා විශ්වසනීය වන බැවින්, පොරොන්දු වූ ලෙසටම ඔබ සමාජ වන්දනය සඳහා සකස් කරන ලද, මණ්ඩල මාළිගය තුළට පැමිණ පූජාව භාරගෙන, රැස් වූ තථාගතයන් වහන්සේලාගේ ප්‍රතිඥාවන් ප්‍රකාශයට පත් කරමින්, සූත්‍රයේ සියලු ක්‍රියාකාරිත්වයන් නිරූපණය කළාහු ය. ඒ ආකාරයෙන්, මෙම සූත්‍රයේ සඳහන් ප්‍රතිලාභ වහාම ලැබෙන ආකාරයට, අප හා අනෙකුත් සියලු ජීවී සත්වයන් කෙරේ කාරුණික වී අපහට ආශිර්වාද කරනු මැනවි!

අරාජික වීම්, අසනීප, මරණය, ආදී අභාග්‍ය සම්පන්න තත්ත්වයන් සමනය වී, සතුට හා සුවපත් බව ඇති වේවා යි ත්‍රාණමුක්තයෝ ප්‍රාර්ථනා කළහ.
උන්වහන්සේගේ අසීමිත ඥානයේ, මෛත්‍රියේ හා බලයේ ආශිර්වාදයෙන්,
මට ද අනෙකුත් ජීවී සත්වයන්ටද එහි ප්‍රතිලාභ අද අදම ලැබේ වා!
මුනීන්ද්‍රයන්ගේ ඉගැන්වීම මල්පල දරා වා!
ජීවී සත්වයෝ සතුටු වෙත්වා, සුවපත් වෙත්වා!
විශේෂයෙන්ම අනුග්‍රාහකයන් පෙරටු කොට ඇති සාංසාරික ජීවීන්ගේ දෙයාකර බාධක අන්ධකාරයන් පවිත්‍ර වී, ඔවුන්ගේ දෙයාකර සංචිතයන් සම්පූර්ණ වේ වා!
වහා අවදි බව ඉක්මනින්ම අපට ලැබෙන ලෙසට,
අප හට ආශිර්වාද කරනු මැනවි!

## වජ්‍ර පානි ආදී හු

බෝධිසත්ව මහාසත්ව ශ්‍රී වජ්‍රපානි යනාදීන් ඇතුළු සමස්ත බෝධිසත්ව ප්‍රජාවටම නමස්කාර වේ වා! අපි ඔබවහන්සේලාට වන්දනා කරමු, ඔබගේ සරණ යමු.

(7 වරක් කියන්න)

බ්‍රහ්මයන්ට ද, දෙවියන්ගේ ප්‍රධානියා වූ ඉන්ද්‍රයන්ටද, ධෘතරාෂ්ට්‍ර, විරූඪ, විරූපාක්ෂ, වෛශ්‍රවණ (කුවේර) යනා දී වූ ධර්මාරක්ෂක ගිහි අනුගාමිකයන්ට නමස්කාර වේ වා! අපි ඔබට වන්දනා කරමු, ඔබේ සරණ යමු.

(3 වරක් කියවන්න)

එකී සියලුම ආර්යයන් වහන්සේලාට මම, පානීය ජලය, ආලේප, සුවඳ දුම්, මල්, පහන්, ආහාර, තාලවාද්‍යයන්, උඩුවියන් යනාදිය ද පුද කරමි. ඒ සියල්ලම සැබවින්ම පුද කෙරෙන සැබෑ ද්‍රව්‍යයන් ය. දස දිසාවන්හිම, අයිතිකරුවකු නොමැතිව පවතින, දෙව් මිනිසුන්ගේ යහපත් ධනයද සතුට ලබා ගැනීම සඳහා අවශ්‍ය වන සෑම උත්කෘෂ්ට ද්‍රව්‍යයක් ම ද පුද කරමි. යන්ත්‍ර මන්ත්‍ර බලයෙන් හා භක්තියෙන් ජනනය කරන ලද්දා වූ සමන්තභද්‍රයන්ගේ ශුභ ප්‍රාර්ථනා බලයෙන්, මුළු අවකාශයම පිරී යන පරිදි පූජා වලාවන් පුද කරමි.

අනාදිමත් කාලයක් තිස්සේ සසර සැරිසරද්දී අප විසින් ඍණාත්මක අකුශල ක්‍රියා බොහෝ ගණනක් සිදු කරන්නට ඇත. කොටින් කිවහොත්, අප කර ඇත්තේ නොකළ යුතු දෑය, නොකර ඇත්තේ කළ යුතු දෑ ය. ඒ වැරදි කවරක් වුවත්, ඒ සියල්ලම මම පාපොච්චාරණය කරමි.

තුන් කල්හිම සියලු ආර්යයන් වහස්සේලා හා සාමාන්‍ය මිනිසුන් විසින් කරන ලද පින් හා කුශල මූලයන් පිළිබඳව මම සතුටු වෙමි.
අද්විතීය වූ ධර්ම චක්‍රය ප්‍රවර්තනය කරන ලෙස මම සියලු ජිනවරයන් වහන්සේලා උනන්දු කරවමි.
නිවනට පිවිසීමට තීරණය කළ ලෝක ප්‍රදීප (උත්තම) යන්ගෙන් මා ඉල්ලා සිටින්නේ, ලෝකයාගේ හිත සුව පිණිස බොහෝ කාලයක් රැඳී සිටින ලෙස ය.

මා කළ යම් වූ හෝ කුශලයක් වේ නම්, එය මා හට මෙන්ම අනෙක් අයට ද අද්විතීය ධර්ම, ප්‍රත්‍යක්ෂ ලබා ගැනීමට උපකාරී වේවා!

අපි මෙම හෝම පූජාව, දස දිසාවන්හිම ආරක්ෂකයන්ට සහ පිරිවර සහිත සතර වරම් රජ දරුවන්ට පුද කරමු; බුදුන් වහන්සේගේ ඉගැන්වීම් පතුරුවා හැරීම සඳහා සහ ජීවී සත්වයන් අතර සතුට හා සුවසෙත ජනනය කිරීම සඳහා විශේෂ කාර්යයන් ද සිදු කරන්නෙමු.

බෝධිසත්ව මහාසත්ව වජ්‍රපානීද, බ්‍රහ්මරාජයාද, දෙවියන්ගේ නායක වූ ඉන්ද්‍රයාද, ධ්‍රැතරාෂ්ට්‍ර, විරූඪක, විරූපාක්ෂ, කුබේර (වෛශ්‍රවණ) හා ආර්ය ධර්මය ආරක්ෂා කරන දෙව් මිනිස් අනුගාමිකයෝ ද, දෙවියන්ගේ සත්‍ය වචනයෙන් මෙම ගරුගම්භීර ප්‍රකාශය කරමින් පොරොන්දු වූහ:

> භාග්‍යවතුන් වහන්ස!
>
> අපි සත් බුදුන්වහන්සේලාගේ විස්තෘත විශේෂ පූර්ව ආයාචනා ගැන අසා ඇත්තෙමු. තථාගතයන් වහන්සේලා සෘජුවම දුටු අපි උන්වහන්සේලාට වන්දනා කෙළෙමු. එසේම භාග්‍යවතුන් වහන්ස! අපි අපගේ සේවකයන්ද සමග එම නාමයන් හා තථාගත ධාරණී වචන භාවිත කෙරෙන ඕනෑම තැනකට යන්නෙමු. අපි මෙම සූත්‍රය කියවන්නා වූ ද, එයට නමස්කාර කරන්නා වූ ද, එය පිටපත් කරන්නා වූ ද කුලපුත්‍රයන් හා කුල දුහිතෘන් සමග සුසංගත වී සිටිමින් එය පිටපත් කිරීමට උදව් වන්නෙමු. තථාගතයන්වහන්සේලාගේ ආශිර්වාදයද සමග මෙම සූත්‍ර රාජයාගේ පිටපත් ආරක්ෂා කරන කුලපුත්‍රයන්ද, කුල දූවරුන්ද, රජවරුන්ද, ඇමතිවරුන්ද අපි ආරක්ෂා කරන්නෙමු. අපි කඩවීදිද, නගරද, ප්‍රදේශද ආරක්ෂා කරන්නෙමු. අපි සියලු අසනීපද, මරණයද, සතුරන්ද, හුදකලාවීම් ද සමනය කරන්නෙමු. අපි සියලු තථාගතයන් වහන්සේලාට හා ජීවී සත්වයන්ට හිතකාමී වන්නෙමු. උන්වහන්සේලාට අපගේ ණය ගෙවමින්, සියලු අකල් මරණ වළක්වන්නෙමු. අපි සියලු දබරයන්, සටන්, තර්ක කිරීම් හා භේදභින්න වීම් දැඩිව සමනය කරන්නෙමු. ඔවුන්ට අවශ්‍ය සියලු දේ ලැබෙන ලෙසටද ඔවුන්ගේ සිත කය දෙකට ම පහසුවක් ලැබෙන ලෙසටද අපි ක්‍රියා කරන්නෙමු. ඔවුන්ගේ ධනය, ධාන්‍ය හා බලය වැඩි කර දෙන්නෙමු. සෑම ආකාරයකින්ම අපි ඔවුන් ආරක්ෂා කරන්නෙමු. ඒ කුලපුත්‍රයා හෝ කුල දුහිතෘව, අප කළ ශපථයන් හා ප්‍රතිඥාවන් මෙනෙහි කළ යුතු වන්නේ ය.

**තද්යථා/අසුම සුතර සුම මසු/සුරේ හහුහේ/මු මු මු/ජු ජුරේ ජුර ස්වාහා/**

මෙම තථාගත නාමයන් හා ධාරණී වචන වලට ගරු සරු ඇතිව වන්දනා කරමින් ඒවා ළඟ තබා ගන්නා, කියවන, පිටපත් කරන හා කරවන සියලු දෙනාම ත්‍රිවිධ අපාය භූමීන්ට නොවැටෙන බව දත යුත්තේ ය. ඔවුන් සත්‍ය වූ අනුත්තර සම්‍යක් සම්බෝධියෙන් ආපසු නොහැරෙනු ඇත. ඔවුන් තමා අපේක්ෂා කරන ඕනෑම බුද්ධක්ෂේත්‍රයක උපදිනු ඇත්තේ ය; තථාගතයන් දකිනු ඇත්තේ ය. ඔවුන්ට තම පෙර ජීවිත මතක් කළ හැකිවන්නේ ය; සමාධිය හා පරිපූර්ණ මතකයද ලැබෙන්නේ ය.

ඉන්පසු වජ්‍රපානි බෝසත් තෙමේ, තථාගතයන් වහන්සේලාට මෙසේ කීයඃ

''සූත්‍ර රාජයා ආරක්ෂා කරන්නන් සඳහා, මම මෙම ධාරණී මන්ත්‍ර වචන ප්‍රදානය කරමි; භාග්‍යවතුන් වහන්ස! මා වෙත අවධානය යොමු කරනු මැනවි. මම සත් බුදුන්වහන්සේලාටද, සියලු වජ්‍රධරයන්ටද නමස්කාර කරමි.

**තද්යථා/ඕං වජ්රේ වජ්රේ මහා වජ්රේ**
**වජ්ර පාශ ධාරණී/සම සම/සමන්ත/**
**අප්‍රතිහත වජ්රේ/ශම ශම/ප්‍රශමන්තු/**
**සර්ව ව්‍යාධය/කුරු කුරු සර්ව කර්මනි**
**සමයං අනුස්මර භගවාන් /වජ්‍රපානි**
**සර්වෂං මේ පරිපූරය ස් වා හා//**

භාග්‍යවතුන් වහන්ස! මෙම තථාගතයන් වහන්සේලාගේ පූර්ව විස්තෘත ප්‍රාර්ථනා හා නාමයන් ද ධර්ම සූත්‍ර යන්ද තබා ගන්නා හා කියවන අයගේ අපේක්ෂා සියල්ල මම සම්පූර්ණ කරන්නෙමි. ඔවුන් මා දකින්නට කැමති නම්, මෙම ධර්ම සූත්‍රය පිටපත් කරගත යුතුය. මෙම තථාගතයන් වහන්සේලාගේ පිළිම හතක් ද සාදවා ගත යුතුය. වජ්‍රාධර වජ්‍රාපානී වන මගේ පිළිමයක් ද ස්තූපයක් ද සාදාගත යුතුය. එසේම, පෙර සඳහන් කළ පරිදි ඔවුන් එම තථාගතයන් වහන්සේලාට සුවඳ කුඩු, සුවඳ දුම්, පහන්, මාලා, අබරණ, වාද්‍ය සංගීතය, තාලම්පට, බෙර යනාදියෙන් පූජා පවත්වා ඒ වටා පැදකුණු කළ යුතුය. ධාරණී මන්ත්‍රයේ වචනද උච්චාරණය (සජ්ඣායනය) කළ යුතුය. ඔවුන් ආර්ය අෂ්ටාංගික මාර්ගය අනුගමනය කරමින් තුන් වරක් ස්නානය කොට, තුන් වරක් ඇඳුම් මාරු කළ යුතුය. ඔවුන් විද්‍යා මන්ත්‍රය සෑම දිනම, චන්ද්‍ර මාසයේ අටවැනි දින ආරම්භ කොට ඊ ළඟ චන්ද්‍ර මාසයේ 15 වැනි දින දක්වා කෙනෙකු දිනකට 108 වතාව බැගින් සජ්ඣායනය කළ හොත් මම ඔවුන්ට සිහිනයක් තුළ දී පෙනී සිටිමි; පෙනී සිට අවශ්‍ය උපදෙස් දෙමි. මම ඔවුන්ගේ සියලු අපේක්ෂා ඉටු කරමි.''

ආර්ය පුද්ගලයන්ගේ කථාව අතිශයින් විශ්වසනීය වූවක් වන බැවින්, පොරොන්දු වූ ලෙසටම අද ඔබ පොදු වන්දනය සඳහා සකස් කරන ලද මෙම මණ්ඩල මාළිගය තුළ රැඳී සිටිමින්, පූජාවන් පිළිගෙන, සූත්‍රයේ පිළිවෙත් සම්පූර්ණ කිරීම සඳහා මෙම සභාව සමග පුදුම උපදවන සුලු ක්‍රියාකාරිත්වයක නිරත වූවා හු ය. එසේ සූත්‍රයේ සඳහන් සියලු ප්‍රතිලාභයන් අපට හා අනෙකුත් සියලු ජීවී සත්වයන්ට ලබා ගත හැකි වන පරිදි අප කෙරේ කරුණාවෙන් අප හට ආශිර්වාද කරනු මැනවි.

එසේම, විශේෂයෙන්ම, ''සත් බුදුන් වහන්සේලාගේ විශේෂ පූර්ව ප්‍රණිධාන ආයාචනා පිළිබඳ' විස්තෘත සූත්‍රය'' බොහෝ කාලයක් සමාජය තුළ රැඳී පවතින ආකාරයේ ආගමික කාර්යයන්හි ද කරුණාකර යෙදෙනු මැනවි.

එසේම මෙම දේශය තුළ, ජීවී සත්වයන්ට හානි පමුණුවන නොයෙක් දුෂ්ට භූත කොටස් සැරිසරන්නාහ. ඔවුහු ධර්ම අනුගාමිකයන්ට සෑම අතින්ම බාධා පමුණුවති. සෑම ආකාරයකින්ම ඔවුන් අයත් වන්නේ මාර පිරිසට ය. ඔවුහු මිනිසුන් හා තිරිසනුන් අතර රෝග පතුරුවා ලති; වැසි, ඉඩෝර හිම මගින් වගාවන්ට හානි කරති. නපුරු, අශුභ ලකුණු ද එවිට පහළ වේ. පෙර කර්ම අනුව හෝ තාවකාලික තත්ත්වයන් යටතේ හෝ අප ඝාතනය කරන්නා වූ ද, නොයෙක් නෑදෑ පවුල් පරම්පරාවල හොල්මන් කරන්නා වූ ද යක්ෂයෝ සිටිති. ඔවුහු අපට හා අන් අයට නොයෙක් ආකාරයෙන් හානි කරති. ඔවුහු අපගේ සිරුරු වලටද, ජීව බලයටද, ශක්තියටද, අවධානයටද, අවශ්‍යතාවනටද නොයෙක් ආකාරයෙන් හානි කරති.

එම දුෂ්ට භූතයන් දමනය කිරීමට කළ හැකි දෙයක් කරනු මැනවි. තම දුෂ්ටකම් හා පළිගැනීම් නතර කරන ලෙසට ඔවුන්ට බලකර සිටිනු මැනවි, ඔවුන් ශාන්ත, ගුණවත්, යහපත්, හිතකාමී අයද බවට පත් කරනු මැනවි. ඔවුන්ගේ ගෝත්‍රයන්ට ගැළපෙන සේ, හානි කර ක්‍රියාකාරිත්වයන්ගෙන් සම්පූර්ණයෙන්ම අත් මිදෙන බවට ඔවුන් ශපථ කරවා ගනු මැනවි. එය සභාවක් ඉදිරියේ නියම ආකාරයෙන් පොරොන්දු වීමට සලස්වනු මැනවි. රහස්‍ය ගුරු වජ්‍රපානීගේ හා අනෙකුත් අයගේ ප්‍රතිඥාවලද, ධාරණී ප්‍රදානයේ ද, වජ්‍රපානී සාධනයේ ද ප්‍රතිඵලයට අනුව,

උන්වහන්සේගේ අසීමිත ඥානයේ, මෛත්‍රියේ හා බලයේ ආශිර්වාදයෙන් බලගැන් වී,

අප මෙන්මද සියලු ජීවී සත්වයෝ ද එහි ප්‍රතිඵල අද අදම භුක්ති විඳිත් වා!

මුනීද්‍රයන්ගේ ඉගැන්වීම මල්පල දරා වා!

ජීවී සත්වයෝ සතුටු වෙත්වා, සුවපත් වෙත්වා!

විශේෂයෙන්ම, අනුග්‍රාහකයා, පෙරටු කොටගත් සංසාරික ජීවී සත්වයෝ, බාධකයන්ගෙන් ඉවත් වී පිරිසිදුව, සංචිතයන් පූරණය කරත් වා!

ඔවුහු සෑම වර්ගයකම බාධකයන්ගෙන් ආරක්‍ෂා වී අවශ්‍ය සියලු තත්ත්වයන් ලබත්වා!

මහා අවදි බව ඉක්මනින්ම ලබා ගැනීම සඳහා අප හට ආශිර්වාද කරන සේක් වා!

## <u>යක් සෙනවියෝ දොළොස් දෙනා</u>

බලය හා කීර්තිය සහිත ගිහි අනුගාමිකයන් දොළොස් දෙනාට නමස්කාර වේ වා!

මහා යක් සෙනවි කිම්භීරයන්ට නමස්කාර වේවා!

අපි ඔබට වන්දනා කොට ඔබ සරණ යමු!

මහා යක් සෙනෙවි වජ්‍රයන් නමදිමු!

අපි ඔබට නමස්කාර කොට ඔබ සරණ යන්නෙමු!

මහා යක් සෙනෙවි මේඛිලයන් නමදිමු!

අපි ඔබට නමස්කාර කොට ඔබ සරණ යන්නෙමු!

මහා යක් සෙනෙවි අන්නිලයන් නමදිමු!

අපි ඔබට නමස්කාර කොට ඔබ සරණ යන්නෙමු!

මහා යක් සෙනවි සන්තිලයන් නමදිමු!

අපි ඔබට නමස්කාර කොට ඔබ සරණ යන්නෙමු!

මහා යක් සෙනවි ඉන්දලයන් නමදිමු!

අපි ඔබට නමස්කාර කොට ඔබ සරණ යන්නෙමු!

මහා යක් සෙනවි පායිලයන් නමදිමු!

අපි ඔබට නමස්කාර කොට ඔබ සරණ යන්නෙමු!

මහා යක් සෙනෙවි මහාලයන් නමදිමු!

අපි ඔබට නමස්කාර කොට ඔබ සරණ යමු!

මහා යක් සෙනවි චිදාලයන් නමදිමු!

අපි ඔබට නමස්කාර කොට ඔබ සරණ යමු!

මහා යක් සෙනවි චෞන්ඩුලයන් නමදිමු!

අපි ඔබට නමස්කාර කොට ඔබ සරණ යමු!

මහා යක් සෙනවි විකලයන් නමදිමු!

අපි ඔබට නමස්කාර කර ඔබ සරණ යමු! (3 වරක්)

එකී සියලුම ආර්යයන්ට මම පානීය ජලය, ආලේප, මල්, සුවඳ දුම්, පහන්. ආහාර, තාල වාද්‍යයන්, උඩුවියන් යනාදිය ද, පුද කරමි. ඒ සියල්ලම සැබවින්ම පුද කෙරෙන සැබෑ ද්‍රව්‍යයන් ය. දස දිසාවන්හිම අයිතිකරුවකු නොමැතිව පවතින, දෙව් මිනිසුන්ගේ යහපත් ධනයද, සතුට ලබා ගැනීම සඳහා අවශ්‍ය වන සෑම උත්කෘෂ්ට ද්‍රව්‍යයක් ම ද පුද කරමි. යන්ත්‍ර මන්ත්‍ර බලයෙන් හා භක්තියෙන් ජනනය කරන ලද්දා වූ සමන්තභද්‍රයන්ගේ ශුභ ප්‍රාර්ථනා බලයෙන්, මුළු ආකාශයම පිරී යන පරිදි පූජා වලාවන් පුද කරමි.

අනාදිමත් කාලයක් තිස්සේ සසර සැරි සරද්දී, අප විසින් සෘණාත්මක අකුශල ක්‍රියා බොහෝ ගණනක් සිදු කරන්නට ඇත. කොටින් කිවහොත්, අප කර ඇත්තේ නොකළ යුතු දෑය, නොකර ඇත්තේ කළ යුතු දෑය. ඒ වැරදි කවරක් වුවත්, ඒ සියල්ලම මම පාපොච්චාරණය කරමි.

තුන් කල්හිම සියලු ආර්යයන් හා සාමාන්‍ය මිනිසුන් විසින් කරන ලද පින් හා කුශල මූලයන් පිළිබඳව මම සතුටු වෙමි.

අද්විතීය වූ ධර්මචක්‍රය ප්‍රවර්තනය කරන ලෙස මම සියලු ජිනවරයන් උනන්දු කරවමි.
නිවනට පිවිසීමට තීරණය කළ ලෝක ප්‍රදීප (උත්තම) යන්ගෙන් මා ඉල්ලා සිටින්නේ, ලෝකයාගේ හිත සුව පිණිස බොහෝ කලක් රැඳී සිටින ලෙස ය.
මා කළ යම් වූ හෝ කුශලයක් වේ නම්, එය මා හට මෙන්ම අනෙක් අයට ද අද්විතීය ධර්ම ප්‍රත්‍යක්ෂය ලබා ගැනීමට හේතු වේ වා!

අපි මෙම මහා ''තොර්මා'' දානය මහා යක්ෂ සේනාධිපතියන්ට හා ඔවුන්ගේ අනුගාමිකයන්ට පුද කරමු. බුදු දහම පතුරුවා හැරීමේ සහ දායකයන්ගේ බාධක සමනය කිරීමේ මා හැගි කටයුත්තෙහි යෙදෙනු මැනවි. ද්වාදස මහා යක්ෂ සේනාධිපතිවරුනි! ලක්ෂ හත බැගින් වූ පිරිවර සහිත වූද, බලය හා කීර්තිය සහිත වූ ද, ගිහි අනුගාමිකයනි! කරුණාකර අප වෙත අවධානය යොමු කරනු මැනවි!

පෙර ඔබ, සභාවේ දී, දෙවියන්ගේ සත්‍ය වචනයෙන් සාමූහිකව මෙසේ කීවාහුයඃ

''බුදුන් වහන්සේගේ බලයෙන් අපට භෛෂජ්‍යගුරු වෛඩූර්ය ප්‍රභ-රාජ තථාගතයන් පිළිබඳව අසන්නට ලැබුණේය. අපි පාපී භූමීන් වෙත යාමට බිය නොවෙමු. එබැවින් පොදුවේ එකාවන්ව අප ජීවත්වන තුරා අපි බුදුන් සරණ යන්නෙමු; දහම් සරණ යන්නෙමු, සඟ සරණ යන්නෙමු. සියලු ජීවී සත්වයන්ගේ අරමුණු පිළිබඳවද, යහපත ගැනද, සතුට ගැන ද අපි උනන්දු වන්නෙමු. විශේෂයෙන්ම, මෙම සූත්‍රය ප්‍රගුණ කරනු ලබන කවර හෝ නගරයක, දිස්ත්‍රික්කයක හෝ හුදකලා තැනක වුව, භෛෂජ්‍යගුරු වෛඩූර්ය ප්‍රභ-රාජ භාග්‍යවතුන් වහන්සේගේ නාමය ඇසෙන්නා වූ ද, උන්වහන්සේට වන්දනා කරන්නා වූ ද, උවටැන් කරන්නා වූ ද කවර හෝ තැනක් ඇත්නම්, අපි ඒ ස්ථානවල ඒ ක්‍රියා කරන

සියලු ජීවී සත්වයන් ආරක්ෂා කරන්නෙමු. අපි ඔවුන් තරයේ රැක බලා ගනිමු. ඔවුන් හානිවලින් නිදහස් කර ගනිමු, ඔවුන්ගේ සියලු අපේක්ෂා ඉටු කරන්නෙමු.''

ඔබ එය පොරොන්දු වූ අතර එය ප්‍රතිඥාවක් ලෙස තබා ගත්හ. එසේම භාග්‍යවතුන් වහන්සේ මෙම අණ ද දුන්හ: ''ඔබ භෛෂජ්‍යගුරු වෛඩූර්ය ප්‍රභ-රාජ තථාගතයන් මතක තබා ගැනීමට, ඔබගේ ණය ගෙවීමට ගන්නා උත්සාහය යහපත් ය, එය ඉතා යහපත් ය!''

එසේම, පොදු වන්දනය සඳහා අද නිර්මාණය කරන ලද මෙම මණ්ඩල මාළිගය තුළ, ඔබගේ සාන්ත දාන්ත පිරිවර සමග පූජා පැවැත්වීමටද, සූත්‍රයේ පිළිවෙත් සම්පූර්ණ කිරීමට අවශ්‍ය දෑ කිරීමට ද ඔබ එකඟ වූවා හුය. සඳහන් කළ සියලු ප්‍රතිලාභයන් ලබා ගැනීම සඳහා අප ද, අනෙක් සියලු ජීවී සත්වයන් ද බල ගන්වනු මැනවි!
කරුණාකර විශේෂයෙන්ම, ''සත් බුදුන් වහන්සේලාගේ පූර්ව විශේෂ ප්‍රණිධාන ආයාචනා පිළිබඳ විස්තෘත සූත්‍රයේ'' ඇතුළත් සද්ධර්මය බොහෝ කලක් මල් පල දරනු පිණිස කළ යුතු ආගමික කෘත්‍යයන් කරනු මැනවි!

එසේම මෙම දේශය තුළ, ජීවී සත්වයන්ට හානි පමුණුවන නොයෙක් භූත කොටස් සැරිසරන්නාහ. ඔවුහු ධර්ම අනුගාමිකයන්ට සෑම අතින්ම බාධා පමුණුවති. සෑම ආකාරයකින්ම ඔවුන් අයත් වන්නේ මාර පිරිසට ය. ඔවුහු මිනිසුන් හා තිරිසනුන් අතර රෝග පතුරුවා ලති, වැසි, ඉඩෝර හා හිම මගින් වගාවන්ට හානි කරති. නපුරු අශුභ ලකුණු ද එවිට පහළ වේ. පෙර කර්ම අනුව හෝ තාවකාලික තත්ත්වයන් යටතේ අප ඝාතනය කරන්නා වූ ද, නොයෙක් නෑ දෑ පවුල් පරම්පරාවල සොල්මන් කරන්නා වූ ද යක්ෂයෝ බොහෝ වෙති. ඔවුහු අපට හා අන් අයට නොයෙක් ආකාරයෙන් හානි කරති. ඔවුහු අපගේ සිරුරුවලටද, ජීව බලයටද, ශක්තියටද, අවධානයටද, අවශ්‍යතාවනටද නොයෙක් ආකාරයෙන් හානි කරති.

එම දුෂ්ට භූතයන් දමනය කිරීමට කළ හැකි ඕනෑම දෙයක් කරනු මැනවි. තම දුෂ්ටකම් හා පළිගැනීම් නතර කරන ලෙසට ඔවුන්ට බල කර සිටිනු මැනවි. ඔවුන් ශාන්ත, ගුණවත්, යහපත්, හිතකාමී අයද බවට පත් කරනු මැනවි. ඔවුන්ගේ පැරණි සියලු හානිකර ක්‍රියාකාරිත්වයන් නවතා දැමීමට උදව් කරනු මැනවි . ඔවුන්ගේ ගෝත්‍රයන්ට ගැළපෙන සේ, හානිකර ක්‍රියාකාරිත්වයන්ගෙන් සම්පූර්ණයෙන්ම අත්මිදෙන බවට ඔවුන් ශපථ කරවා ගනු මැනවි. එය සභාවක් ඉදිරියේ නියම ආකාරයෙන් පොරොන්දු වීමට ද සලස්වනු මැනවි.

මෙම සූත්‍රයේ දී ම යක්ෂයෝ සත්‍යය දැක එහි ඇතුළත් දෑ හා එය ප්‍රගුණ කරන අයද රැක ගන්නා බවට පොරොන්දු වූහ. එහි අසීමිත ඥානයේ, මෛත්‍රියේ හා ජවයේ ආශිර්වාදයෙන් බලගැන් වී,
එහි ප්‍රතිලාභ අදම විඳින්නට මට ද අනෙකුත් සංසාරික ජීවීන්ට ද හැකි වේවා!
මුනීන්ද්‍රයන්ගේ ඉගැන්වීම් මල්පල ද රා වා!

ජීවී සත්වයෝ සතුටු වෙත්වා, සුවපත් වෙත්වා! විශේෂයෙන්ම අනුග්‍රාහකයා පෙරටු කොටගත් සාංසාරික ජීවී සත්වයෝ, බාධකයන්ගෙන් ඉවත් වී පිරිසිදුව, සංචිතයන් පූරණය කරත්වා!
ඔවුහු සෑම වර්ගයකම බාධකයන්ගෙන් ආරක්ෂා වී අවශ්‍ය සියලු තත්ත්වයන් ලබත් වා!
මහා අවදි බව ඉක්මනින් ලබා ගැනීම සඳහා අප හට ආශිර්වාද කරන සේක් වා!

## තෝර්මාව ප්‍රාදේශීය දෙවිවරුන්ට භාර කිරීම

පංචේන්ද්‍රියයන් පිනවන ආකාරයේ ගුණාංගයන් ගෙන් යුතු මෙම තෝර්මා පිදේනිය අප පූජා කරන්නේ ටිබැට් හිම දේශය ආරක්ෂා කරන්නා වූ විශේෂයෙන්ම, එම ප්‍රදේශයේ පන්සල්, නගර හා නිවෙස් ආරක්ෂා කරන, පෘථිවි දේවතාවිය වූ ඩෙන්මා, හා විශේෂයෙන්ම එම ප්‍රදේශයේ පන්සල් නගර හා නිවෙස් ආරක්ෂා කරන නාග, පෘථිවි දේවතාවියන් දොළොස් දෙනා ආදී අමනුෂ්‍යයන් වෙනුවෙනි. අප ඔබ සියලු දෙනාගෙන් ඉල්ලා සිටින්නේ, ප්‍රතිවිරුද්ධ තත්ත්වයන් සමනය කොට, ගුරු උතුමන්ට හා ශිෂ්‍යයන්ට ධර්මය ප්‍රගුණ කිරීම සඳහා පහසුකම් ඇති කර දෙන ලෙසයි.

| |
|---|
| එය එක් එක් කෙනාට පුද කරන්න. ආයාචනය සම්පූර්ණ කළ පසු ධාරණී මන්ත්‍ර සජ්ඣායනය කොට සෝදා හරින්න. |

- **තද්‍යථා/සුමේ සුමේ/ඉමි නිමි හි මති මති මති සප්තතථාගත සමාධ්‍යධිෂ්ඨිතේ/අතේ මතේ/පලේ පාපං ශෝධනි/සර්ව පාපං නාශය මම බුද්ධ බුද්ධෝත්තමේ/උමේ කුමේ/බුද්ධක්ෂේත්‍ර පරිශෝධනි/ධම නිධමේ මේරු මේරු මේරුශිඛරේ/සර්ව අකාල මෘත්‍යුං නිවාරණි/බුද්ධේ සුබුද්ධේ බුද්ධ අධිෂ්ඨාන/රක්ෂන්තු මේ/සර්ව දේවාඃ සමේ අසමේ හරන්තු මේ/සර්ව බුද්ධ බෝධිසත්ව/ශමෝ ශමේ/ ප්‍රශමන්තු මේ/ සර්ව ඉත්‍යුපද්‍රව ව්‍යාධයඃ පූරණේ පූරණි පූරය මේ/සර්ව ආශය/වෛඩූර්ය ප්‍රතිභාසේ සර්ව පාපං ක්ෂයංකරී ස්වාහා තද්‍යථා/ඕං භෛෂජ්‍යේ භෛෂජ්‍යේ මහා භෛෂජ්‍යේ/භෛෂජ්‍ය රාජ සමුද්ගතේ ස්වා හා.**

මෙම මන්ත්‍ර සජ්ඣායනය කිරීමෙන්, සපරිවාර බුදුවරුන් අටදෙනා වහන්සේලාගේ ශුද්ධ වූ චිත්තයන් ක්‍රියාත්මක වීමට පටන් ගෙන, උන්වහන්සේලාගේ සිරුරු වෙතින් කිරණ රැස් දහරා අසීමිත ලෙස විහි දී යමින් බඳුන්වල ඇති ජලයට මිශ්‍ර වී ඒවාට ආශිර්වාද වන බව සිතට නගා ගනිමින් එම මන්ත්‍ර සජ්ඣායනය කරන්න.

වතාවත අවසානයේ දී ස්තුති පූජාවක් ලෙස, දණ්ඩ නමස්කාරය කරන්නට ඔබ සිතනවා නම්, පරම්පරා ව සඳහා නමස්කාරය නැමති කොටසේ සිට ( පිටුව) අෂ්ට තථාගතයන් සඳහා වූ පරම්පරා ගුරුවරු ( පිටුව) යන කොටස දක්වා කොටස් සජ්ඣායනය කරන්න. (පහත සඳහන් ගාථාවල සඳහන් වන්නේ සුගතයන් වහනසේලාගේ කෙටි නම් පමණක් බව සලකන්න)

ඔබගේ නාමය නමැති පවිත්‍ර පුෂ්පය මත ඔබ සිරුර අලංකාර වූයේ දෙතිස් මහ පුරිස් ලකුණු හා අනුව්‍යංජන වලිනි;
එය අසන, දකින, මතකයට නගන සියල්ලෝ උදාර වෙති.
සුපරිකීර්තිත - නාම-ශ්‍රී රාජ ශාස්තෲන් වහන්සේට නමස්කාර වේවා
ඔබ වහන්සේ, අගනා චන්ද්‍ර පද්ම සංකේතයෙන් සැරසුණාහු ය.
ඔබ ඥාන අරමුණු පිළිබඳ ප්‍රාඥයෙක් වන්නාහුය, මහා ඥානයක් ඇත්තාහු ය.
ඔබගේ වචනය සාගරය සේ ගම්භීරය;
පණ්ඩිත තේජඃ ස්වර ඝෝෂ රාජ භාග්‍යවතුන් වහන්ස ඔබට නමස්කාර වේවා!

ඔබ වහන්සේගේ සිරුර දඹරන් ස්තූපයක් වැන්නේ ය;
ජම්බු ගංගාවේ රන් ලෙස දිලිසේ.
දහසක් හිරු පරයන රැසින් එය දිදුලන්නේ ය.
සුවර්ණ භද්‍ර විමල භාග්‍යවතුන් වහන්සේට නමස්කාර වේවා!

ඔබවහන්සේ දුක ඉක්මවා පරම සුඛය ලබාගත්හ;
සාංසාරික ජීවීන්ගේ දුක් පීඩනය ඔබ ඉවත් කරන්නහු.
සයවිධ ජීවීන් රකින ඔබ උදාර වන්නාහුය.
අශෝකෝත්තම භාග්‍යවතුන් වහන්සේට නමස්කාර වේ වා!

ප්‍රතිවිරුද්ධ දෘෂ්ටි ඇති ප්‍රතිවාදීන්,
ඔබ ධර්ම නමැති මහා හඬින් පරදවා ලන්නාහු ය.
ඔබගේ වචනය මුහුද මෙන් ගැඹුරු වන්නේ ය.
ධර්මකීර්ති සාගරඝෝෂ භාග්‍යවතුන් වහන්සේට නමස්කාර වේවා!

ඔබගේ ධර්ම බුද්ධිය, පිරිසිඳ දැනීමට අපහසු ලෙසට,
පවිත්‍ර යථාර්ථ ව්‍යාප්තිය තුළ ක්‍රීඩා කරන්නේ ය,
ඥාන අරමුණු සියල්ල ඍජුව දකින්නේ ය.
වික්‍රීඩිතාභිඥ රාජ භාග්‍යවතුන්ට නමස්කාර වේවා!

සියලුදෙනා වෙත සමමෙත ඇති භාග්‍යවතුන් වහන්ස!
ඔබගේ නම ඇසීමෙන්ම පාප භූමීන්හි දුක් දුරුවේ.
ත්‍රිවිධ වසයන්ගේ අසනීප දුර ලන්නා වූ
භෛෂජ්‍යගුරු භාග්‍යවතුන් වහන්සේට නමස්කාර වේවා!

ප්‍රඥාව හා කරුණාව නිසා ශාක්‍ය වංශයේ උපන්,
අපරාජිත මර සෙනඟ පරදවා ජය ගත්තා වූ
ඔබගේ ශරීරය ස්වර්ණ මේරුව සේ දිලෙන්නේය;
ශාක්‍යමුනීන්ද්‍රයන් වහන්ස! ඔබ වහන්සේට නමස්කාර වේවා!

ගංගානම් ගඟේ වැලි කැට හා සමාන බුද්ධ ක්ෂේත්‍රයන් ප්‍රමාණයකට ඔබ්බේ නැගෙනහිර දෙසින්,
අපරාජිත නම් වූ පවිත්‍ර බුද්ධක්ෂේත්‍රයක් ඇත්තේ ය.
සුපරිකීර්තිත - නාම ශ්‍රී -රාජ භාග්‍යවතුන්, අසංඛ්‍ය සංඛ්‍යාත බෝසතුන් පිරිවරා සිටි එහි
කීර්තියට නමස්කාර වේවා!

ගංගා නම් නදී සතක වැලි කැට ප්‍රමාණයට සම බුද්ධ ක්ෂේත්‍රයන් ට ඔබ්බේ නැගෙනහිරින්, මණි ධර නම් වූ බුද්ධක්ෂේත්‍රයක් ඇත්තේ ය. ස්වර ඝෝෂ රාජ භාග්‍යවතුන් වහන්සේ අසංඛ්‍ය සංඛ්‍යාත බෝසතුන් පිරිවරා සිටි එම බුද්ධක්ෂේත්‍රයේ කීර්තියට නමස්කාර වේවා!

නැගෙනහිරින්, ගංගා නම් ගංගා පහක වැලිකැට ප්‍රමාණයට සමාන බුද්ධක්ෂේත්‍රයන්ට ඔබ්බේ,
සුගන්ධ පූර්ණ නම් බුද්ධක්ෂේත්‍රයක් ඇත්තේ ය.
සුවර්ණභද්‍ර විමල භාග්‍යවතුන් වහන්සේ අසංඛ්‍ය ගණනක් බෝසතුන් පිරිවරා සිටි
එහි කීර්තියට නමස්කාර වේවා!

නැගෙනහිරින්, ගංගා නම් ගංගා සතක වැලිකැට ප්‍රමාණයට සමාන බුද්ධ ක්ෂේත්‍රවලින් එහා අශෝක මුක්ත නම් බුද්ධක්ෂේත්‍රයක් ඇත. අශෝකෝත්තම භාග්‍යවතුන් වහන්සේ අසංඛ්‍ය සංඛ්‍යාවක් බෝසතුන් පිරිවරා සිටින එහි කීර්තියට නමස්කාර වේවා!

නැගෙනහිර දිගින්, ගංගානම් ගංගා අටක වැලිකැට ප්‍රමාණයට සමාන බුද්ධ ක්ෂේත්‍රවලින් ඔබ්බේ ධර්ම ධවජ නම් වූ බුද්ධ ක්ෂේත්‍රයක් ඇත්තේ ය. ධර්මකීර්ති සාගර ඝෝෂ භාග්‍යවතුන් වහන්සේ අනන්ත බෝසතුන් සංඛ්‍යාවක් පිරිවරා සිටින එහි කීර්තියට නමස්කාර වේවා!

නැගෙනහිර දෙසින්, ගංගානම්  ගංගා නමයක වැලි කැට ප්‍රමාණය හා සමාන බුද්ධ ක්ෂේත්‍ර වලින් ඔබ්බේ, මාණික්‍ය සාගර නම් බුද්ධ ක්ෂේත්‍රයක් ඇත්තේ ය. වික්‍රීඩිතාභිඥ රාජ භාග්‍යවතුන් වහන්සේ අසංඛ්‍ය සංඛ්‍යාත බෝසතුන් පිරිවරා වැඩ සිටින, එහි කීර්තියට නමස්කාර වේවා!

නැගෙනහිරින්, ගංගා නම් ගංගා දසයක වැලි කැට ප්‍රමාණයට සමාන බුද්ධ ක්ෂේත්‍ර වලින් ඔබ්බේ, වෛඩූර්ය ප්‍රභ නම් බුද්ධ ක්ෂේත්‍රයක් ඇත්තේ ය. භෛෂජ්‍ය ගුරු භාග්‍යවතුන් වහන්සේ අසංඛ්‍ය සංඛ්‍යාවක් බෝසතුන් පිරිවරා වැඩ සිටින එහි කීර්තියට නමස්කාර වේවා!

කරුණාව හා වීර්යය හරහා පරම තත්ත්වයට ළඟා වූ බැවින්, ඔබ වහන්සේ මෙම පරිහානි යුගයේ දී මෙම සාහා (හෙවත් ඉවසිය නොහෙන මනුෂ්‍ය) ලෝකයේ කීර්තිය වෙති. අනෙක් ජිනවරයන්ට පාලනය කළ නොහැකි වූ එම මිනිස් ලොව පරමායුෂ වර්ෂ සියයක් හෝ ඊට අඩුවෙන් වන්නේ ය. ශාක්‍යයන්ගේ මුදුන් මිණ වූ පරම නියාමක ශාක්‍යමුනි බුදුන්වහන්සේට නමස්කාර වේවා!

දුකෙහි මූලාශ්‍රය වූ අන්ධකාර බීජ නසන්නා වූ ද, දුක් වේදනා මුලිනුපුටා දමන්නා වූද, ජින මාතා, ප්‍රඥාපාරමිතා ඇතුළු ත්‍රිවිධ යානයන්හි ශුද්ධ වූ ධර්මයට නමස්කාර වේවා!

ධර්ම කුමාර වූ ද, ඥාන භාණ්ඩාගාරය වූ ද, ඔබ වහන්සේ, වැරදි සිය ගණනකින් පීඩාවට පත් සාංසාරික ජීවීන් වූ අපට, මෙම ගම්භීර වූ ද විස්තෘත වූ ද ධර්ම මාර්ගය අනාවරණය කළාහු ය. මංජු ඝෝෂයන් වහන්සේට නමස්කාර වේවා!

කරුණාව හරහා උත්තම තත්ත්වයට ළඟා වෙමින්, අකල් මරණ වළක්වන්නා වූ, යහපත් පාලනයට දිරි ගන්වන්නා වූ , යනාදි වන්දනා ප්‍රාගුණ්‍යයන් ඉගැන්වීමේ බලය ලැබුවා වූ, ආර්ය ත්‍රාණමුක්තයන්ට නමස්කාර වේවා!

වෛශාලියෙහි දී සුගතයන් අටදෙනා වහන්සේ රැස් වූ විට, ඔබට ධර්මාරක්ෂක පදවිය භාර දෙනු ලැබී ය. සත්‍ය වචන සහිතව ඔබ එය භාරගත්තාහු ය. පිරිවර සහිත රහස්‍ය ස්වාමි වජ්‍රපානීන්ට නමස්කාර වේවා!

වෛශාලියේ දී, භෛෂජ්‍යගුරු යන නාමය ඇසීමෙන්ම ඔබ සත්‍යය දුටුවෙහිය; ඔබ මෙම සූත්‍රය ආරක්‍ෂා කිරීමට ශපථ කළාහු ය. යක්‍ෂයන් හත් ලක්‍ෂයක් පිරිවරා ගත්, යක් සෙනවියන් දොළොස් දෙනා හට නමස්කාර වේවා!
සසර සැරි සරණ අපි සියලු දෙනා, මෙම බුද්ධක්‍ෂේත්‍රයේ පරමාණු සංඛ්‍යාව තරම් ප්‍රමාණයක් ශරීර නිකුත් කරන්නෙමු. ඒවා සද්ගුණ ක්‍ෂේත්‍රයන් ලෙස අගය කරමින්, අපි නිරතුරුවම මෙම බුද්ධ ක්‍ෂේත්‍රය පුරා ගෞරවනීය ලෙස, මෙම බුද්ධක්‍ෂේත්‍රයේ වෙසෙන පූජ්‍ය උතුමන්ට නමස්කාර කරමු.

කයින්, වචනයෙන්, සිතින් බැතිමත්ව, ලොව දස දෙස පතළ, අතීත, වර්තමාන, අනාගත කාලත්‍රයේම පහළ වන්නා වූ මිනිසුන් අතර සිංහයන් වැනි වූ සියලු බුදුවරයන් වහන්සේලාට නමස්කාර කරමි.

එකී සියලුම ආර්යයන් වහන්සේලාට මම, පානීය ජලය, ආලේප, මල්, සුවඳ දුම්, පහන්, ආහාර, තාලවාද්‍යයන්, උඩුවියන් යනාදිය පුද කරමි. ඒ සියල්ලම සැබවින්ම පුද කෙරෙන සැබෑ ද්‍රව්‍යයන් ය. දස දිසාවන්හිම අයිතිකරුවකු නොමැතිව පවතින, දෙව් මිනිසුන්ගේ යහපත් ධනයද, සතුට ලබා ගැනීම සඳහා අවශ්‍ය වන සෑම උත්කෘෂ්ට ද්‍රව්‍යයක්ම ද පුද කරමි. යන්ත්‍ර මන්ත්‍ර බලයෙන් හා භක්තියෙන් ජනනය කරන ලද්දා වූ සමන්තභද්‍රයන්ගේ ශුභ ප්‍රාර්ථනා බලයෙන්, මුළු ආකාසයම පිරී යන පරිදි පූජා වලාවන් පුද කරමි.

අනාදිමත් කාලයක් තිස්සේ සසර සැරි සරද්දී අප විසින් සෘණාත්මක අකුශල ක්‍රියා බොහෝ ගණනක් සිදු කරන්නට ඇත. කොටින් කියතොත්, අප කර ඇත්තේ නොකළ යුතු දෑය. ඒ වැරදි කවරක් වුවත්, ඒ සියල්ලම මම පාපොච්චාරණය කරමි.

තුන් කල්හිම සියලු ආර්යයන් හා සාමාන්‍ය මිනිසුන් විසින් කරන ලද පින් හා කුශල මූලයන් ගැන මම සතුටුවෙමි.

අද්විතීය වූ ධර්ම චක්‍රය ප්‍රවර්තනය කරන ලෙස, මම සියලු ජිනවරයන් වහන්සේලා උනන්දු කරවමි.

නිවනට පිවිසීමට තීරණය කළ ලෝක ප්‍රදීප (උත්තම) යන් වහන්සේලාගෙන් මා ඉල්ලා සිටින්නේ, ලෝකයාගේ හිතසුව පිණිස බොහෝ කාලයක් රැඳී සිටින ලෙස ය.

මා කළ යම් වූ හෝ කුශලයක් වේ නම්, එය මා හට මෙන්ම අනෙක් අයටද අද්විතීය ධර්ම ප්‍රත්‍යක්‍ෂය ලබා ගැනීමට හේතු භූත වේවා!

''සත් බුදුන් වහන්සේලාගේ විශේෂ පූර්ව ප්‍රණිධාන ආයචනා පිළිබඳ විස්තෘත සූත්‍රයෙහි'' දක්වෙන පරිදි, පොදු වන්දනාව සඳහා නිර්මාණය කරන ලද මෙම මාළිගාමය මණ්ඩලය තුළ, අපි, තථාගත අරහත් සම්‍යක් සම්බුදුන්වහන්සේලා සත් නමටද, ශාක්‍ය මුනී බුදුන් වහන්සේටද, උන්වහන්සේලාගේ පිරිවරටත් සමග අරාධනා කොට, ඒ සියලු දෙනාගේම නාමයන් ඇසෙන්නට සලස්වා, වන්දනා නමස්කාර පවත්වා, උන්වහන්සේලාට ආයාචනා කළෙමු. ඒ සියලුදෙනා වහන්සේලා ඉදිරියේ අපි අපගේ වැරදි පාපොච්චාරණය කොට, ගුණවත්කම් පිළිබඳව සතුටු වී, ඉල්ලා සිටීම් ආදිය කෙළෙමු. එසේ කිරීමේ දී ලැබෙන යම් වූ කුසලයක් ඇත්නම් එහි බලයෙන්ද, තථාගතයන් වහන්සේලාගේ මහේශාක්‍ය භාවයේ හා ආශිර්වාදයේ බලයෙන්ද; ධර්ම ඉගැන්වීමේ හා සාංසාරික ජීවී සත්වයන්ගේ යහපත පතන ආර්ය ස්වාමීන් අනවරාග්‍ර සංසාරය පුරා කළ යම් වූ හෝ වැරදි දේ ඇත්නම් ඒ සියල්ලම ඉවත් වී පවිත්‍ර වී යාවා! ඒ අයගේ ශරීර රෝගවලින් තොර වේවා! ඒ අයද බොහෝ කාලයක් ජීවත් වෙත්වා! ඒ අයගේ රාජ්‍යය දැවැන්ත බවට පත් වී, පාලනය මෘදු හා ව්‍යාප්ත බවට පත්වේවා! අවසානයේ දී කුශල හා ප්‍රඥා සංචිතයන් සම්පූර්ණ කොට, ඔවුහු සනාතන කාය තත්ත්වයට. ධර්ම රාජ තත්ත්වයට භගවාන් බුද්ධ තත්ත්වයට පත් වෙත්වා! ඒ අයගේ රාජ්‍යයේ යටත් වැසියෝ සියලු දෙනාගේ බාහිර අභ්‍යන්තර හානි වැළකී යාවා; උත්කෘෂ්ට සතුටක් හා යහපතක් ළඟා වේවා! මුළු භූමිය හාත්පස සෑම තැනකම කිසිදු මිනිස් රෝගයක් හෝ තිරිසන් රෝගයක් හෝ කෘෂි ශාක රෝගයක්, සොරසතුරු බියක්, කිසිදු අශුභ දෙයක් නොපවතීවා! කලට වැසි ලැබෙමින් ගොවිතැන් ආදිය සරු වේවා! දේශයට උපරිම අන්දමේ සෞභාග්‍යය, සතුට හා යහපත සැලසේවා! සියලු ජීවී සත්වයන්ට සියලු සතුට අත්පත් වේවා! ඔවුන්ට එකී, භාග්‍යවතුන් වහන්සේලා මුණගැසී, උපදෙස් ලබා දෙයාකාර සංචිතයන් සම්පූර්ණ කොට බුදුවරුන් වීමට හැකි වේවා! විශේෂ වශයෙන්ම, අරිය ශ්‍රී සද්ධර්මය බොහෝ කලක් රැඳී පවතිමින් සෑම තැන පැතිරී යමින් මල්පල දරා වා!

## ඉවසා වදාරන ලෙස කෙරෙන ආයාචනය

පිරිවර සහිත භාග්‍යවත් අරහත් සම්‍යක් සම්බුදුන් සත්දෙනා වහන්සේලා හා පිරිවර සහිත ශාක්‍යමුනීන්ද්‍රයන් වහන්සේ ඇතුළු සභාවක් ඉදිරියේ අප ආයාචනා කළේ, අපට හා වෙනත් බොහෝ සාංසාරික ජීවීන්ට උදව් කරන ලෙස ය. මෙම නපුරු කාලයේ වෙසෙන අප ජීවීන්ගේ හැසිරීම ද දුර්වලය, ආකල්පද අපවිත්‍රය. නොසැලකිල්ල නිසා අපගේ කායික, වාචයික, මානසික ක්‍රියාකාරිත්වයන් මානසික පීඩාවන් සමඟ මිශ්‍ර වී පවතී. අපගේ පූජා භාණ්ඩ පවා දුප්පත් ය, දුර්වලය. අපි අපවිත්‍ර වූවෝ වෙමු. පූජාකර්මය සූත්‍රයේ දී ඇති ආකාරයටම ඉටු කිරීමට අපි අපොහොසත් වීමු. අප අතින් එවැනි හා වෙනත් වැරදි සිදු වී ඇත. ඒ සියල්ල, ඉවසා වදාරන ලෙස ආර්ය කාරුණිකයන් වහන්සේලාගෙන් අපේක්ෂා කරන බැවින්, අප දෙස කරුණා දැසින් බලන සේක් වා, ඉවසා වදාරන සේක් වා, අප තාවකාලිකව හෝ සදාකාලිකව හෝ කිලිටි නොවන පරිද්දෙන් අපට ආශිර්වාද කරන සේක් වා!

මෝඩකම නිසා මා විසින්

පූජා කර්මය සම්බන්ධව කළ නොහැකි වූ කොටසක් හෝ එහි දී නාස්ති වී ගිය කොටසක් ඇත්නම්, මා විසින් කරන ලද හෝ අනෙක් අයලවා කරවන ලද එබඳු කවර හෝ දෙයක් ඇත්නම්, ඊට සමාව භජනය කරන මෙන් ඉල්ලා සිටිමි.

මෙම නපුරු කාලයේ දී ජීවී සත්වයන් රැස් කොට ගෙන ඇත්තේ සුළු පිනක් පමණි;

ඒවා මෝහය හා මානසික පීඩාවන් සමග මිශ්‍ර වී ඇත. ඒවා කෑදරකම මගින් පාලනය වේ, අදක්ෂ ය;
මෙසේ, මගේ පූජාවද දුර්වලය, වැරදි ලෙස ඉදිරිපත් කරන ලද්දකි.
කාරුණික ආරක්ෂකයන් වහන්සේලාණෙනි !
එයට ද කමා කරන මෙන් අයදිමි.

නොසැලකිල්ල නිසා හෝ අපවිත්‍ර හැසිරීම නිසා, සූත්‍රයේ දක්වෙන නියම ආකාරයට ම එම පූජා කර්මය කිරීමට මට නොහැකි වූයේ නම්, නැතහොත් වැරදි ලෙස කළේ නම්, එයටද කමා කරන මෙන් අයදිමි.
පූජා කර්මයට යමක් එක් කොට හෝ ඉන් යමක් අඩු කොට, මා එහි යම් කොටසක් නාස්ති කර ඇත්නම්, යමක් මට අමතක වී ගොස් තිබුණේ නම්, ඒ සියල්ලට ද කමා කරන මෙන් ඉල්ලා සිටිමි.

**ඉන්පසු සභාව විසිර යන ලෙස ඉල්ලා සිටින්න**

ඔබ වහන්සේලා ජීවී සත්වයන්ගේ සියලු අරමුණු ඉටු කර සම්පූර්ණ කළාහු ය.
සුදුසු ප්‍රදානයන් ද කළාහු ය.
ඔබ වහන්සේලාගේ බුද්ධ ක්ෂේත්‍රවලට වැඩම කොට, අප කෙරේ කරුණා උපදවා,
අනාගතයේ දී ද අප වෙත වැඩමවනු මැනවි !

මහා කාරුණික ආරක්ෂකයාණන් වූ ඔබ වහන්සේ ලා,
අපගේ හා අනෙකුත් ජීවී සත්වයන්ගේ ඉලක්ක සියල්ල සම්පූර්ණ කළාහු ය.
කරුණාකර ඔබ වහන්සේලාගේ පිරිවර ද සහිතව තම තමන්ගේ භූමි වලට වඩිනු මැනවි !

## කැප කිරීම

වීර මංජුශ්‍රීයයන් විසින් හා සමන්තභද්‍රයන් විසින් දන සිටි පරිදි මා හැම විටම පුහුණු වන්නේ ඒ අය අනුව නිසා, මේ සියලු පින් මම කැප කර සිටිමි. තුන් කල්හිම සියලු ජිනවරයන් වර්ණනා කරන්නේ, හොඳම දෙය කැප කිරීමට ය කියාය.
මා මගේ සියලු කුශල මූලයන් කැප කරන්නේ යහපත් දෙය පුහුණුව සඳහා ය. එම සද්ගුණයේ බලයෙන් මම ඉක්මනින්ම වෛද්‍ය රාජ බවට පත් වෙම්වා !
එක් අයෙකුවත් අත් නොහැර, සියලු සාංසාරික ජීවී සත්වයන්
ඒ තත්ත්වයෙහි පිහිටුවීමට මට හැකි වේවා !
සියලු ජීවී සත්වයන්ගේ දුක සඳහා එකම ඔසුව වූ සියලු සතුටේ මූලාරම්භය වූ,
උපකාරය හා සේවාව සහිත ධර්ම ඉගැන්වීම, බොහෝ කාලයක් පවතීවා !
ජිනවරයන්ගේ හා ජින පුත්‍රයන්ගේ මහා ආශිර්වාදයෙන්,
රැවටිය නොහැකි පටිච්චසමුප්පාද සත්‍යයේ බලයෙන්,
මාගේ පවිත්‍ර ප්‍රාර්ථනාවේ බලයෙන්
මෙකී සියලු පැතුම්වල අරමුණු ඉටු වේවා !

## සුබාසිරි පැතුම

උන්වහන්සේලාගේ කරුණාවේ හිරු එළිය, මෙම පිරිහෙන යුගයේ සාංසාරික ජීවී සත්වයන්ට මහා කිරණක් වන්නේ ය.

සත් බුදුන් වහන්සේලා,

ආයාචනාවන් ඉගැන්වූවා හු ය, සියලු අරමුණු ඉටුකර ගත්තාහු ය.

සම්බුදුන් වහන්සේලාගේ සුබ සෙත, සියල්ලන් අතර බෙදී යාවා !

භෛෂජ්‍යගුරු සූත්‍රයේ පේළි 800 ක

පරම ඉගැන්වීම,

ගම්භීර හා ව්‍යාප්ත ඉගැන්වීමේ සාරයයි.

එය ඇසීමෙන් පවා කෙනෙකුට

පැවැත්මේ දුකෙන් නිදහස් විය හැක.

ශුද්ධ වූ ධර්මයේ ශුභ ඵල, සියලු දෙනාටම

වින්දනය කරන්නට ලැබේ වා !

දම් දෙසුම සඳහා ඇරයුම් කරන හා ධර්මය ආරක්ෂා කරන

සියලු බෝධි සත්වයෝ ද,

ශ්‍රාවකයෝ ද, ප්‍රදේශාරක්ෂකයෝ ද,

යක් සෙනෙවියෝ යනාදී හු ද,

ධර්මය පවත්වා ගෙන යන හා ආරක්ෂා කරන මෙහි රැස් වූ සංඝයා වහන්සේ ද නැමති ශුභ කාරණය, සියලු දෙනා වින්දනය කරත් වා !

අවශ්‍ය නම් මෙතැනට, සූත්‍රවලින් ගත් සුබාසිරි ගාථා ආදිය ද සජ්ඣායනය කොට

මල් කැබලි සැමතැන විසුරුවා හැරිය හැක.

## පරිවර්තකගේ පසු වදන

මෙතෙක් ඉදිරිපත් කරන ලද්දේ 1673 දී පස්වැනි දලයිලාමා වූ න්ගවං ලොසං ග්‍යාට්සෝ (1617-1682) තුමාගේ ලියවිල්ලක පරිවර්තනයකි. එය භෛෂජ්‍යගුරු බුදුන් ද, ශාක්‍යමුනීන්ද්‍රයන් ද, බෝසතුන් ද ආරක්‍ෂක දේවතාවන් ද ඇතුළත්ව සත් බුදුන් වහන්සේලා උදෙසා කරනු ලබන පූජා කර්මයකි.

මෙම 'චින්තා මාණික රත්නය' පස්වැනි දලයිලාමාවරයාගේ රචනයක් වුවද එහි ඇතුළත් කරුණු පදනම් වන්නේ 9 වැනි සියවසට සම්බන්ධ ටිබැට් හා ඉන්දියානු කෘතීන් ය. එහි සූත්‍ර පදනම වන්නේ භෛෂජ්‍යගුරු සූත්‍රයට සමීප සම්බන්ධයක් ඇති ''සප්තතථාගත - පූර්ව ප්‍රණිධාන - විශේෂ - විස්තර සූත්‍රය'' යි. මෙම පූජාවන් ටිබැටයට හඳුන්වා දෙන ලද්දේ 9 වැනි සියවසේ දෙවැනි භාගයේ දී ශාන්තරක්‍ෂිත හිමියන් විසිනි. උන්වහන්සේ සත් බුදුන් වහන්සේලා සඳහා එබඳු පූජා අත්පොත් කීපයක්ම රචනා කළහ. මේවායින් බොහොමයක් රචනා කරන ලද්දේ ත්‍රිසොං දෙත්සන් රජුගේ හිත සුව පිණිස ය. අද වන විට සත් බුදුන්වහන්සේලාට පූජා පැවැත්වීම බොහෝ දුරට පැතිර ගොස් ඇත.

මෙම කෘතියට 5 වැනි දලයිලාමාගේ පෙරවදනක් ද ඇතුළත් ය. මෙම කෘතිය නිෂ්පාදනය කිරීම සඳහා මුල් වූ කිහිප දෙනෙක්ම ඇත. මුලින්ම ඒ සම්බන්ධයෙන් මා හට කෘතිය සපයා දුන් මගේ කාරුණික ගුරු උතුමාණන් වූ ගරු තුබ්ටන් සොපා රිම්පොචේ තුමාණන් සිහිපත් කළ යුතුය. උන්වහන්සේගේ ඉවසන ගුණය මෙහි දී මට ද හොඳ පාඩමක් විය. ආචාර්ය ජීන් ස්මිත් ඊට සම්බන්ධ පොත් නාමාවලියක් සකස් කළ අතර, අචාර්ය ලෙනාඩ් ස්වෙලිං, භෛෂජ්‍යගුරු සූත්‍රය මට ලබා දීමෙන් උදව් කළේ ය. තවත් මෙම කාර්යයේ දී නා නා අයුරින් උදව් දුන් ආචාර්ය බර්ත් නිවුමන්, මෙරී කොලනි, ගසල්ටන් මින්ඩ්‍රොල්, පූජ්‍ය ගෙන්ගවං ඩ්‍රග්පා ආදීන් ද කෘතඥතාවෙන් මතක් කළ යුතු ය.

සප්ත තථාගත වන්දනාව යනු, අසනීප, දුගී බව, ආරාවුල් ආදී කරදර මගහරවා ගැනීමේ ක්‍රමයකි. අද ලොව විද්‍යාවෙන් කොපමණ දියුණු තත්ත්වයකට පැමිණියද, මිනිස් පැවැත්මේ මූලික යථාර්ථයන් වෙනස් වී නැති බව එම යථාර්ථයන්ට අප මුහුණ දිය යුතුය යන්න බුදුන්වහන්සේ අනුමත කිරීමෙන්ම පෙනේ. මෙම කෘතිය සියලු ජීවී සත්වයන්ගේ හිත සුව පිණිස උපකාරයක් වනු ඇතැයි යන්න මාගේ අහිංසක අපේක්‍ෂාවයි.

ජෝන් නිව්මන්
Deer Park Buddhist Center
Oregon, Wisconsin
25 May 2009

යදත්‍ර පුණ්‍යං තද්භවත් වාචාර්යෝපාධ්‍යායේ-
මාතා පිතෘ පූර්වංගමං කෘත්වා සර්ව සත්වානාං
අනුත්තර ඥානාවාප්තයේ/

මෙයින් මට යම් කිසි පිනක් අත් වේ නම්, එය මගේ මව්පියන් පෙරටු කොට ඇති මාගේ අචාර්ය උපාධ්‍යායයන්ගේ හා සියලු ජීවී සත්වයන්ගේ, අනුත්තර ඥාන සම්ප්‍රාප්තිය පිණිසම වේ වා !